SPMC

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

இலங்கை அரச மருந்தாக்கற் கூட்டுத்தாபனம்

STATE PHARMACEUTICALS MANUFACTURING CORPORATION OF SRI LANKA

2024

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2024
වාර්ෂික වාර්තාව

SPMC

SCAN HERE

හැඳින්වීම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC), ජපන් ජාත්‍යන්තර සංස්ථා ඒජන්සිය (JICA) හරහා ජපන් රජයෙන් ලැබුණු ප්‍රදාන ආධාරයක් වන අතර එය 1987 ජුනි මාසයේදී 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ සංස්ථාගත කරන ලද අතර ශ්‍රී ලංකාවේ මහජනතාවට දැරිය හැකි මිලකට ගුණාත්මක, ඵලදායී සහ ආරක්ෂිත ඖෂධ නිෂ්පාදනය කිරීමේ අධිටනින් ස්ථාපනය කරන ලදී.

ස්ථාපනය කරන ලද්දේ

1987

ධාරිතාව

මිලියන 3,172

පෙති හා කරල්

342

සේවකයින් ගණන

01

රජය සතු එකම ඖෂධ නිෂ්පාදනාගාරය

SPMC

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

පටුන

01 රා.ඖ.නි.සං පිහිටුවීම සහ මූලික අරමුණු

02 අපගේ දර්ශනය හා මෙහෙවර

03 අපගේ ගමන් මග

04 මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා

06 සභාපතිවරයාගේ සමාලෝචනය

10 සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවිඩය

11 අධ්‍යක්ෂවරු

22 ආයතනික ව්‍යුහය

පටුන

24 අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

26 විගණන කමිටු වාර්තාව

30 ආයතනික පාලන වාර්තාව

32 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

33 අවදානම් කළමනාකරණ වාර්තාව

35 තිරසාර සංවර්ධන ඉලක්ක

37 අපගේ නිපැයුම්

38 බද්ද ව්‍යාපාර නිපැයුම්

පටුන

42
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

43
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

44
ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

45
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

47
ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

61
ගිනුම් පිළිබඳ සටහන්

83
විගණකාධිපති වාර්තාව

95
විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

පටුන

112 අගය එකතු කළ ප්‍රකාශය

113 ප්‍රස්ථාරාත්මක සමාලෝචනය

114 පසුගිය වසර 10 ක වැදගත් මූල්‍ය විස්තර

115 ආයතනික තොරතුරු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පිහිටුවීම සහ මූලික අරමුණු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී පිහිටුවන ලදී.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2024 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමෙහි 37 වසරක් සම්පූර්ණ කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා නිෂ්පාදන මාලාව පෙති සහ කරල් නිෂ්පාදන 97 කින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙයින් නිෂ්පාදන 49 ක් ක්‍රියාකාරී ලෙසම සංයෝජනය කර ඇත. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදනයෙහි නියැලී සිටින එකම රාජ්‍ය සංස්ථාවයි.

ප්‍රධාන ක්‍රියාකාරීත්වයන්

1. තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවතඇසුරුම් කිරීම.
2. පාලිත සමාගම් නිර්මාණය කිරීම.
3. අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
4. ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
5. ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.
6. සංස්ථාව විසින්මහෝ බද්ධ ව්‍යාපාර මඟින් හො වෙනත් එවැනි ගිවිසුම් මඟින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

වෙළඳපලට මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) සහ එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) අභ්‍යන්තර පිරිවිතරයන්ට ද අනුකූල වේ.

වත්මන් යහපත් නිෂ්පාදන පිළිවෙත් (cGMP) නියමයන් සහ කාර්යය පටිපාටි ක්‍රියාවේ යොදවන ආකාරය පිළිබඳව අභ්‍යන්තර ගුණාත්මකතා විගණනය සහ කම්හල් පිරික්සුම හරහා නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

උසස් ගුණාත්මක ඖෂධ

ඔබ නිරෝගීව තබා ගැනීමට ප්‍රමුඛ ඖෂධ

දර්ශනය

ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ඖෂධ නිමැවුම් නිෂ්පාදනය හා අලෙවිකරණය කරන දකුණු ආසියාවේ ඇති ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල සඳහා වඩා ආරක්ෂිත, ප්‍රත්‍යක්ෂ හා පහසු මිලකට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඖෂධ නිෂ්පාදනය කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

අපගේ ගමන් මග

පසුගිය වසර 37 තුළ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විශිෂ්ටත්වය වෙනුවෙන් කැපවී කටයුතු කරමින් සන්ධිස්ථාන ගණනාවක් පසු කර ඇත.

1987
මිලියන 500ක නිමැවුම් ධාරිතාවකින් යුත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ආරම්භ කිරීම
මිලියන 8

1992
ආරම්භක නිමැවුම් ධාරිතාව ඉක්මවීම
මිලියන 600

2007
නව වැඩ මුර මාරුවක් හඳුන්වාදීම
මිලියන 1025

2009
නිමැවුමේ ප්‍රමාණය දෙගුණයකින් වැඩිවීම - මිලියන 1194

2013
නිමැවුමේ ප්‍රමාණය මිලියන 2000 ඉක්මවීම - මිලියන 2003

2020
ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර සහිතව නිමැවුම් ධාරිතාව වැඩිදියුණු කිරීම - මිලියන 3015

2021
විශේෂිත ලෙවොතිරොක්සින් පෙති නිපැයුම් කලාපය ආරම්භ කිරීම

2022
නව නිෂ්පාදන 09ක් වෙළඳපළ වෙත නිකුත් කිරීම

2023
පවත්නා පෙනිසිලින් කලාපය පුළුල් කිරීම

2024
ප්‍රමිති තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කරීම

මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා

	2024 රු	2023 රු
මෙහෙයුම් ප්‍රතිඵල		
ආදායම	28,202,081,820	29,331,718,691
දළ ලාභය	2,982,333,530	2,949,749,462
මෙහෙයුම් ලාභය	2,501,841,136	1,608,247,748
මූල්‍ය ආදායම	606,178,870	622,548,970
බදු පෙර ලාභය	3,083,004,066	2,173,308,106
බදු වියදම	926,973,991	654,752,799
වර්ෂය සඳහා ලාභය (බදු පෙර)	2,156,030,075	1,518,555,307
මුළු විස්තීරණ ආදායම්	2,140,700,000	1,532,049,139
මූල්‍ය තත්වය		
තොගය	4,112,406,987	3,911,381,606
බැංකු සහ අතැති මුදල	782,355	468,896,309
ජංගම වත්කම්	14,490,117,937	12,020,335,476
මුළු වත්කම්	18,872,311,823	16,517,179,747
ස්කන්ධය	13,293,131,956	11,478,973,962
ජංගම නොවන බැරකම්	349,040,919	374,934,338
ජංගම බැරකම්	5,230,138,948	4,663,271,446

ආදායම

28,202 මිලියන

ශුද්ධ ලාභය (බදු පෙර)

Rs.3,083 මිලියන

නිෂ්පාදන ඒකක

3,172 මිලියන

මූල්‍ය සහ මෙහෙයුම් සුවිශේෂතා











සභාපතිවරයාගේ සමාලෝචනය

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර

සභාපතිවරයාගේ සමාලෝචනය

2024 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ විගණනනිත මූල්‍ය ප්‍රකාශන, සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මවිසින් ඉදිරිපත් කරනු ලබනුයේ ඉමහත් සතුටිනි. මෙහෙයුම් විශිෂ්ටත්වය විෂයයෙහි අප තුළ නොසැලී පැවති කේන්ද්‍රීය යොමුව, අපගේ සෑම තීරණයක් සඳහාම නිසි මාර්ගෝපදේශයක් වූ අතර, එමගින්, උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුත්, දැරිය හැකි මිලක් මත ලබාගත හැකි ඖෂධ, විශ්වාසදායක සහ කාර්යක්ෂම ලෙස සැපයීම රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන බව මෙහිලා සඳහන් කල යුතුය.

නිෂ්පාදන කාර්ය සාධනය: විශ්වසනීයත්වය සහ ස්ථිර බව

2024 වසර තුළ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, නිෂ්පාදන වර්ග 49 ක් ඔස්සේ ඖෂධ මාත්‍රා ඒකක මිලියන 3,172.036 ක්, එනම්, බෙහෙත් පෙති මිලියන 2,680.25 ක් සහ බෙහෙත් කැප්සියුල මිලියන 491.79 ක් නිපදවී ය. වත්මන් යහපත් නිෂ්පාදන පුරුදු (CGMP) වලට දැඩි ලෙස අනුගත වීම මගින් හා නිෂ්පාදන සේවා මුර තුනක් හරහා වූ ප්‍රශස්ත කාල රාමු සැලසුම් කිරීම තුළින් දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා නියත නිෂ්පාදන ප්‍රවාහයක් අප විසින් පවත්වා ගනු ලැබුයෙමු. අඛණ්ඩ නිපැයුම් මාර්ග සමතුලන වැඩි දියුණු කිරීම් සහ නිවාරක නඩත්තු ක්‍රම මඟින් සැලසුම් නොකළ නිෂ්පාදන අඩාලවීම් අවම කෙරුනු අතර, එමගින්, විශ්වාසදායක සැපයුම්කරුවකු ලෙස පිළිගැනුනු අපගේ කීර්ති නාමය තව දුරටත් ශක්තිමත් විය.

ගුණාත්මක තත්වය සහ අනුකූලතාවය : ක්‍රියාවලි සියල්ල සවිමත් කිරීම

ගුණාත්මකභාවය අපගේ ක්‍රියාකාරකම්හි මූලස්ථම්භයයි. මෙම වසර තුළ අප විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සෝදිසි පරීක්ෂණ දෙකක් (පෙබරවාරි මස 8 සහ 29 යන දිනයන්හි දී) සහ බද්ධ ව්‍යාපාර විගණන පරීක්ෂණ හයක් සඳහා සත්කාරකත්වය සලසා දෙනු ලැබූ අතර, ඒ සියල්ලම විශේෂ නිරීක්ෂණ කිසිවකින් තොරව නිම විය. අපගේ තත්ත්ව කළමනාකරණ උපදේශකවරයා විසින් අධ්‍යාපන පුහුණු වැඩසටහන් 34 ක් පවත්වන ලද අතර, ඊට යහසාධන ලේඛනකරණ පරිච (Good Documentation Practices) සහ දත්ත අඛණ්ඩතාව පිළිබඳ විශේෂිත සැසිවාර 3 ක් ද ඇතුළත් විය.

අපගේ තත්ත්ව සහතිකායන දෙපාර්තමේන්තුව පුළුල් කිරීමට කටයුතු සිදු කරන අතරම, තත්ත්ව කළමනාකරණ පද්ධතියද ස්ථාපිත වෙමින් පවතී.

මෙම මූලාරම්භක පියවර මඟින් අභ්‍යන්තර ක්‍රියාවලි පිරික්සුම් පාලනය දැඩිව ශක්තිමත් කර, අපගමනය වීමේ අනුපාතය අඩු කර ඇති අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පනවනු ලැබ ඇති යහපත් නිෂ්පාදන පුරුදු (WHO-GMP), බ්‍රිතාන්‍ය ඖෂධ සංග්‍රහ ප්‍රමිතීන් (BP) සහ ඇමරිකා එක්සත් ජනපද ඖෂධ සංග්‍රහ ප්‍රමිතීන් (USP) යනාදී සම්මත ප්‍රමිතීන්ට පූර්ණ අනුකූලතාව සහතික කර ඇත.

වෙළඳපළ ප්‍රමුඛත්වය සහ මූල්‍ය කළමනාකාරිත්වය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙත රුපියල් බිලියන 26 ක සහ පෞද්ගලික අංශයේ බෙදාහරින්නන් වෙත රුපියල් බිලියන 2 ක වටිනාකමින් යුත් ඖෂධ සපයා දෙන ලද අතර, රාජ්‍ය අංශය තුළ දී 86% ක හා පුද්ගලික මට්ටමේ දී 14% ක ව්‍යාපාරික කොටසක් පවත්වා ගන්නට එමගින් ඊට හැකි විය. 2024 වසර සඳහා වූ සමස්ත ආදායම, රුපියල් බිලියන 28.20 ක් වූ ප්‍රමාණයක් කරා ළඟා විය. වෙළඳපළ තත්වයන්හි උච්චාවචන මධ්‍යයේ වුව ද, විනයක් සහිත වියදම් කළමනාකරණය සහ ඉලක්කගත නිෂ්පාදන සැලසුම්කරණය කරණකොට ගෙන මෙහෙයුම් ලාභ ආන්තික පවත්වා ගෙන යාමටත්, මහ භාණ්ඩාගාරයේ සහාය ලබා නොගෙන අපගේ කාර්ය මෙහෙවර ඉෂ්ට කිරීමටත් සංස්ථාවට හැකි විය.

අප සේවක ප්‍රජාව තුළ ආයෝජනය කිරීම : විශිෂ්ටත්වය උදෙසා වූ නිපුණතා

අපගේ කාර්ය සාධනය මෙහෙයවමින් ඉදිරියට රැගෙන යන්නේ, අපගේ මහඟු සේවක ප්‍රජාවේ බලයයි. 2024 වසර තුළ අප විසින් පුහුණු වැඩසටහන් අවස්ථා 61ක් පවත්වා ඇත. ඒ අතර, ISO 9001 ජාත්‍යන්තර සහතිකකරණයේ අභ්‍යන්තර විගණනය සහ HPLC/ UV ස්පෙක්ට්‍රොෆොටෝමෙට්‍රි පොදු විශ්ලේෂණමය අධෝ රක්ත රසායන ශිල්ප ක්‍රමය වැනි විෂය මාතෘකා පිළිබඳව බාහිර වැඩමුළු 27 ක් ද, තත්ව කළමනාකරණ පද්ධතිය මඟින් ප්‍රමුඛත්වය ලබා දුන් පුහුණු සැසිවාර 34 ක් ද ඇතුළත් විය. මේ හරහා සංස්ථාවේ සේවක සේවිකාවන් 120 කට වැඩි කාර්ය මණ්ඩලයකට ඉහළ කුසලතා ලබා ගැනීමට හැකියාව සැලසිණි.

එමෙන්ම, විශ්ව විද්‍යාල 15 කින් පැමිණි සීමාවාසික සහ පශ්චාත් උපාධි පර්යේෂකයන් සංස්ථාව මගින් සාදරයෙන් පිළිගනිමින්, නූතන ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රායෝගික අත්දැකීම් අත් විඳ ,දැක බලා ගැනීමට ඔවුනට ඉඩ ප්‍රස්ථාව සලසා දුන්නෙමු. මෙම ප්‍රයත්නයන් මඟින්, 87% ක මට්ටමේ සේවක රඳවා ගැනීමේ අනුපාතයක් සපුරාලීමටත්, අඛණ්ඩ ඉගෙනීමේ සංස්කෘතියක් ප්‍රබල ලෙස පවත්වා ගැනීමටත් අපට හැකි විය.

මූලෝපායික සබඳතා : සහයෝගිතාව තුළින් වර්ධනය වීම

අපගේ හැකියාවන් වර්ධනය කිරීමේ දී සහයෝගිතාවයන් දැවැන්ත බලවේගයක් වේ. සිම්ප්ලෙක්ස් ෆාමා ඉන්ඩියා (SIMPEX Pharma India) නමැති ඖෂධ සමාගම සමඟ ඇති කර ගත් අපගේ තාක්ෂණ හුවමාරු ගිවිසුම යටතට අනේකවිධ ස්ථානීය නැරඹුම් පරීක්ෂා ගමන් සහ ක්‍රියාකාරී ඖෂධ මිශ්‍රණද්‍රව්‍ය (API) සංශ්ලේෂණ ප්‍රොටොකෝල හවුලේ සංවර්ධනය කිරීම යන කර්තව්‍යයන් ඇතුලත් විය. හවුල් ව්‍යාපාර සෝදිසි පරීක්ෂා 6 ක් ක්‍රියාත්මක කරමින්, එකිනෙකා අතර බෙදා ගැනෙන අපගේ ගුණාත්මක තත්ත්ව අරමුණු තහවුරු කෙරුනු අතර, ගිවිසුම් මත පදනම් වූ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත අනාගත අවස්ථා සඳහා ද ඉඩ හසර විවර කර ගැනුණි. මෙවැනි සහයෝගිතාවයන් අපගේ ක්‍රියාවලියේ පරිණතභාවය වේගවත් කරන අතර, කලාපීය ඖෂධ ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ තත්ත්වය තව දුරටත් ප්‍රබල බවට පත් කෙරෙනු ඇත.

තිරසාරත්වය බද්ධ කිරීම : හරිත මෙහෙයුම්

මෙහෙයුම් විශිෂ්ටත්වය පාරිසරික භාරදූරත්වයේ වගකීම දක්වා ද විහිද යන අතර, ඒ සඳහා අපගේ කටයුතු යොමුවී ඇත. අවුරුදු 30 ක කාලයක් මුළුල්ලේ භාවිතා වූ පැරණි ශීතන යන්ත්‍රයක් (chiller) ඉවත් කර, ඒ වෙනුවට බලශක්තියෙන් වඩා කාර්යක්ෂම වූ පද්ධතියක් පිහිටුවීමට කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම, අපගේ විශ්ලේෂණ කණ්ඩායම් විසින් ඖෂධ සාම්පල් 5,547 ක් විශ්ලේෂණයට භාජනය කරනු ලද අතර, එමගින් නිමි නිෂ්පාදන, මූලික අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය හා ස්ථායීතා අධ්‍යයන සහ පරිසර අධීක්ෂණ යනාදිය ආවරණය විය. මෙම කාර්යයන් හරහා, දැඩි තත්ත්ව පාලන විධි, සම්පත් කාර්යක්ෂම භාවිතයන් සමඟ එකාවන් වූ ජීව ගුණයක් සහිතව පවත්නා බවට වග බලා ගැනේ.

අනාගත අවධානය : අති විශිෂ්ටත්වය සඳහා වූ මාර්ග සිතියම

2024 වසරෙහි තැනූ සවිමත් පදනම මත ගොඩනැගෙමින් පහත දැක්වෙන කාර්යයන් අප විසින් සැලසුම් කරන්නෙමු :

- සියලු නිශ්චයාත්මක උපකරණ සඳහා පුරෝකතනමය විෂ්ලේෂී ක්‍රම භාවිතය.
- දියුණු ශ්‍රේණිගත කිරීම් හා බ්ලොක්චේන් නියමු තාක්ෂණය භාවිතයෙන් සැපයුම් දාම අනුරේඛණය පුළුල් කිරීම;
- නිෂ්පාදන කාණ්ඩ මුදාහැරීමේ චක්‍ර තව දුරටත් කෙටි කිරීම සඳහා ක්‍රියාවලී විශ්ලේෂණ තාක්ෂණ ක්‍රමවේද ඒකාබද්ධ කිරීම;
- වැඩබිම් ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ISO 45001 සහතිකායනය ලබා ගැනීම;
- නාස්තිය පිටුදැකීමේ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම් මගින් නිපැයුම් චක්‍රය ආශ්‍රිත කාල වේලා විචලතාවය තුළ 10% ක අඩුවීමක් අත් කර ගැනීම.

දත්ත මත පදනම් වූ තීරණ ගැනීම් හරහා සන්නද්ධ වෙමින් හා විවිධ විෂය නිපුණතා කණ්ඩායම් ඒකරාශී වූ කාර්යකරණය ඔස්සේ සවිබල ගැන්වෙමින්, විශ්වාසදායකත්වය, ගුණාත්මක තත්ත්වය සහ පිරිවැය ඵලදායිතාවය පිළිබඳ නව මිණුම් සළකුණු ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ක්‍රියා කරනු ඇත.

තුති ප්‍රණාමය

ප්‍රථමයෙන්, ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ ප්‍රගතිය අරබයා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, ගරු අනුර කුමාර දිසානායක මහතා දැක්වූ අඛණ්ඩ කැපවීම උදෙසා වන මගේ ගෞරවාදර ස්තුතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම එතුමා වෙත පුද කර සිටින්නෙමි. එමෙන්ම, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතාට ද, විෂය භාර නියෝජ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය හංසක විජේමුනි මහතාට ද, ඔවුන්ගේ අගනා මාර්ගෝපදේශකත්වය සහ අනුබලය වෙනුවෙන් මම මගේ කෘතඥතාව පළ කරමි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ, වෛද්‍ය පී.ජී. මහීපාල යන මහත්වරුන් විසින් ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරී මහත්ම මහත්මීන් විසින් ද සලසා දෙනු ලැබූ මගපෙන්වීම් හා සහය ද අපි මෙහිලා බෙහෙවින් අගය කරමු. එලෙසින්ම, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, මහින්ද සිරිවර්ධන, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, පී.ජේ.එස්. අතුල කුමාර යන මහත්වරුන් සහ මහ භාණ්ඩාගාරයේ විවිධ මට්ටමේ නිලධාරී මහත්ම මහත්මීන් ලබා දුන් දායකත්වය වෙනුවෙන් ද අපි අපගේ හද පිරි තුති ප්‍රණාමය මෙහිලා පළ කර සිටින්නෙමු.

අප සංස්ථාවේ සාර්ථකත්වය කෙරෙහි දැවැන්ත ලෙස දායකත්වය දැක් වූ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වෛද්‍ය සැපයුම් අංශය, පෞද්ගලික ඖෂධ අලෙවි සැල් සහ වෛද්‍ය වෘත්තීයවේදීන් සමඟ අති විශිෂ්ට සබඳතා පවත්වා ගැනීමට අපට හැකිවීම සම්බන්ධයෙන් ඊට අදාළ සියලු පාර්ශව ස්තුතිපූර්වකව සිහිපත් කිරීමට ද මම මෙහි දී සතුටු වෙමි.

2024 වසර තුළ ඵලදායී ප්‍රතිඵල අත් කර ගැනීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සාමාන්‍යාධිකාරිතුමිය, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, කළමනාකරුවන්, විධායක නිලධාරි කාර්ය මණ්ඩලය සහ සංස්ථාවේ සියලුම තලවල සේවක සේවිකාවන් තුළ පැවති සේවා විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම, මෙහිලා අතිශයින් අගය කළ යුතු වන්නේ ය.

අවසන් වශයෙන්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ මෙහෙවර සාර්ථකත්වය කරා හසුරුවනු පිණිස මඟපෙන්වීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය සලසා දුන් මහඟු දායකත්වය සහ මඟපෙන්වීම වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය මෙයින් පළ කර සිටිමි.



මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර
සභාපති
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන මණ්ඩලය
2025 ජූලි මස 23 වන දින.

සාමාන්‍යාධිකාරීතුමියගේ පණිවිඩය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ලෝක සෞඛ්‍ය සංවිධානය නියම කර ඇති ඖෂධ නිෂ්පාදන ආශ්‍රිත යහ පැවතුම්වල ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් ඉතා උසස් තත්ත්වයේ ඖෂධ නිෂ්පාදනය කිරීමේ කර්තව්‍යය තුළ පුරා වසර 37 ක අඛණ්ඩ සේවා කාලයක් මහත් අභිමානයෙන් සමරයි. දශක ගණනාවක කාලයක් තුළ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ස්වකීය නිෂ්පාදන කාර්යය තුළ නිරන්තර වර්ධනයක් හා නවෝත්පාදන ක්‍රියාදාමයක් විදහා දක්වමින් ශ්‍රී ලාංකීය ඖෂධ නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රමුඛයා වශයෙන් එහි මුල් ස්ථානය ස්ථිර ලෙස තහවුරු කර ගෙන ඇත. ඖෂධ නිෂ්පාදන කර්තව්‍යයෙහි නිරත එකම රජය සතු ආයතනය වන රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, පහසු මිලට ජනතාවට ලබාගත හැකි ඉහළ ගුණාත්මක තත්වයේ ඖෂධ වර්ග ජාතික වශයෙන් සුලභ කිරීම සහතික කිරීමේ කාර්යයෙහිලා කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කර ඇත. මේ අවස්ථාව වන විට, ශ්‍රී ලාංකීය ජනතාවගේ විවිධාකාර සෞඛ්‍යාරක්ෂණ අවශ්‍යතා සපුරාලනු පිණිස විවිධ ඖෂධවේද කාණ්ඩ පරාසයක පැතිර යන පුළුල් ඖෂධ වර්ග මාලාවක් ඒවායේ ඖෂධීය නාමය යටතේ සංස්ථාව නිෂ්පාදනය කරයි.

2024 වසර තුළ, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ස්වකීය මූල්‍යමය හා මෙහෙයුම් සාර්ථකත්වයේ සංධිස්ථාන සාක්ෂාත් කර ගත්තේ ය. සංස්ථාව, සිය ශුද්ධ බදු පූර්ව ලාභය රු. මිලියන 3,083 ක් ලෙස වාර්තා කළ අතර, ඉන් තම සවිමත් මූල්‍ය කාර්ය සාධනය සහ කාර්යක්ෂම කළමනාකරණය පිළිබිඹු කර දැක්වී ය. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන නිමැවුම, බෙහෙත් පෙති හා බෙහෙත් කරල් ඒකක මිලියන 3,172 ක් වූ ප්‍රමාණයක් කරා ලඟා වූ අතර, බෙහෙත්වල ගුණාත්මක තත්ත්වය ආරක්ෂා කරන අතරම තම මෙහෙයුම් කටයුතු ඉහළ තලයකට ගෙන ඒමේ ස්වකීය හැකියාව ද, සංස්ථාව ඉන් නිරූපණය කර පෙන්වී ය. මීට අමතර වශයෙන්, සංස්ථාව, ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තයේ ප්‍රමුඛ නිෂ්පාදකයා ලෙස ස්වකීය ස්ථානය තව දුරටත් ස්ථාවර කර ගනිමින්, රු. මිලියන 28,202 ක වෙළෙඳ පිරිවැටුමක් අත්කර ගත්තේ ය.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සිය නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමේ සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘති කීපයක් හා සම්බන්ධ කටයුතුවල වැඩ අරඹා ඇත. මෙහිලා, එකී අතිශය වැදගත් ව්‍යාපෘතිවලින් එකක් වනුයේ, පෙනිසිලින් ඖෂධ ව්‍යාප්ති ව්‍යාපෘතිය පිළිබඳ මූලාරම්භයයි. අත්‍යවශ්‍ය ප්‍රතිජීවක ඖෂධ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම මෙහි අරමුණ වන්නේ ය. අනාගත ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කරමින්, තව දුරටත් සිය නිෂ්පාදන කාර්යයන් පුළුල් කර සංවර්ධනය කිරීම උදෙසා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් අභිලාෂමය සැලසුම් ගණනාවක් සකසනු ලැබ තිබේ. සංස්ථාවේ නිෂ්පාදන නිමැවුමෙහි තත්ව පාලනය හා පර්යේෂණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා නිර්මිත අති නවීන අංගෝපාංගවලින් සමන්විත නව විද්‍යාගාර පහසුකමක් ඉදිරි අනාගතයේ දී සංස්ථාව විසින් ස්ථාපනය කරනු ලැබීමට ද නියමිත ය.

මෙම නව විද්‍යාගාර පහසුකම මගින්, උසස් ගණයේ පරීක්ෂණ කටයුතු සිදු කිරීමටත්, ඖෂධ නිෂ්පාදනය ජාත්‍යන්තර තත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල වන බවට සහතික වීමටත්, නව ඖෂධ වට්ටෝරු සංවර්ධනය වේගවත් කිරීමටත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට හැකි වනු ඇත. එමෙන්ම, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, නිෂ්පාදන ක්‍රියාවලි විධිමත් කරනු පිණිසත්, නිෂ්පාදනයේ කාර්යක්ෂමතා මට්ටම වැඩි දියුණු කරනු පිණිසත්, ඖෂධ නිෂ්පාදනයේ උසස්තම ප්‍රමිතීන් රැකගනු පිණිසත් තත්ව කළමනාකරණ පද්ධතියක් උදෙසා වූ ආයෝජන කාර්යයෙහි නොකඩවා නියැලෙයි.

අසන්ති අතුරලිය
සාමාන්‍යාධිකාරී

නව අධ්‍යක්ෂ මණ්ඩලය

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතා
සභාපති

ආර්.ඒ. සුසන්ත කුමාර රණසිංහ මහතා
අධ්‍යක්ෂ

ඒ. මිල්ටන් අමරසිංහ මහතා
අධ්‍යක්ෂ

ආර්. එම්. උපුල් චන්ද්‍රනාත් මහතා
අධ්‍යක්ෂ

නව අධ්‍යක්ෂ මණ්ඩලය

ඩී. ඩී. වන්නිආරච්චි මහතා
අධ්‍යක්ෂ

වෛද්‍ය එන්. ආර්. කේ. විදානගේ මහතා
අධ්‍යක්ෂ

ජේ. ඩී. කේ. ජී. කොටුවෙගෙදර මහතා
අධ්‍යක්ෂ

පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

වෛද්‍ය පී.පී.ජී.පී.යු. ඉන්ද්‍රවංශ
සභාපති
2024 සැප්තැම්බර් දක්වා

වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

නව අධ්‍යක්ෂ මණ්ඩලය.

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතා
සභාපති

ශ්‍රී ලංකාවේ ඖෂධ නවෝත්පාදනයට සහ අධ්‍යාපනයට නායකත්වය දීම

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතා, ශ්‍රී ලංකාවේ ඖෂධ විද්‍යා ක්ෂේත්‍රයේ පෙර ගමන්කරුවකු ලෙස කටයුතු කරමින්, ස්වකීය පරිවර්තනීය කර්මාන්ත අත්දැකීම්, සම්මානනීය විද්වත් නායකත්වය සමඟ සුසංයෝජනය කරයි. ඒ මහතා, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා ලෙසත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඖෂධවේදය සහ ඖෂධ විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා ලෙසත් ඖෂධ විද්‍යා පර්යේෂණය හා අධ්‍යාපනය සහ සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැලසීම ඊට ප්‍රායෝගිකව යොදා ගැනීම අතර ඇති නිශ්චයාත්මක පරතරය එකිනෙකට සම්බන්ධ කරයි.

ශාස්ත්‍රීය විශිෂ්ටත්වය සහ ජාත්‍යන්තර පිළිගැනීම

මහාචාර්ය විජයබණ්ඩාර මහතාගේ අධ්‍යාපනික සුදුසුකම් තුළ ගැඹුරු තීව්‍රතාවක් සහ ජාත්‍යන්තර අවකාශයක් පිළිබිඹු කරයි. 1986 දී රසායන විද්‍යාව පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධිය ලබා ගත් ඒ මහතා, නෙදර්ලන්තයේ යූට්‍රෙක්ට් රාජ්‍ය විශ්ව විද්‍යාලයේ ඖෂධවේදී පීඨය සමඟ සිදු කළ විශිෂ්ට පර්යේෂණ සහයෝගිතා වැඩසටහනක් හරහා 1994 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඖෂධ රසායන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සම්පූර්ණ කළේ ය. ඔහු අත් කර ගත් මෙම මූලික ජාත්‍යන්තර දැනුම් සම්භාරය, ඖෂධවේදී අධ්‍යාපනය සහ පර්යේෂණය ආශ්‍රිත විශිෂ්ට ගෝලීය යහසාධන චර්යා හා භාවිතයන් විෂයයෙහි වූ ඔහුගේ ඇප කැපවීම සඳහා නිසි රුකුලක් සහ හැඩගැස්වීමක් ලබා දුන්නේ ය.

චීනයේ චීන වෛද්‍ය විද්‍යාව පිළිබඳ හුනාන් විශ්ව විද්‍යාලයේ ඖෂධවේද විද්‍යායතනයට ආරාධිත මහාචාර්යවරයෙකු ලෙස ලද ඔහුගේ පත්වීම තුළින් විද්‍යාමාන වනුයේ, ඔහුගේ මහඟු ශාස්ත්‍රීය ආභාසය ශ්‍රී ලංකාවේ සීමා මායිම් ඉක්මවා පුළුල්ව පැතිර ගිය බව ය. ඒ මහතා, එහිදී, ඖෂධවේදී අධ්‍යාපනය වැඩි දියුණු කිරීමටත්, අන්තර්ජාතික සහයෝගිතා ගොඩනැංවීමටත් ඉමහත් ලෙස දායක වූයේ ය.

ශ්‍රී ලංකාවේ ඖෂධ අධ්‍යාපනයට පුරෝගාමීත්වය ලබාදීම

මහාචාර්ය විජයබණ්ඩාර මහතා, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ ක්ෂේත්‍රය වෙත සැලසූ අතිශය වැදගත්ම දායකත්වය වූයේ, අධ්‍යාපනීය නවෝත්පාදකයෙකු වශයෙන් ඔහු උර දුන් කාර්යභාරයයි. වසර 2000 සිට 2011 දක්වා කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ඖෂධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස ඒ මහතා සේවය කළ ඔහුගේ ධූර කාලය තුළ, ඔහු ඖෂධ හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මුල්ම උපාධි වැඩසටහන, එනම්, ඖෂධවේද (විශේෂ) විද්‍යාවේදී උපාධිය අරඹා එය ස්ථාපිත කිරීමෙහිලා මූලික විය. මෙම මූලාරම්භක ව්‍යායාමය, ශ්‍රී ලංකාවේ ඖෂධවේද අධ්‍යාපනය තුළ පරිවර්තනීය වෙනසක් ඇති කළ අතර, නූතන ඖෂධවේද පරිච හා භාවිතයන් විෂයයෙහි මනා පදනමක් තහවුරු කර ස්ථාපනය කළේ ය.

ඒ මහතා, ස්වකීය සාර්ථකත්වය මත ගොඩනැගෙමින්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය තුළ සිය අධ්‍යාපනික නායකත්වය තවදුරටත් ඉදිරියට ගෙන ගියේ ය. එහිදී, ඔහු ඖෂධවේද හා ඖෂධ විද්‍යා අධ්‍යනාංශයේ ආරම්භක ප්‍රධානියා ලෙස කටයුතු කරමින් ඖෂධ විද්‍යා උපාධි පාඨමාලා වැඩසටහන ස්ථාපිත කිරීමෙහිලා වැදගත් පුරෝගාමී භූමිකාවක් ඉටු කළේ ය. මෙම මහඟු කාර්යඵලයන් ඔස්සේ, ශ්‍රී ලංකාව තුළ ඖෂධ විද්‍යා වෘත්තිකයන් පුහුණු කෙරෙන අකාරයෙහි මූලික වෙනසක් නියෝජනය වූ අතර, එමගින්, ජාත්‍යන්තර මිණුම් සළකුණු සපුරාලීම සඳහා වූ සම්මත ප්‍රමිතීන් ද ඉහළ තලයක් වෙත ඔසවා තබන ලදී.

නව අධ්‍යක්ෂ මණ්ඩලය.

ඖෂධ ක්ෂේත්‍රයේ නායකත්වය සහ තත්ව ආරක්ෂණ විශිෂ්ටත්වය

ඖෂධවල තත්ව පාලනය හා තත්ත්ව ආරක්ෂණය පිළිබඳව මහාචාර්ය විජයබණ්ඩාර මහතාගේ විශේෂඥතාවය ආරම්භ වූයේ, ඒ මහතා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඖෂධ තත්ව ආරක්ෂණය හා පර්යේෂණ රසායනාගාරයේ මුල් කළමනාකාරවරයා (1997–2000) ලෙස ඔහු විසින් ඉටු කරන ලද භූමිකාව සමඟ ය. ඖෂධවල තත්වය සහ ඖෂධ ආරක්ෂණ ප්‍රමිති සම්බන්ධයෙන් සහතික වීමෙහිලා වූ මෙම පදනම හා බැඳී ඒ මහතා සතු පළපුරුද්ද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා ලෙස ඔහුගේ නායකත්ව කාර්යභාරය නොකඩවා විදහා දැක්වීම සඳහා ඉඩ සලසයි.

පාරම්පරික වෛද්‍ය දැනුම රැක ගැනීම හා එය වැඩි වර්ධනය කිරීම උදෙසා ඒ මහතාගේ කැපවීම, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස ඔහු කළ අමිල සේවය ද, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ජාතික ව්‍යාපෘතිය (2017–2018) සඳහා ඔහු ලබා දුන් නායකත්වය ද තුළින් පැහැදිලි වේ. ඔහුගේ මෙම වැඩදායි භූමිකා මගින් ප්‍රදර්ශනය වනුයේ, ස්වකීය පාරම්පරික ඔසුවෙද ප්‍රඥාව හා නූතන ඖෂධ විද්‍යාව බද්ධ කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව ඔහු සතු මනා අවබෝධයයි.

පර්යේෂණවල බලපෑම සහ ජාත්‍යන්තර සහයෝගිතාව

මහාචාර්ය විජයබණ්ඩාර මහතාගේ වෛද්‍ය පර්යේෂණ කාර්යාවලිය, ඔහු විසින් ප්‍රසිද්ධියට පත් කළ 40 කට අධික පර්යේෂණ ලිපි හා ඔහු තම නමින් සන්තක කර ගත් පේටන්ට් බලපත්‍ර තුන මගින් නිරූපණය වේ. ඖෂධ සංවර්ධනයේ විවිධ පැතිකඩ විෂයයෙහි කෘතහස්ත සම්පත් දායකයෙකු බවට ඒ මහතාව ඔසවා තැබෙන ඔහු සතු විශේෂ ප්‍රාගුණ්‍යය; ඖෂධවේද අධ්‍යාපනය හා පාරම්පරික බෙහෙත් ඖෂධ මත පදනම් වූ නව බෙහෙත් වර්ග සොයාගැනීමේ පර්යේෂණ මෙන්ම ඖෂධීය තත්ත්ව පාලනය හා ගුණාත්මකත්ව සහතිකායනය ද යන පුළුල් පරාසයක් තුළ විහිද යයි.

ඖෂධ පර්යේෂණ ක්ෂේත්‍රයේ ගෝලීය සහයෝගිතාව කෙරෙහි ඔහුගේ දැඩි කැපවීම තව දුරටත් තීව්‍ර කරමින් පකිස්තානය සහ චීනය යන රටවල ඒ මහතා දැරූ ආරාධිත විද්‍යාඥ තනතුරු ද, මහාචාර්ය විජයබණ්ඩාර මහතා සතු ජාත්‍යන්තර පර්යේෂණ තලයේ පරිණත පළපුරුද්ද තුළ අන්තර්ගත වේ. මෙම අන්තර්ජාතික යථා දර්ශය, ඒ මහතා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය හා ඖෂධ කර්මාන්ත ක්ෂේත්‍රය යන දිශානතිද්වයම අරබයා සලසා දුන් ඔහුගේ දායකත්වය වඩාත් සුපෝෂණය කරයි.

වෘත්තියමය පිළිගැනීම සහ නායකත්වය

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතාගේ සේවා දායකත්ව සමුදාය පිළිගැනුමට ලක්වීම, ජාත්‍යන්තර ඖෂධ විද්‍යා ජන ප්‍රජාව පුරා ද පැතිර යන්නකි. ඔහුට පිරිනැමුනු ආසියාතික ඖෂධ ගුණාංග ගවේෂණ විද්‍යා සමාජයේ යාවජීව සාමාජිකත්වය සහ ජාත්‍යන්තර විද්‍යාත්මක සංගම් කීපයක ඔහුගේ සාමාජිකභාවය ඔහු ලද සම්මානනීයත්වය, ඒ මහතාට ඖෂධ ශාස්ත්‍ර විද්‍යාවන්හි හිමිව ඇති ගෞරවනීය අධිකාරිත්වය තව දුරටත් තහවුරු කරයි.

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතාගේ බහුවිධ පැතිකඩ සහිත වෘත්තීය ජීවිතය තුළින්, ඖෂධ විද්‍යාවේ හා සෞඛ්‍යාරක්ෂණ සේවා සැපයුමේ අර්ථාන්විත උන්නතියක් සාධනය කරන ඔහුගේ ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, කර්මාන්ත නායකත්වය සහ රාජ්‍ය සේවය තුළ ඔහුගේ කැපවීම පිළිබඳ අඛණ්ඩතාව නිදර්ශනාත්මකව පිළිබිඹු වේ. ඒ මහතාගේ කාර්ය මෙහෙවර, ගෝලීය ඖෂධවේද දැනුම හා එහි ප්‍රමිති උදෙසා දායකත්වය සලසා දෙන අතරම, ශ්‍රී ලංකාවේ ඖෂධ විද්‍යා අධ්‍යාපනය සහ එහි වෘත්තිය පරිචය හා බැඳී අනාගතය නිරන්තරව හැඩගස්වනු ඇත.

නව අධ්‍යක්ෂ මණ්ඩලය.

ආර්.ඒ. සුසන්ත කුමාර රණසිංහ මහතා
අධ්‍යක්ෂ

සුසන්ත කුමාර රණසිංහ මහතා, මුදල් අමාත්‍යාංශය යටතේ පවත්නා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටින අතර රාජ්‍ය බැංකු ඇතුළු රජය සතු ප්‍රධාන ව්‍යවසායික ආයතනවල ව්‍යාපාරික කාර්යයන්හි ආංශික අධීක්ෂණ කටයුතු විෂයයෙහි ක්‍රියාකාරී ලෙස නිරතවී ඇත. රාජ්‍ය අංශයේ අවුරුදු 23 කට අධික සේවා පළපුරුද්දක් ලබා සිටින ඒ මහතා, නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල, රථවාහන ධූම විමෝචන භාර අරමුදල, සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ඇල්කඩුව වතු වැවිලි සමාගම වැනි රජය සතු ව්‍යාපාරික ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද, වෙනත් බොහෝ කමිටුවල සාමාජිකයෙකු ලෙස ද සේවය කර ඇත. මේ වන විට, රණසිංහ මහතා, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ද, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

එතුමන් කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් ලබා ඇති අතර, ජපානයේ හිරෝෂිමා විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සහ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාපති උපාධිය ද, මිහින්තලේ රජරට විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධිය (MBA) ද ලබාගෙන ඇත. ඒ මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රය සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරයෙකු ද, ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය හා ගිණුම්කරණ ආයතනයේ සාමාජිකයෙකු (CPFA) ද වේ. මීට අමතරව, ඔහු කොළඹ පිහිටි මිලෝදා මූල්‍ය අධ්‍යයන විද්‍යායතනය මගින් පවත්වනු ලබන රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ගිවිසුම් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ද සම්පූර්ණ කර ඇත.

ගිණුම්කරණය, විගණනය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය හා අවදානම් කළමනාකරණය යන විෂයයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ආයතන හා විශ්ව විද්‍යාල වෙතින් විදේශ පුහුණුවීම් ලබා ඒවායේ අධ්‍යයන කාර්යයන්හි ද ඔහු නිරතව සිට තිබේ.

ඒ. මිල්ටන් අමරසිංහ මහතා
අධ්‍යක්ෂ

ඒ. මිල්ටන් අමරසිංහ මහතා, 1970 දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවෙකු ලෙස ද, 1978 සිට 1979 දක්වා ක්‍රම සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, 1979 සිට 1988 දක්වා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ රජයේ සහකාර දිසාපතිවරයෙකු ලෙස ද සේවය කර ඇත. ඒ මහතා, 1990 සිට 1995 දක්වා කාලය තුළ සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් සහ ලේකම් යන තනතුරු ද, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර ද හොබවා ඇත.

1995 දී මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, 1995 සිට 1999 දක්වා එහි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ද, 1999 සිට 2006 දක්වා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ද අමරසිංහ මහතා සේවය කර තිබේ.

මීට අමතරව, 2006 සිට 2009 දක්වා බී.පී.ඕ. සර්විසස් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයෙහි සාමාන්‍යාධිකාරීවරයා ලෙස ද, 2010 සිට 2015 දක්වා පාරිභෝගික කටයුතු අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස ද , 2015 දී ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපතිවරයා ලෙස සහ 2017 සිට 2018 දක්වා කාලය තුළ ක්‍රීඩා අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු ලෙස ද ඒ මහතා කටයුතු කර ඇත.

එතුමන්, ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් සහ තායිලන්තයේ බැංකොක් නුවර ආසියානු තාක්ෂණ විද්‍යා ආයතනයෙන් ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ලබා ඇත.

නව අධ්‍යක්ෂ මණ්ඩලය.

ආර්. එම්. උපුල්චන්ද්‍රනාත් මහතා
අධ්‍යක්ෂ

උපුල් චන්ද්‍රනාත් මහතා, මේ වන විට, 2015 ජූනි මස සිට ලුණුවිල පිහිටි පොල් පර්යේෂණ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරියෙකු ලෙස සේවය කරමින් සිටී. එතුමන් 2000 අගෝස්තු මස සිට 2002 ජනවාරි මස දක්වා දඹුල්ලේ පිහිටි මාස් ට්‍රොපිකල් ෆුඩ් ප්‍රොසෙසින් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයේ විධායක මූල්‍ය පාලක (සහකාර කණ්ඩායම් නායක) ලෙස ද, 2002 ජනවාරි මස සිට 2015 ජූනි මස දක්වා කාලය තුළ ලුණුවිල පොල් පර්යේෂණ මණ්ඩලයේ ගණකාධිකාරියෙකු ලෙස ද සේවය කර ඇත.

උපුල් චන්ද්‍රනාත් මහතා, 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ කාණ්ඩයට අයත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (APFA) වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA) සහතිකය සහ 2018 වසරේ දී, ලන්ඩනයේ වරලත් රාජ්‍ය මූල්‍ය හා ගිණුම්කරණ ආයතනයේ (CIPFA) සහතිකය ද ලබා සිටී.

මීට අමතරව, ඒ මහතා, වයඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණ උපාධිය (MBA) ලබා සිටින අතර, (2013/14) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය කළමනාකරණ විශේෂ ව්‍යාපාර විද්‍යා උපාධිය (B.Sc. Management Public Special Degree) (1994/97) ද ලබා තිබේ.

ඩී. ඩී. වන්නිආරච්චි මහතා
අධ්‍යක්ෂ

ඩී. ඩී. වන්නිආරච්චි මහතා, මේ වන විට ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස සේවය කරමින් සිටින සුදුසුකම් ලත් කෘතහස්ත නීති වෘත්තිකයෙකු වේ. නීති අධ්‍යාපනය සහ වෘත්තීය ආචාර ධර්මය පිළිබඳ ශක්තිමත් පදනමක් සහ රාජ්‍ය ආයතන පාලන කාර්යය විෂයයෙහි සුවිශාල අත්දැකීම් සහ නිතිමය දැනුම සම්භාරයක් ඒ මහතා සතු වේ.

2008 දී ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය (L.L.B.) ලබා ගත් වන්නිආරච්චි මහතා, නීති ක්ෂේත්‍රය තුළ කීර්තිමත් ලෙස සිය වෘත්තිමය ජීවිතය ගොඩනගා ගෙන ඇත. වන්නිආරච්චි මහතා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2025 ජනවාරි මාසයේ දී පත් කරනු ලැබී ය.

වෛද්‍ය එන්. ආර්. කේ. විදානගේ මහතා
අධ්‍යක්ෂ

මනෝ සුවතා ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සහිත, කීර්තිමත් වෛද්‍ය වෘත්තිකයෙකු වන වෛද්‍ය එන්. ආර්. කේ. විදානගේ මහතා, මුල්ලේරියාවේ පිහිටි, කොළඹ නැගෙනහිර මූලික රෝහලේ මනෝ වෛද්‍යවරයෙකු ලෙස දැනට සේවයෙහි නිරතව සිටී. ඒ මහතා, එම රෝහලෙහි විශේෂිත මනෝ වෛද්‍ය සේවා සැපයීමටත්, කලාපයේ මානසික සෞඛ්‍ය සේවා වර්ධනය කිරීමටත් මහඟු දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ වෛද්‍ය උපාධිය (MBBS) සහ ශල්‍ය වෛද්‍ය උපාධිය හිමි වෛද්‍ය විදානගේ මහතා, කොළඹ විශ්ව විද්‍යාලයෙන් මනෝ චිකිත්සාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ද ලබා ඇත. එමෙන්ම, ඔහුගේ පරිපූර්ණ මනෝ සුවතා පරිචය හා සම්බන්ධ කැපවීම තවදුරටත් වැඩි දියුණු කර ගනු පිණිස, සිහි කල්පනීය මනෝභාවය යන විෂය පිළිබඳ තායිලන්තයේ ජාතික ඩිප්ලෝමාව ද ඔහු හිමි කර ගෙන තිබේ.

වෛද්‍ය එන්. ආර්. කේ. විදානගේ මහතා, ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2025 ජනවාරි මාසයේ දී පත් කරනු ලැබී ය.

නව අධ්‍යක්ෂ මණ්ඩලය.

ජේ. ඩී. කේ. ජී. කොටුවෙගෙදර මහතා
අධ්‍යක්ෂ

ජේ. ඩී. කේ. ජී. කොටුවෙගෙදර මහතා, ඖෂධවේද පර්යේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදනය යන ක්ෂේත්‍රයන්හි අවුරුදු 25 කට අධික පළපුරුද්දක් ඇති නවෝත්පාදනීය ඖෂධවේදියෙකු වන අතර, විශේෂයෙන්ම, චර්ම රෝගවේදය විෂයයෙහි විශේෂඥතාව ලබාගෙන ඇත. වියළි චර්ම රෝග තත්ව සඳහා ප්‍රතිකාර කෙරෙන සුමුදුකාරක ඖෂධාලේපයක් නිපදවා, ඒ සඳහා ජාත්‍යන්තරව පිළිගැනෙන පේටන්ට් හිමිකම් බලපත්‍රයක් ද ඒ මහතා විසින් හිමි කර ගනු ලැබ තිබේ. ඔහු වෙත කැනඩාවේ අයිකැන් (ICAN) සහ ඉන්දුනීසියාවේ වර්ල්ඩ් ඉන්වෙන්ෂන් එක්ස්පෝ (World Invention Expo) යන නව නිපැයුම් උළෙලවල දී රිදී පදක්කම් ඇතුළු ජාත්‍යන්තර සම්මාන ප්‍රදානය කරනු ලැබ තිබේ.

දැනට එතුමන් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහලක් වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ වෛද්‍ය ආරක්ෂණ සම්බන්ධීකාරක ඖෂධවේදියෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම, සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය සහ ආරක්ෂාව පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන පුහුණුකරු ලෙස ද ඔහු කටයුතු කර ඇත.

ඒ මහතා, 2025 දී මැලේසියාවේ ඒෂියා ඊ යුනිවර්සිටි (Asia e University) ආයතනයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධිය (MBA) සහ 2023 දී, මැලේසියාවේ ලින්කන් විශ්ව විද්‍යාලයෙන් ඖෂධවේදී උපාධිය (B. Pharm) ලබාගෙන ඇත.

පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

වෛද්‍ය පී.පී.ජී.පී. ඉන්ද්‍රවංස
සභාපති
2024 දෙසැම්බර් දක්වා

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස මහතා රුසියාවේ ප්‍රමුඛපෙළේ වෛද්‍ය විද්‍යාලයක් වන සෙනෝව්-වන් වෛද්‍ය විද්‍යාලයෙහි (Medical Academy of Sechenov - one) අධ්‍යාපනය හදාරා ඇති අතර ඔහුගේ සීමාවසික පුහුණුව අවසන් කරන ලද්දේ පොළොන්නරුව මහ රෝහලේය.

පුලස්තිපුර ග්‍රාමීය රෝහලේ ආයතන භාර වෛද්‍ය නිලධාරී ලෙස කටයුතු කරමින් සිටින කාලයේදී 2007 වසරේ 5S ඵලදායීතා පළාත් සම්මානය ලබා ගැනීමට ඔහු පුරෝගාමී වී ඇත, එම කාලසීමාවේදීම වෛද්‍ය කාණ්ඩයෙන් සහ රෝහල් කාණ්ඩයෙන් විශිෂ්ඨ සෞඛ්‍ය සම්මානය ද ඔහු විසින් දිනාගෙන ඇත. එතුමන් 2009 වසරේ පටන් ජාතික රෝහලේ, විකලාංග ඒකකයේ හදිසි අනතුරු සේවා අංශයේ සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් 2019 වසරේ සිට 2024 සැප්තැම්බර් මාසය දක්වා සේවය කරන ලදී.

වෛද්‍ය බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

විශේෂඥ වෛද්‍ය බන්දුල විජේසිරිවර්ධන මහතා රාජ්‍ය සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ වසර 33කට වැඩි පළපුරුද්දක් සහිත අයෙක් වන අතර ඔහු වෛද්‍ය විද්‍යාව සඳහා ප්‍රධාන පරීක්ෂක, MCQ ප්‍රධාන සමූහයේ AAAED කමිටුවේ සාමාජික සහ 2005 වසරේදී ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාපති වශයෙන් කටයුතු කර ඇත.

ඔහු වර්තමානයේ පූර්ණකාලීනව පෞද්ගලික සෞඛ්‍යාරක්ෂණ ක්ෂේත්‍රයේ සේවය කරයි. මේ වන විට දිවයින පුරා භාවිතා වන සායනික පුහුණු මාර්ගෝපදේශ, ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය හරහා හඳුන්වාදීමට වෛද්‍ය විජේසිරිවර්ධන මහතා පුරෝගාමී වී ඇත.

ඔහුගේ නමට පළ වන ජාතික මෙන්ම ජාත්‍යන්තර පලකිරීම් ගණනාවක් අතරේ, 2000 වසරේදී ඔහුගේ සායනික පර්යේෂණය සඳහා ජනාධිපති සම්මානය වෛද්‍ය විජේසිරිවර්ධන මහතා විසින් දිනා ගන්නා ලදි. එමෙන්ම රෝයල් ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් ෆිසීෂියන්ස් (The Royal Australian College of Physicians) සහ දකුණු අප්‍රිකාවේ කොලේජස් ඔෆ් මෙඩිසින් (Colleges of Medicine in South Africa) මගින් ගෞරව සාමාජිකත්වය පිරිනමන ලදී. ඔහු MBBS (කොළඹ), MD (කොළඹ) සහ MRCP (UK) දරන අතර ඇමරිකානු වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි (American College of Physicians) සහ ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ විද්‍යාලයෙහි Ceylon College of Physicians) සාමාජිකයෙකි.

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය 2022 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක, අධ්‍යක්ෂවරියක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල වසර 18 කට වඩා වැඩි සේවා පළපුරුද්දක් ඇය සතුව ඇත.

ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය දැනට මුදල් අමාත්‍යාංශයීය භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරියක් සහ සහකාර අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරන අතර Colombo Lotus Tower (Pvt) Ltd හී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස ද කටයුතු කරන්නී ය. ඇය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, බී සී .සී (ලංකා) ලිමිටඩ් ,ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කර ඇත. ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියක ලෙසත්, ටයිම් ගාර්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයෙහි ගණකාධිකාරිවරිය ලෙසත් සේවය කර ඇත.

පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය දැනට ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) ලෙස සේවය කරයි.

එතුමිය කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) සහ ව්‍යාපෘති කළමණාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) ලබා ඇත.

දෙනාවත්ත මහත්මිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරියක් ලෙස (2000-2001) සහ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ (2001-2010) අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කර ඇත. 2010 වර්ෂයේදී ඇය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ජනදිරිය) ලෙස කටයුතු කළාය. එතුමිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ (2011-2017) සහ බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ (2017-2021) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක ලෙසද සේවය කර ඇත.

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා
අධ්‍යක්ෂ
2024 දෙසැම්බර් දක්වා

වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් 2020 ජනවාරි පටන් සේවය කරන අතර ඔහුට SMI ඉන්ජිනියරින් පුද්ගලික සමාගමේ නිර්මාතෘ වශයෙන් ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ විසි වසරකට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ජාතික තරුණ සේවා සභාවේ (2005-2008) මහජන කාර්ය සාධන මණ්ඩලයේ ජාතික චිත්‍රපට සංස්ථාවේ (2008-2010) සහ ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගමේ (2012-2015) අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කර ඇත. වර්තමානය වන විට ඔහු හරිත TV ජාල පුද්ගලික සමාගමේ Ariike පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ තනතුර දරයි. ඊට අමතරව ඔහු ජාතික දුම්රිය කෞතුකාගාර කමිටුවේ සාමාජිකයෙකි.

"තිරසාර සාර්ථකත්වයක් කරා දැක්ම, අඛණ්ඩතාව සහ සාමූහික ප්‍රඥාව සමඟින්
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මෙහෙයවන මාර්ගෝපදේශක මඬුල්ල"
අධ්‍යක්ෂ
මණ්ඩලය
SPMC

දිවංගත මහාචාර්ය සේනක බිබිලේ මහතා



ඔහු වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ රජය විසින් පාලනය කරනු ලබන ඖෂධ මිලදී ගැනීමේ සැලසුම් වෙනුවෙන් පෙනී සිටීමයි. එය බොහෝ විට හඳුන්වනු ලබන්නේ "තාර්කිකකරණය" සහ ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම යනුවෙනි. දුගී දුප්පත් ජනතාවට අඩු මිලට සාධාරණ ඖෂධ ලබා ගැනීම සහතික කිරීම අරමුණු කරගත් තාර්කික ඖෂධ ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ඔහු ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.

ආයතනික


සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ
සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- තත්ත්ව පාලන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- වට්ටෝරු පර්යේෂණ සහ සංවර්ධන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ඉංජිනේරු
කළමනාකාර- නිෂ්පාදන
කළමනාකාර- තත්ත්ව පාලන
කළමනාකාර- තත්ත්ව සහතිකකරණය
කළමනාකාර- වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන
කළමනාකාර- ඉංජිනේරු
කළමනාකාර- තොරතුරු තාක්ෂණ
කළමනාකාර- නිරාපද
ඖෂධ තාක්ෂණවේදී- නිෂ්පාදන
ඖෂධ තාක්ෂණවේදී- නිෂ්පාදන
ඖෂධ තාක්ෂණවේදී- නිෂ්පාදන
රසායනඥ
නියාමන කටයුතු නිලධාරි
ඉංජිනේරු සහකාර- විදුලි / යාන්ත්‍රික
ප්‍රවාහන නිලධාරි
ඉංජිනේරු සහකාර- පරිගණක ජාලාංග
පද්ධති විශ්ලේෂක

ව්‍යුහය


නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- සැලසුම් සහ ප්‍රසම්පාදන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- අලෙවි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මූල්‍ය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මානව සම්පත්
කළමනාකාරු- සැලසුම් සහ ප්‍රසම්පාදන
කළමනාකාරු- අලෙවි
කළමනාකාරු-මූල්‍ය
කළමනාකාරු- මානව සම්පත්
කළමනාකාරු- පුහුණු සහ සංවර්ධන
නීති නිළධාරි
අභ්‍යන්තර විගණක
ඖෂධ තාක්ෂණඥ- සැලසුම් සහ ප්‍රසම්පාදන
අලෙවි නිළධාරි
මූල්‍ය නිළධාරි
මානව සම්පත් / පරිපාලන නිළධාරි
පුහුණු සහ සංවර්ධන නිළධාරි
පුද්ගලික ලේකම්
අභ්‍යන්තර විගණන නිළධාරි

කළමනාකරණ

වමේ සිට, 2 වන පේළිය

ඒ.සී.පී. ආනන්දකුමාර
කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන)

එම්. විතුෂන් - කළමනාකාරිණී (තත්ත්ව පාලනය)

බී.වී.එච්.පී.එස්. කුමාර
කළමනාකරු (ඉංජිනේරු)

ඒ.ටී.එම්. ජයසේකර
කළමනාකරු (නිෂ්පාදන)

භාරත හෙන්නානායක
කළමනාකරු(වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන)

වී.ජේ. බණ්ඩාරවත්ත
අභ්‍යන්තර විගණක

ආර්.ඕ.එන්. දිසානායක
කළමනාකරු (ඉංජිනේරු)

වමේ සිට, 1 වන පේළිය

ඒ.එම්.ටී.පී. කුලසේකර
වැඩ බලනනියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (අලෙවි ප්‍රවර්ධන)

සි.ඩී. මගිනආරච්චි - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මානව සම්පත්)

ආර්.එම්.ආර්.එම්. රණසිංහ - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන)

ඒ.ජී.ඩී.එස්. අතුරලිය
සාමාන්‍යාධිකාරිණී

කමිටුව

වමේ සිට, 2 වන පේළිය

එම්. බෙනරගම
කළමනාකරු (ඉංජිනේරු)

එ.ස් චන්ද්‍රවිමල්
කළමනාකාරු (තත්ත්ව පාලනය)

වයි.එම්.පී. කුමාර
කළමනාකරු (සැලසුම් සහ ප්‍රසම්පාදන)

එම්.අර්.හෙට්ටිආරච්චි
කළමනාකරු (නිෂ්පාදන)

එස්. වික්‍රමසිංහ
කළමනාකරු (නිෂ්පාදන)

පී. දන්තනාරායන
කළමනාකාරිණී (නිෂ්පාදන)

වමේ සිට, 1 වන පේළිය

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර
සභාපති

එස්.පී. ජයවීර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන)

පී.ඩී. ජයසුන්දර
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

ජේ.එම්.එස්. ජයසුන්දර
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිය විගණිත ගිණුම් වාර්තා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ගිණුම් වාර්තා පිටු 42-82 දක්වා ඇත.

ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

- ස්වකීයව හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, හෝ නැවත ඇසුරුම් කිරීම.
- පාලිත සමාගම් නිර්මාණය කිරීම.
- අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
- ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම.
- සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මඟින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මඟින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

ව්‍යාපාර සමාලෝචනය

2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්යයන් හි තත්වය පිළිබඳ තොරතුරු අඩංගු ශේෂ පත්‍රය 43 පිටුවේ දක්වා ඇත. අදාල මූල්‍ය වර්ෂයේ සංස්ථාවේ තක්සේරුව පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු 06 සිට 09 දක්වා ඇත.

පිරිවැටුම සහ ප්‍රතිඵල

2024 වර්ෂයේ පිරිවැටුම සහ ප්‍රථිඵල ඇතුලත් ආදායම් ප්‍රකාශය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය පිළිවෙලින් 42 සහ 44 පිටු වල දක්වා ඇත.

අනාගත සංවර්ධන කාර්යයන්

ව්‍යාපාරයේ අනාගත සංවර්ධනය පිළිබඳව සභාපතිතුමාගේ සමාලෝචනය පිටු අංක 06 සිට 09 දක්වා ඇත.

පරිත්‍යාග

අදාල වර්ෂය තුල සංස්ථාව විසින් පරිත්‍යාග කිසිවක් ලබා දී නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

අදාල වර්ෂය තුළ ව්‍යාපාරයේ දේපළ , පිරියත සහ උපකරණ ඇතුලත් වාර්තා 71 පිටුවේ මූල්‍ය ප්‍රකාශයෙහි 10 වන සටහන මගින් දක්වා ඇත.

ලාභාංශ / දායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලාභාංශ ලෙස රු.300,000,000 ක දායකත්වයක් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

සංචිත

මුළු සංචිත ප්‍රමාණය හා ඒවායේ සංයෝජනය ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මගින් 44 පිටුවෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

නව අධ්‍යක්ෂ මණ්ඩලය

නව අධ්‍යක්ෂ මණ්ඩලය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. එක් අධ්‍යක්ෂවරයෙකු මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා ලෙස කටයුතු කරයි. නව සභාපතිවරයා 2024 සැප්තැම්බර් මාසයේදී පත් කරන ලද අතර, අනෙකුත් අධ්‍යක්ෂවරුන් 2025 ජනවාරි මාසයේ සිට පත් කරන ලදී.

මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර	සභාපති
ආර් ඒ එස් කේ රණසිංහ මහතා	අධ්‍යක්ෂ
ජේ ඩී කේ ජී කොටුවේගෙදර මහතා	අධ්‍යක්ෂ
ආචාර්ය එන් ආර් කේ විදානගේ මහතා	අධ්‍යක්ෂ
ඩී ඩී වන්නිආරච්චි මහතා	අධ්‍යක්ෂ
ඒ ඒ එම් අමරසිංහ මහතා	අධ්‍යක්ෂ
ආර් එම් යූ චන්ද්‍රනාත් මහතා	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

පෙර අධ්‍යක්ෂ මණ්ඩලය

පෙර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරන ලද්දේ 2020 ජනවාරි මාසයේ සිට ය. 2024 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් අටක් පවත්වා ඇත. අදාළ කාල සීමාව සඳහා සංස්ථාවේ කටයුතු සඳහා සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම භාර ගනී.

වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංස	සභාපති (2024 සැප්තැම්බර් දක්වා)
වෛද්‍ය එන්.එන්.ඒ.පී. බන්දුල චන්ද්‍රනාත් විජේසිරිවර්ධන	අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
ඒ.ආර්.වික්‍රමසිංහ	අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
වී.ජී. චමින්ද වික්‍රමරත්න	අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
යූ.එස්.කේ. දෙනාවත්ත	අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)

ගිණුම් ප්‍රතිපත්ති

සංස්ථාව උපයෝගී කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 47 සිට 60 දක්වා පිටුවල ඇත.

පරිසර සංරක්ෂණය

සිය ක්‍රියාකාරීත්වය තුළින් පරිසරයට අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහ ඉහළම ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදන අපගේ පාරිභෝගිකයන්ට සහ ප්‍රජාවට ලබා දීමෙන් ඔවුන්ට වාසිදායක ප්‍රතිඵලයක් ඇති කිරීම සංස්ථාවේ වගකීම වේ.

ව්‍යවස්ථානුකූල ගෙවීම්

ශේෂ පත්‍ර දිනට රජයට හා සේවකයන්ට අදාල සියලුම ව්‍යවස්ථානුකූල ගෙවීම් කර තිබේ.

ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන් හි සැකසීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයේ සිට සිදුවී නොමැත.

අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශයන් මූලිකවම පිළියෙල කරන ලද්දේ අඛණ්ඩ පැවැත්ම යන සංකල්පයට අනුකූලවය. සංස්ථාව සතුව ප්‍රමාණවත් සම්පත් පවත්නා බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි අනාගත මෙහෙයුම් පිළිබඳව සෑහීමකට පත් වේ.

විගණකවරුන් පත් කිරීම.

1971 මූල්‍ය පනතේ ප්‍රකාරව විගණකාධිපතිවරයා සංස්ථාවේ විගණක වන අතර, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් කරන ලදී.



මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
28.02.2025

විගණන කමිටු වාර්තාව - 2024

විගණන කමිටුවේ කාර්යභාරය

2021.11.17 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව 2022.12.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ විගණන කමිටු ප්‍රඥප්තිය (Audit Committee Charter) මඟින් විගණන කමිටුව මෙහෙයවන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම්, වල ප්‍රමාණාත්මක බව සඳහා වන සිය වගකීම ඉටු කිරීම මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, ආයතනයට අදාල අණ පනත්වල තොරතුරු අවශ්‍යතා, සමාගම් පනත සහ අනෙකුත් මූල්‍ය වාර්තාකරණයට අදාල රෙගුලාසි සහ අවශ්‍යතාවලට අනුකූල වීම, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවල අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි වල ප්‍රමාණාත්මක බව සහතික කිරීම, ආයතනයේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය සහතික කිරීම, අධීක්ෂණයල කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන කළමණාකාරිත්වය හා සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු වාර්තා කිරීම යන වගකීම් ඉටු කිරීමේදී විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දෙනු ලැබේ.

2024 වසර තුළ කමිටු සංයුතිය

වර්ෂය තුළදී සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වූ විගණන කමිටුවෙහි සභාපතිත්වය දරණු ලැබුවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරිය විසිනි.

ඒ ආර් වික්‍රමසිංහ - සභාපතිනි	අධ්‍යක්ෂ - රා ඖ නි ස අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (වැඩ බලන)
වී ජී සී වික්‍රමරත්න -සාමාජික	අධ්‍යක්ෂ - රා ඖ නි ස
යූ එස් කේ දෙනාවත්ත -සාමාජික	අධ්‍යක්ෂ - රා ඖ නි ස අතිරේක ලේකම් - (දේශීය වෛද්‍ය අංශය) සෞඛ්‍ය අමාත්‍යාංශය

2025 ජනවාරි මාසයේදී සිදුකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීමට අනුව, 2025 ජනවාරි 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි විගණන කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂ වරුන්ගෙන් සමන්විත විය.

ආර් ඒ එස් කේ රණසිංහ - සභාපති	අධ්‍යක්ෂ - රා ඖ නි ස / අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
ඒ ඒ එම් අමරසිංහ - සාමාජික	අධ්‍යක්ෂ - රා ඖ නි ස
ඩී ඩී වන්නිආරච්චි - සාමාජික	අධ්‍යක්ෂ - රා ඖ නි ස

නිති පතා සහභාගිවූවන්

නිරීක්ෂකයින් ලෙස සහභාගිවූවන්

කේ කේ එස් ජයකොඩි	සහකාර විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය
ආර් එම් එස් වසන්තා	ප්‍රධාන අභ්‍යන්තර විගණක - සෞඛ්‍ය අමාත්‍යාංශය (20.02.2024 දක්වා)
ඩී එන් ආර් එන් පේමතුංග	ප්‍රධාන අභ්‍යන්තර විගණක (වෛද්‍ය සැපයුම් අංශය) - සෞඛ්‍ය අමාත්‍යාංශය (21.05.2024 සිට)
ජී එල් එම් පී ද සිල්වා	විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය

කමිටුවේ ආරාධනය මත සහභාගිවූවන්

වෛද්‍ය උත්පල ඉන්ද්‍රවංස	සභාපතිනි
ඒ ජී ඩී එස් අතුරලිය	සාමාණ්‍යාධිකාරිණී - ර.ඖ.නී.ස

විගණන කමිටු වාර්තාව - 2024

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යන්තර විගණක රැස්වීම්වල කැඳවුම්කරු ලෙස කටයුතු කළේය.

අභ්‍යන්තර විගණක සහ අභ්‍යන්තර විගණන නිලධාරීහු විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වූහ.

අවධානය යොමු කළ ක්ෂේත්‍රයන් හා ක්‍රියාකාරකම්

අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

- අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය, අරමුණුගත භාවය, කාර්‍යසාධනය මෙන්ම දෙපාර්තමේන්තුවේ සම්පත්වල ප්‍රමාණවත්භාවය සාමාලෝචනය කර ඇත.

- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර වසර පුරා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය සමාලෝචනය කර ඇත.

- අභ්‍යන්තර පාලන අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.

- ගෙවීම්, මුදල් පාලනය, ප්‍රසම්පාදනය, අමු ද්‍රව්‍ය හා නිමි භාණ්ඩ තොග, සේවක වැටුප්, ගිණුම්කරණ ප්‍රමිත යෙදීම් සහ වෙළඳ ණයගැතියන් යන ක්ෂේත්‍රයන් ට අදාලව හඳුනාගන්නා ලද අඩුපාඩු හා විගණන නිර්දේශයන් ඇතුලත් අභ්‍යන්තර විගණන වාර්තා අටක් (08) පිළිබඳව සමාලෝචනය කර පෙන්වාදී ඇති අඩුපාඩු මග හරවා ගැනීමට කළමනාකාරීත්වය විසින් ගන්නා ලද පසු විපරම් ක්‍රියාමාර්ගයන් පිළිබඳව සලකා බලා ඇත.

- තොග, ගෙවීම්, මුදල් පාලනය, වෙළඳ ණයගැතියන්, ප්‍රසම්පාදනය හා සේවක වැටුප් යන ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන පද්ධති දාහතරක (14) ප්‍රමාණාත්මක බව සහ සඵලත්වය පිළිබඳව සලකා බලා සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

- තොග සහ වැටුප් හා වේතන සම්බන්ධයෙන් නිකුත් කර ඇති පසුගිය අභ්‍යන්තර විගණන වාර්තා වල ඇතුළත් ගැටළු දහයක් (10) පිළිබඳව සලකා බලා එම ගැටළු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් ගෙන ඇති පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර ඇත.

- අවශ්‍ය තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳව දෙපාර්තමේන්තු අතර අන්තර් සම්බන්ධතාවයේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

- අමු ද්‍රව්‍ය, නිමි භාණ්ඩ හා චෙක්පත් මගින් ගෙවීම් යන ක්ෂේත්‍රයන්ට අදාලව ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීමේ පද්ධතියෙන් (ERP) ලබා ගන්නා තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව අවධානය යොමුකර ඇත.

විගණන කමිටු වාර්තාව - 2024

බාහිර විගණන වාර්තා

රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව, සංස්ථාවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

- 2019 සහ 2020 වර්ෂ වලට අදාලව විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී ඇති නොවිසඳුණු ගැටළු දෙකක් (02) පිළිබඳව සලකා බලා, එහි ඇතුලත් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ භාවිතයට ගත නොහැකි ස්ථාවර වත්කම් අපහරණය සම්බන්ධ ගැටළු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් ගෙන ඇති පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර ඇත.

- 2022 වර්ෂයට අදාලව විගණකාධිපති වාර්තා කෙටුම්පත මගින් පෙන්වා දී ඇති නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම් පිළිබද ගැටළු දහයක් (10) සලකා බලා, සේවක බඳවා ගැනීම්, සේවක ණය හා විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම්, ඉතිරි නිවාඩු සඳහා ගෙවීම්, සේවක ප්‍රවාහනය, පැමිණීම හා සේවා වැඩ මුර සම්බන්ධ දීමනා ගෙවීම් යනාදී ගැටළු සම්බන්ධයෙන් ගෙන ඇති පසුවිපරම් ක්‍රියා මාර්ග පිළිබඳව අවධානය යොමු කර ඉතා ඉහළ විනිශ්චයක් ලබා දිය යුතු ක්ෂේත්‍රයන් පිළිබඳව සුදුසු නිර්දේශයන් ලබා දී ඇත.

- 2023 වර්ෂයට අදාලව විගණකාධිපති වාර්තාව සමාලෝචනය කර 2022 විගණකාධිපති වාර්තාව තුළ අන්තර්ගත නොවන ගැටළු දහසයක් 16 ක් පිළිබඳව අවධානය යොමු කර නීති රෙගුලාසි අවශ්‍යතා, අමු ද්‍රව්‍ය මිලදී ගැනීම්, ඖෂධ නිෂ්පාදනය හා සැපයීම, නව සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීම හා බද්ධ ව්‍යාපාර ගණුදෙනු සම්බන්ධ ගැටළු පිළිබඳව අවධානය යොමු කර සුදුසු නිර්දේශයන් ලබා දී ඇත.

මූල්‍ය වාර්තාකරණය

2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සමාලෝචනය කර පහත උපදෙස් ලබා දී ඇත.

1. ආදායම් බදු වට්නාකම 'අගය එකතු කිරීමේ ප්‍රකාශය' තුළ සඳහන් කිරීම.
2. සංස්ථාව විසින් සිදුකරන ලද ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පිළිබඳව සඳහන් කිරීම.
3. 2023 විගණන කමිටු වාර්තාවේ මුද්‍රණ දෝෂයන් නිවැරදි කිරීම.

- 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇත.

- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් (State Pharmaceuticals Corporation) අය වියයුතු කල් ගතවූ හිඟ ණයගැති ශේෂය පිළිබඳව අවධානය යොමු කර ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අඩමාණ ණය වෙන්කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- වෛද්‍ය සැපයුම් අංශයෙන් (Medical Supplies Division) සංස්ථාව වෙත අය විය යුතු හිඟ ණයගැති ශේෂය පිළිබඳව සලකා බලා කළමනාකාරීත්වය විසින් ගෙන ඇති පසුවිපරම් ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර ඇත.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම්

සෑම මාස තුනකට (03) වරක් අවම වශයෙන් එක් විගණන කමිටු රැස්වීමක් පැවැත්විය යුතුය.

වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් තුනක් (03) පමණක් පවත්වන ලදී. 2024 සැප්තැම්බර් මස ජනාධිපතිවරණයෙන් පසු නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබූ බැවින් ආදාල වර්ෂයේ අවසන් කාර්තුව තුළ විගණන කමිටු රැස්වීමක් පැවැත්වීමට නොහැකි විය.

විගණන කමිටු වාර්තාව - 2024

වර්ෂය තුල පැමිණීමේ විස්තරය

සාමාජිකයාගේ නම	20.02.2024	21.05.2024	04.09.2024	සහභාගී වූ රැස්වීම් ගණන
ඒ ආර් වික්‍රමසිංහ	X	X	X	3/3
වී ජී සී වික්‍රමරත්න	X	X	X	3/3
යූ එස් කේ දෙනාවත්ත	X	X	X	3/3

ඉදිරි පියවර

විගණන කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විගණන කමිටුව විසින් ධනාත්මක හා ඵලදායී අභ්‍යන්තර පාලන පරිසරයක් ගොඩනැගීමට 2024 වර්ෂය තුළදී මෙන්ම ඉන් ඉදිරියටත් කටයුතු කරනු ඇත.

විගණන කමිටුව වෙනුවෙන්



ආර් ඒ එස් කේ රණසිංහ
විගණන කමිටුවේ සභාපති
2025.06.17

ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මගින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්, රජය සහ ප්‍රජාව) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ, ඖෂධවේද, වෛද්‍ය විද්‍යාව, අලෙවිකරණය, මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරු හත් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයට සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂවරු හය දෙනෙකු ඇතුලත් වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටෙකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

සමාලෝචනයට ලක් වු කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්විම් අටක් පැවැත්වුණි.

කළමනාකරණ කමිටුව

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ නියෝජ්‍ය ප්‍රධානීන් ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මගින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

විගණන කමිටුව

"යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ" සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධක්ෂවරයා කමිටුවේ සභාපති වේ.

සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම් විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලැබේ. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන අතර එය විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ.

අදාල කාල පරිච්ඡේදය තුළදී විගණන කමිටු රැස්වීම් තුනක් පැවැත්වුණි. විගණන කමිටුවේ වාර්තාව පිටු අංක 26 හි දක්වා ඇත.

ආයතනික පාලන වාර්තාව

ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම

ජනතාව වෙනුවෙන් රජය විසින් පොදු ව්‍යාපාර පිහිටුවීම, අයිතිය පවත්වා ගෙන යාම සහ මෙහෙයවීම කරනු ලැබේ. එම නිසා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයටත් මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම අමාත්‍යාංශ වලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරී බලය ජනතා නියෝජිතයින් නියෝජනය කරන්නා වූ පාර්ලිමේන්තුව සතුව පවතින බව ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය විසින් පිළිගෙන ඇත.

ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොදු ව්‍යාපාරයක් ලෙස සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වගකියනු ලැබේ.

වේතන ප්‍රතිපත්තිය

සංස්ථාවේ වේතන ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත පිහිටුවා සකසා ඇත.

අධ්‍යක්ෂ වේතන සහ අනෙකුත් දීමනා මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන රාජ්‍ය සංස්ථා වලට අදාල වේතන හා දීමනා සඳහා වන චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

සේවක වේතන රාජ්‍ය පරිපාලන වැටුප් තලයන් පාදක කර ගනිමින් සංස්ථාව විසින් පිළියෙල කරන ලද වැටුප් තලයන් අනුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවේ අනුමැතිය ඇතිව ගෙවනු ලැබේ.

කාර්යසාධනය මත සෘජුවම අගය කිරීමක් ලෙස කාර්යසාධන දිරිදීමනාව හඳුනාගෙන ඇත.

අභ්‍යන්තර පාලනය

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම, වාර්තා කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම් කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ව පාලන, නඩත්තු, මූල්‍ය, සැලසුම්, වට්ටෝරු පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වේ. සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ නිලධාරී වන සාමාන්‍යාධිකාරී වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා සෘජුවම වාර්තා කරයි. සාමාන්‍යාධිකාරී, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

අභ්‍යන්තර විගණන කාර්යය මගින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මගින් අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු කෙරේ.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය තරගකාරී ටෙන්ඩර් පටිපාටිය මගින් සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය රැකීම තුලින් සැපයුම්කරුවන්ට මෙමගින් සමාන අවස්ථා ද ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සෞඛ්‍ය අමාත්‍යාංශයට හා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වාර්තාව

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, පිටු අංක 83-94 හි ඇතුලත් විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණකවරයාගේ වගකීම තුලින් වෙනස් වේ.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව රාජ්‍ය සංස්ථා විසින් ආදායම්, වියදම්, වත්කම්, වගකීම් සහ සංස්ථාවේ අනෙකුත් සියළුම ගනු දෙනු පිළිබඳ ගිණුම් වාර්තා සුදුසු පරිදි තබා ගත යුතුය. රාජ්‍ය සංස්ථා විසින් ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වූ සංඛ්‍යානමය කරුණු, එකී ස්වරූපයන් හා එකී කරුණු ඇතුලත්ව පිළියෙල කළ යුතුය.

රජය සහ ආයතනයට සම්බන්ධ පාර්ශවයන් නියෝජනය කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයට, ආයතනයේ භාරකාරීත්වය සම්බන්ධයෙන් ව්‍යවස්ථානුකූලව වගකීමක් හිමිව තිබෙන අතර සංස්ථාවේ මූල්‍ය තත්වය පිළිබඳ සාධාරණ නිවැරදිතාවයකින් යුක්තව හෙළිදරව් කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව තුළ තබා ගැනීමට ඔවුන් වගකීමෙන් බැඳේ. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කොට ඇති බවට සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව අවශ්‍ය තොරතුරු සපයා ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම සංකල්පය අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති බව සහතික කළ යුතුය.

සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවරයන් ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීමක් ඇති අතර, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනය, අභ්‍යන්තර සෝදිසි කිරීම්, මූල්‍යමය සමාලෝචනය , වංචා හා අක්‍රමිකතා අනාවරණය කර ගැනීම ඇතුළත් වූ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සඳහා සුදුසු සලකා බැලීම් කිරීමේ වගකීමද ඔවුන් සතුය.

1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව විගණකාධිපති, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කළ සියලුම මූල්‍ය වාර්තා හා සම්බන්ධිත දත්ත සමඟ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර ඇති අතර ප්‍රකාශිත මතය මෙම වාර්තාවේ පිටු අංක 83-94 හි සඳහන්ව ඇත.



මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

අවදානම් කළමනාකරණ වාර්තාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වන අප, අපගේ ආයතනයේ කෙටි කාලීන සහ දිගු කාලීන යන කාලද්වයේම තිරසාර භාවය සුරැකීම සඳහා අවදානම් කළමනාකරණය හා බැඳි වටිනාකම වටහාගෙන සිටින්නෙමු. අවදානම් කළමනාකරණය, අපගේ ආයතනික උපාය මාර්ගයේ සහ ව්‍යාපාර ආකෘතියේ අත්‍යාවශ්‍ය අංගයකි. ඒ මක්නිසාදයත්, කාලයත් සමග යම් අගයක් එකතු කිරීමට අපට ඇති හැකියාව කෙරෙහි එය, සෘජු බලපෑමක් ඇති කරන හෙයිනි.

අවදානම් කළමනාකරණයේ අරමුණු වන්නේ,

- සංස්ථාවේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- පාරිසරික සහ වෙළෙඳපළ තත්වයන්ගෙන් සංස්ථාව ආරක්ෂා කිරීම.
- සංස්ථාවේ සේවක සේවිකාවන්, සංස්ථාවේ වත්කම් සහ මහජනතාව ආරක්ෂා කිරීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා සහාය වීම.

ද්‍රවශීලතා අවදානම, ප්‍රසම්පාදන අවදානම, නිෂ්පාදන අවදානම, වෙළෙඳපළ අවදානම, විනිමය අනුපාත අවදානම, සමාජ ආර්ථික අවදානම හා මානව සම්පත් අවදානම ඇතුළු අවදානම් ගණනාවක් කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථා කළමනාකාරිත්වය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

ද්‍රවශීලතා අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රජයේ වෛද්‍ය සැපයුම් අංශයට 100% ණය කොන්දේසි මත ඖෂධ සපයයි.

වෛද්‍ය සැපයුම් අංශය විසින් දිගු කාලීනව පියවා නොමැති බිල්පත් මගින් ද්‍රවශීලතා අවදානමක් ඇති විය හැකි ය. එබැවින්, ද්‍රවශීලතා අවදානම මඟහරවා ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙතින්, මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීම ඇතිව, අදාළ මුදල් පියවා ගැනීමට සංස්ථා කළමනාකාරිත්වය විසින් පියවර ගනු ලැබ ඇත.

ප්‍රසම්පාදන අවදානම

නව අමු ද්‍රව්‍ය ප්‍රසම්පාදනය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ, රජයේ ටෙන්ඩර් පටිපාටියට අනුව වන අතර අමු ද්‍රව්‍යවලින් 80% කට වැඩි ප්‍රමාණයක් ආනයනය කෙරේ. එබැවින්, නිෂ්පාදන ක්‍රියාවලියට බලපෑ හැකි අමු ද්‍රව්‍ය අඛණ්ඩව සැපයීමේ අවදානමක් පවතී.

මෙම අවදානම මඟහරවා ගැනීම සඳහා, කළමනාකාරිත්වය විසින් අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව සමීපව නිරීක්ෂණයට හසු කරනු ලබන අතර, ලෝක ව්‍යාප්ත ටෙන්ඩර් පටිපාටිය හරහා සැපයුම්කරුවන් ප්‍රමාණය පුළුල් කිරීම සඳහා අවැසි පියවර ගනු ලැබ ඇත.

නිෂ්පාදන අවදානම

වෙළඳපළ වෙත නිකුත් කෙරෙන සියලුම නිෂ්පාදන, අපගේ අභ්‍යන්තර පිරිවිතරයන් මෙන්ම, බ්‍රිතාන්‍ය ඖෂධ පිරිවිතරවලට (BP) සහ එක්සත් ජනපද ඖෂධ පිරිවිතරවලට (USP) අදාළ අවශ්‍යතා සපුරාලයි.

යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) නිතිපතා අධීක්ෂණය කරනු ලබන අතර ඖෂධ නිෂ්පාදන, නියමිත ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා එකී නිෂ්පාදනවලට අදාළ අනෙකුත් පද්ධති සහ ක්‍රියා පටිපාටින් අඛණ්ඩව සමාලෝචනයට හසු කෙරේ.

වෙළඳපළ අවදානම

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා සම්බන්ධ වෙළඳපළ තරගකාරිත්වය වැඩි වීමේ අවදානමක් ඇත. අපගේ නිෂ්පාදන සඳහා ප්‍රධාන තරගකරුවන් ලෙස ඖෂධ ආනයනය කරන ඖෂධ සමාගම් හඳුනා ගත හැකි ය. අවදානම පිළිබඳව දැනුවත්ව සිටිමින්, සමස්ත පිරිවැය අඩු කිරීම සඳහා, ඵලදායිතාව ඉහළ නැංවීමට අපි අපගේ අවධානය අඛණ්ඩව යොමු කරන්නෙමු.

අවදානම් කළමනාකරණ වාර්තාව

විනිමය අනුපාත අවදානම

විනිමය අනුපාතවල උච්චාවචනය නිෂ්පාදනවල මිලකරණය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරයි. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි කළමනාකාරීත්වය, එහිලා ඇති වූ යම් දුර්වලතා මඟහරවා ගැනීම සඳහා මිලකරණ කමිටු රැස්වීමක් පැවැත්වී ය.

සමාජ ආර්ථික අවදානම

ජාතික සෞඛ්‍ය ආරක්ෂණ සේවා පද්ධතියට සහ සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිල ගනන් වලට එලදායී ඖෂධ ලබා දීම, රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ප්‍රමුඛ වගකීම වේ.

මානව සම්පත් අවදානම

ආයතනවල පුහුණු සේවකයින් විදේශවලට සංක්‍රමණය වීමේ අවදානමක් පවතින හෙයින් ඊට අදාළ වැටුප් රහිත නිවාඩු පටිපාටිය වෙනස් කිරීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස සංස්ථාවේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග තුළ තිරසාර සංවර්ධන ඉලක්ක අන්තර්ගත කිරීම මගින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට දායක වේ.

දරිද්‍රතාවය තුරන් කිරීම

සංස්ථාව විසින්, ස්වකීය සේවක සේවිකාවන් 342 දෙනෙකුගේ ජීවනෝපායික තත්වය ඉහළ නැංවීම පිණිස ඔවුන්ගේ සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 723 ක මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇත. තවද, එම සේවක සේවිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින්, ණය යෝජනා ක්‍රම හා වෛද්‍ය පහසුකම් යනාදී විවිධ සුබසාධන කටයුතු ඔවුන් වෙත සපයා දෙනු ලැබේ.

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රාජ්‍ය ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාවට ආර්ථික සහන සැලසීමේ අරමුණින් උසස් තත්ත්වයේ ඖෂධ වර්ග ඔවුනට දැරිය හැකි මිලකට සපයයි.

යහපත් සෞඛ්‍ය තත්වය සහ යහ පැවැත්ම

ඖෂධ නිෂ්පාදනය කරන එකම රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කරයි.

රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇති නොකර විවිධ ඖෂධ වර්ග (රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන මාලාව) අඛණ්ඩව රජයේ රෝහල් වෙත සපයනු ලබන අතර බෙදාහැරීමේ සේවා මාර්ග ඔස්සේ දැරිය හැකි මිලකට පුද්ගලික අංශයේ වෙළඳපළ වෙත ද එකී ඖෂධ වර්ග සම්පාදනය කරනු ලැබේ.

සෞඛ්‍ය සුවතාව සහ යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සංස්ථා සේවක සේවිකාවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය, පාරිතෝෂිත දීමනා ගෙවීම හා ප්‍රසූත නිවාඩු ලබා දීම යනාදී ක්‍රම මගින් සංස්ථාව, තම සේවක සේවිකාවන් වෙත වෛද්‍ය ප්‍රතිලාභ ඇතුළු ප්‍රතිලාභ සලසා දී ඇත.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සංස්ථාව, තම සියලුම සේවක සේවිකාවන්ට සමාන අවස්ථා ලබා දී ඇති අතර ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව කිසිදු වෙනස්කමක් නොදක්වයි. සියලුම සේවක සේවිකාවන් විෂයයෙහි කිසිදු වෙනස්කම් දැක්වීමක් නොකර ඔවුනට සමාන ප්‍රතිලාභ සලසා දීමේ ප්‍රතිපත්තියක් තුළ ඔවුනට සලකන අතර, සියලු ව්‍යවස්ථාපිත සහ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූලව, එකම රැකියා කාණ්ඩ වෙනුවෙන් සමාන ප්‍රතිලාභ පරිමාණයන් (1:1) සඳහා සුදුසුකම් ලබන අයුරින්, ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයම අතර අසමානතා කිසිවකට ඉඩකඩක් නොතබා කටයුතු කරයි.

තිරසාර සංවර්ධන ඉලක්ක

සෘජු කාර්ය නියුක්තිය සහ ආර්ථික වර්ධනය

සංස්ථාව විසින් රුපියල් මිලියන 1,257 ක මුදල් ප්‍රමාණයක්, රටේ ආර්ථික වර්ධනය උදෙසා විවිධ බදු, අය බදු සහ තීරුබදු ලෙස රජයට දායක කර දී ඇත. රජය සතු එකම රාජ්‍ය ඖෂධ නිෂ්පාදකයා ලෙස, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, රට තුළ ඖෂධ හිඟයක් ඇති නොවන පරිදි විවිධ ඖෂධ වර්ග වසර පුරා රජයේ රෝහල්වලට සහ පෞද්ගලික අංශය වෙත අඛණ්ඩව සැපයීමෙහි නියැලෙයි.

තවද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින්, 2024 වර්ෂයේ දී එහි මුළු පිරිවැටුමෙන් 35% කට වඩා වැඩි ප්‍රමාණයක ආර්ථික වටිනාකමක් සහ ඩොලර් ඉතිරියක් රටට එකතු කර දෙන ලදී.

කර්මාන්ත නවෝත්පාදනය සහ යටිතල පහසුකම්

මුඛ ඝන මාත්‍රා (OSD) පිළිකා ඖෂධ සහ විකලාංග උපකරණ නිෂ්පාදනය සඳහා නව කර්මාන්ත ශාලාවක් හොරණ - මිල්ලෑව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව විසින් සැලසුම් සකස් කරනු ලැබ ඇත.

අසමානතා පහත හෙළීම

පුහුණු කිරීම්, බඳවාගැනීම්, වැඩ පවරා දීම් සහ උසස්වීම් ලබා දීම් වැනි එදිනෙදා කටයුතුවල දී සැමට සාධාරණව සැලකීම පිණිස උපකාර කර ගැනීමට පැහැදිලි සමානාත්මතා ප්‍රතිපත්ති පවත්වා ගැනීම හරහා හැකියාව ලැබෙනු ඇත.

වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය

එකඟ වූ ජාත්‍යන්තර කාර්ය රාමුවලට අනුකූලව, අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වූ පරිසර හිතකාමී කළමනාකරණ පද්ධතියක් අප විසින් පවත්වා ගෙන යනු ලබන අතර ඉන් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදු වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඒවා වාතයට, ජලයට සහ පසට මුදා නොහැරීම අප විසින් සහතික කරනු ලබන්නෙමු. ඖෂධ නිෂ්පාදනවල අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ, ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් සහ ඊට අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව ය.

දේශගුණය විෂයයෙහි ක්‍රියාමාර්ග

දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ඊට අදාළව සිදු වන ස්වභාවික විපත් මගින් ඇති වන බලපෑම් අවම කිරීම සහ වළක්වා ගැනීම සඳහා වූ අභ්‍යන්තර ක්‍රියා පටිපාටි සහ පරිචයන් අප විසින් ගොඩනගා ගනු ලැබ ඇත. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයට අවැසි පුහුණු කිරීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් අප විසින් සලසා දෙනු ලබන්නෙමු.

අපගේ නිපැයුම් වර්ග - 2024

එක් එක් නිපැයුම් වර්ග අනුව නිෂ්පාදිත පෙති හා කරල් සංඛ්‍යාව			
නිපැයුම්	ප්‍රමාණය (මිලියන)	නිපැයුම්	ප්‍රමාණය (මිලියන)
ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 250	113.30	ගාබපෙන්ටින් කරල් USP මි.ග්‍රෑ 300	10.20
ඇමොක්සිසිලින් කරල් BP මි.ග්‍රෑ 500	39.22	ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 40	318.00
ඇමොක්සිසිලින් පෙති USP මි.ග්‍රෑ 125	5.25	ග්ලික්ලසයිඩ් පෙති BP මි.ග්‍රෑ 80	314.00
ඇස්කෝබික් අම්ලය පෙති BP මි.ග්‍රෑ 100	35.10	ඉන්ඩොමෙතසීන් කරල් මි.ග්‍රෑ 25	4.90
ඇටෝවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 10	343.52	ලෙවොතයිරොක්සීන් පෙති IP මි.ග්‍රෑ 50	75.74
බෙන්සෙක්සෝල් පෙති BP මි.ග්‍රෑ 2	58.00	ලොසාටන් පොටෑසියම් පෙති මි.ග්‍රෑ 50	291.20
බිසප්‍රොලෝල් පෙති BP මි.ග්‍රෑ 5	6.75	මෙබන්ඩසෝල් පෙති USP මි.ග්‍රෑ 100	14.00
කාබමෙසපීන් පෙති BP මි.ග්‍රෑ 200	49.00	මෙෆනමික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 500	1.35
සෙටිරිසින් පෙති BP මි.ග්‍රෑ 10	10.40	මෙට්ෆෝමින් පෙති BP මි.ග්‍රෑ 500	9.28
සිප්රොෆ්ලොක්සසින් පෙති USP මි.ග්‍රෑ 250	2.40	මෙට්‍රොනිඩසෝල් පෙති BP මි.ග්‍රෑ 200	18.90
ක්ලැරිත්රොමයිසීන් පෙති මි.ග්‍රෑ 250	13.30	ඔමෙප්‍රසෝල් කරල් IP මි.ග්‍රෑ 20	249.98
ක්ලැරිත්රොමයිසීන් පෙති මි.ග්‍රෑ 500	10.86	පැරසිටමෝල් පෙති BP මි.ග්‍රෑ 500	194.02
ක්ලොක්සසිලින් පෙති මි.ග්‍රෑ 250	10.20	ෆිනොක්සිමීතයිල් පෙනිසිලින් පෙති BP මි.ග්‍රෑ 250	16.73
ක්ලොක්සසිලින් පෙති මි.ග්‍රෑ 500	1.92	ප්‍රෙඩ්නිසෙලෝන් පෙති BP මි.ග්‍රෑ 5	196.00
කොට්‍රිමොක්ස්සෝල් පෙති BP (වැඩිහිටි)	5.25	ප්‍රොප්‍රනලෝල් පෙති BP මි.ග්‍රෑ 40	18.00
ඩයික්ලෝෆෙනැක් සෝඩියම් පෙති USP මි.ග්‍රෑ 50	23.40	රොසුවාස්ටටින් පෙති IP මි.ග්‍රෑ 10	3.20
ඩයිතයිල්කාබමසීන් පෙති BP මි.ග්‍රෑ 50	8.10	සැල්බියුටමෝල් පෙති BP මි.ග්‍රෑ 2	232.80
ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 30	64.50	ස්පයිරනොලැක්ටෝන් පෙති USP මි.ග්‍රෑ 25	36.90
ඩිල්ටියසෙම් HCL පෙති මි.ග්‍රෑ 60	54.25	තියෝෆිලීන් ER පෙති මි.ග්‍රෑ 125	4.20
ඩොම්පෙරිඩෝන් පෙති මි.ග්‍රෑ 10	58.80	ට්‍රැමඩෝල් කරල් IP මි.ග්‍රෑ 50	5.25
එනලප්‍රිල් මැලියේට් පෙති මි.ග්‍රෑ 5	33.60	ට්‍රයිප්ලුවොපෙරසීන් HCL පෙති BP මි.ග්‍රෑ 5	9.00
ෆැමොටිඩීන් පෙති USP මි.ග්‍රෑ 20	90.45	වෙරපමිල් පෙති BP මි.ග්‍රෑ 40	29.70
ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 250	17.10	විටමින් බී පෙති CHF	19.60
ෆ්ලුක්ලොක්සසිලින් කරල් BP මි.ග්‍රෑ 500	22.43		
ෆෝලික් ඇසිඩ් පෙති BP මි.ග්‍රෑ 1	10.00		
ෆෲසෙමයිඩ් පෙති BP මි.ග්‍රෑ 40	12.00		

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි බද්ධ ව්‍යාපාර

බද්ධ ව්‍යාපාර නිෂ්පාදන 2024

Acetaminophen Suppositories USP 125mg
Acetaminophen Suppositories USP 250mg
Acetaminophen Suppositories USP 500mg
Acetazolamide Tablets BP 250mg
Aciclovir Tablets BP 200mg
Aciclovir Tablets BP 800mg
Alfacalcidol Softgelatin Capsules 0.25mcg
Amantadine HCI Capsules USP 100mg
Amiodarone Tablets BP 100mg
Amisulpride Tablets BP 200mg
Amlodipine Besylate Tablets USP 2.5mg
Aripiprazol Tablets USP 10mg
Ascorbic Acid Tablets BP 100mg
Aspirin - Gastro Resistant Tablets USP 75mg
Atorvastatin Tab 10mg
Atorvastatin Tab 20mg
Atorvastatin Tablets 40mg
Atorvastatin Tablets IP 10mg
Atorvastatin Tablets IP 20mg
BaclofenTablets 5mg
Baclofen Tablets BP 10mg
Betamethasone Valerate Cream USP 0.1%
Betamethasone Valerate Oinment USP 0.1%
Bisacodyl Suppositories USP 10mg
Bisacodyl Tablets BP 10mg
Bisoprolol Fumarate Tablets USP 2.5mg
Bosentan Tablets 62.5mg
Bosentan Tablets 125mg
Cabergoline Tablets USP 0.5mg
Calciferol Tablets 10000 IU
Calcitriol Softgel Capsules 0.25mcg
Calcium Carbonate Tablet 1250mg
Calcium Carbornate - Chewable Tablets BP 500mg
Calcium Gluconate Injection USP 10% w/v, 10ml
Calcium Lactate Tablets BP 300mg
Captopril Tablets 12.5mg
Carvedilol Tablets USP 3.125mg
Carvedilol Tablets USP 6.25mg
Carvedilol Tablets USP 12.5mg
Cetirizine Hydrochloride BP 10mg
Cetirizine Oral Solution BP5mg/5ml
Chlorphenamine Injection BP 10mg/ml, 1ml Ampoule
Chlorpheniramine Oral Solution USP 2mg/5ml
Chlorpromazine Tablets BP 50mg
Ciprofloxacin Intravenous Infusion BP 0.2% w/v, 100ml
Clindamycin Capsules BP 150mg
Clindamycin Capsules BP 300mg
Clomipramine Tablets 50mg
Clopidogrel Tablets USP 75mg
Clotrimazole Cream BP 1%
Clozapine Tablets USP 100mg
Colecalciferol Tablets BP 400 IU
Colecalciferol Capsules 1000 IU
Compound Sodium Lactate Intravenous Infusion BP 500ml
Cotton Crape Bandage - 5cm - 3m Roll
Cotton Crape Bandage - 7.5cm - 4.5m Roll
Cotton Crape Bandage - 7.5cm -9m Roll
Cotton Crape Bandage - 10cm - 6m Roll
Dapsone Tablets BP 25mg
Dapsone Tablets BP 50mg

බද්ධ ව්‍යාපාර නිෂ්පාදන 2024

Deferasirox Tablets 100mg
Deferasirox Tablets 400mg
Dextran 40 Intravenous Infusion BP 10% w/v, 500ml
Diazepam 10mg/2ml Ampoule
Diclofenac Gastro Resistant Tablets BP 25mg
Diclofenac Sodium DR Tablets USP 50mg
Diclofenac Sodium Suppositories 100mg
Diclofenac Sodium Suppositories 12.5mg
Diclofenac Sodium Suppositories 25mg
Diltiazem - Prolonged Release Tablets BP 90mg
Domperidone Suppositories 10mg
Domperidone Suppositories 30mg
Domperidone Suppositories 60mg
Domperidone Tablets BP 10mg
Donepezil Hydrochloride Tablets USP 5mg
Doxepin Capsules BP 50mg
Enalapril Maleate Tablets USP 5mg
Ephedrine Injection BP 30mg/ml
Fentanyl Injection BP 100mcg/ 2 ml Ampoule
Ferrous Fumarate 91.2mg + Folic Acid Tablets 400mcg (Maternal and School Health)
Ferrous Fumarate 182.4mg + Folic Acid 400mcg Tablets
Ferrous Sulphate Tablets 200mg
Fluphenazine HCl USP 5mg
Frusemide Tablets BP 40mg
Gabapentin Capsules USP 300mg
Gliclazide Modified Release Tablets 30mg
Gliclazide Tab BP 40mg
Gliclazide Tab BP 80mg
GlucoseIntravenous Infusion BP 5% w/v, 500ml
Glucose Intravenous Infusion BP 10% w/v, 500ml
Glucose Intravenous Infusion BP 25% w/v, 25ml
Glucose Intravenous Infusion BP 50% w/v, 50ml
Haemodialysis Solution (Part A)
Haemodialysis Solution (Part B)
Hydralazine Tablets BP 50mg
Hydrocortisone Acetate Cream BP 1%
Hydrocortisone Ointment BP 1%
Hydroxychloroquine Sulfate Tablets USP 200mg
Isosorbide Mononitrate ER Tablets USP 30mg
Ketamine HCL Inj. 200mg/20ml Vial
Ketamine HCL Inj. 500mg/10ml Vial
Labetalol Tablets BP 100mg
Lamotragine Tablets USP 100mg
Lamotragine Tablets USP 25mg
Lamotragine Tablets USP 50mg
Levamisole Hydrochloride Tablets USP 40mg
Levetiracetam Tablets USP 250mg
Levetiracetam Tablets USP 500mg
Lidocaine 2% Injection BP 5ml Vial
Lidocaine Injection BP 2% w/v (Preservative free) 20ml vial
Lithium Carbonate Tablets BP 250 mg
Losartan Potassium Tablets BP 25mg
Losartan Potassium Tablets BP 50mg
Magnesium Sulfate Injection BP 50% w/v, 10ml
Mannitol Intravenous Infusion BP 20% w/v, 250ml
Mebendazole Tablets USP 100mg
Mebendazole Tablets USP 500mg (Chewable)
Mebendazole Tablets USP 500mg (Sachet)
Mesalazine Suppositories BP 500mg
Metaraminol Injection BP 10mg/ml, 1ml Ampoule

බද්ධ ව්‍යාපාර නිෂ්පාදන 2024

Metformin SR Tablets 500mg

Metformin Tablets BP 500mg

Methionine Tablets 500mg

Methyldopa Tablets BP 250mg

Metolazone Tablets USP 5mg

Metoprolol Tartrate Tablets USP 50mg

Metronidazole Intravenous Infusion BP 0.5% w/v, 100ml

Miconazole Nitrate Cream BP 2%

Midazolam Injection BP 5mg/ ml Ampoule

Mycophenolate Mofetil Tablets 250mg

Mycophenolate Mofetil Tab USP 500mg

Mycophenolate Mofetil Tablets USP 250mg

Nalidixic Acid Tablets 250mg

Nicorandil Tablets BP 10mg

Nimodipine Tablets BP 30mg

Ofloxacin Intravenous Infusion 0.2% w/v, 100ml

Omeprazole GR Capsules 20mg

Omeprazole Magnesium - Gastero Resistant Tablets 10mg

Oseltamivir Phosphate Capsules USP 30mg

Oseltamivir Phosphate Capsules USP 45mg

Oxcarbazepine Tablets USP 150mg

Oxcarbazepine Tablets USP 300mg

Paediatric Paracetamol Oral Solution BP 120mg/5ml

Pancreatin Capsules 150mg

Paracetamol Tablets BP 500mg

Penicillamine Capsules USP 250mg

Phenytoin Sodium Injection 250mg/5ml Ampoule

Phytomenadione Tablets BP 5mg

Pizotifen Tablets BP 0.5mg

Pottasium Chloride 15% Injection 10ml

Prazosin Tablets 1mg

Pregabalin Capsules IP 75mg

Primidone Tablets USP 250mg

Promethazine Injection BP 25mg/ml, 2ml Ampoule

Propranolol - Prolong Released Capsules BP 160mg

Pyridostigmine Tab BP 60mg (Blister)

Pyridoxine Tablets BP 10mg (Blister)

Pyrimethamine Tabs BP 25mg (Blister)

Quetiapine ER Tablets USP 200mg

Quetiapine Tablets USP 100mg

Risperidone Tablets USP 1mg

Risperidone Tablets USP 2mg

Salbutamol Oral Solution 2mg/5ml

Sertraline HCl Tablets USP 50mg

Sildenafil Tablets USP 50mg

Sitagliptin Tablets USP 50mg

Sitagliptin Tablets BP 100mg

Sodium Bicarbonate Tablets USP 600mg

Sodium Chloride Intravenous Infusion BP 0.9% w/v, 500ml

Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.45% & 5% w/v, 500ml

Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.45% & 10% w/v, 500ml

Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.9% & 5% w/v, 500ml

Sodium Chloride & Glucose Intravenous Infusion BP 0.9% & 10% w/v, 500ml

Sodium Chloride Injection BP 0.9% w/v, 5ml

Sodium Chloride Intravenous Infusion BP 3% w/v, 500ml

Sodium Fusidate Tablets 250mg

Sodium Valproate - Gastro Resistant Tablets BP 100mg

Sodium Valproate - Gastro Resistant Tablets BP 200mg

Solifenacin Succinate Tablets 5mg

බද්ධ ව්‍යාපාර නිෂ්පාදන 2024

Solifenacin Succinate Tablets 10mg

Sotalol Hydrochloride Tablets USP 80mg

Sterilised Water for Injections BP-10ml

Sulfadiazine Tablets USP 500mg

Sumatriptan Tablets BP 50mg

Tamsulosin Prolonged Release Capsules BP 0.2mg

Tamsulosin Prolonged Release Capsules BP 0.4mg

Theophyline Extended Release Tablets 125 mg

Thiamine Hydrochloride Tablets USP 10mg

Thiamine Hydrochloride Tablets USP 100mg

Thiamine Injection BP 100mg/2ml Ampoule

Tranexamic Acid Capsules 500mg

Tranexamic Acid Injection 500 mg/ml

Trientine Hydrochloride Capsules USP 300mg

Trifluoperazine Tablets BP 5mg

Ursodeoxycholic Acid Tablets BP 150mg

Valganciclovir Tablets USP 450mg

Venlafaxine Hydrocholoride ER Capsules USP 37.5mg

Venlafaxine Hydrocholoride ER Capsules USP 75mg

Verapamil HCL Injection 2.5 mg/2ml Ampoule

Verapamil PR Tablets BP 240mg

Vigabatrin Tablets BP 500mg

Vitamin A Capsules USP 100000 IU

Voriconazol Tablets 200mg

Wafarin Sodium Tablets USP 0.5mg

Wafarin Sodium Tablets USP 1mg

Wafarin Sodium Tablets USP 3mg

Zinc Sulfate Tablets USP 10mg (Dispersible)

Zinc Sulfate Tablets USP 20mg (Dispersible)

ACHIEVEMENTS

STATE PHARMACEUTICAL MANUFACTURING CORPORATION

WON

THE GOLD AWARD

FOR THE

BEST ANNUAL REPORTS AND ACCOUNTS OF PUBLIC SECTOR - 2023
CONDUCTED BY THE ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA.

විස්තීරණ ආදායම් ප්‍රකාශය

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	සටහන	2024	2023
ආදායම	1	28,202,081,820	29,331,718,691
විකුණුම් පිරිවැය	2	(25,219,748,290)	(26,381,969,229)
දළ ලාභය		**2,982,333,530**	**2,949,749,462**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	38,588,211	14,096,336
පරිපාලන වියදම්	4	(418,617,627)	(396,275,773)
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	5	(86,936,746)	(937,035,896)
අනිකුත් මෙහෙයුම් වියදම්	6	(13,526,232)	(22,286,381)
මෙහෙයුම් ලාභය		**2,501,841,136**	**1,608,247,748**
මූල්‍ය පිරිවැය	7	(25,015,940)	(57,488,612)
මූල්‍ය ආදායම	8	606,178,870	622,548,970
බදු පෙර ලාභය		**3,083,004,066**	**2,173,308,106**
බදු වියදම	9	(926,973,991)	(654,752,799)
වර්ෂය සඳහා ලාභය		**2,156,030,075**	**1,518,555,307**
විස්තීරණ ආදායම් ප්‍රකාශය			
වර්ෂය සඳහා ලාභය		**2,156,030,075**	**1,518,555,307**
(+/-) විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා මත ආයු ගණක ලාභය / (අලාභය)		(23,168,613)	12,513,552
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියා මත ආයු ගණක ලාභ / (අලාභ) ආදායම් බද්ද	9 (ආ) (i)	6,950,584	(3,754,066)
		(16,218,029)	**8,759,486**
(+) සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභය		1,268,505	6,763,352
සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභ ආදායම් බද්ද	9 (අ)	(380,552)	(2,029,006)
		887,954	**4,734,346**
වර්ෂය සඳහා බදු රහිත මුළු විස්තීර්ණ ආදායම		**2,140,700,000**	**1,532,049,139**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2024.12.31 දිනට (සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)	සටහන	31.12.2024	31.12.2023
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	10	3,899,215,130	4,002,112,062
අස්පෘශ්‍ය වත්කම්	11	4,496,126	5,488,440
වෙනත් ජංගම නොවන වත්කම්	14	6,365,333	6,818,836
පෙර ගෙවූ කල් බදු	13	315,772,340	319,077,961
නොනිමි වැඩ - ඉදිකිරීම්		156,344,956	163,346,971
ජංගම වත්කම්			
තොග	15	4,112,406,987	3,911,381,606
වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ	16	2,136,050,687	1,622,883,799
පූර්ව ගෙවීම්	17	47,406,275	42,619,403
වෙනත් මූල්‍ය වත්කම්	18	8,193,471,634	5,974,554,359
බැංකු සහ අතැති මුදල	19	782,355	468,896,309
		14,490,117,937	**12,020,335,476**
මුළු වත්කම්		**18,872,311,823**	**16,517,179,747**
කාරක ප්‍රාග්ධනය හා බැරකම්			
අනුදත් ප්‍රාග්ධනය		850,000,000	850,000,000
ප්‍රකාශිත ප්‍රාග්ධනය	20	3,106,173,044	3,106,173,044
රඳවා ගත් ඉපැයීම්		9,186,271,236	7,376,658,041
ප්‍රත්‍යාගණන සංචිතය		557,996,541	557,996,541
ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	21	412,818,155	438,146,336
- ආසියානු සංවර්ධන බැංකුව - බලශක්ති කාර්යක්ෂම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය	21	29,872,980	-
මුළු කාරක ප්‍රාග්ධනය		**13,293,131,956**	**11,478,973,962**
ජංගම නොවන බැරකම්			
ශුද්ධ සේවක ප්‍රතිලාභ බැරකම්	22	(6,329,471)	(14,557,672)
විලම්බිත බදු බැරකම්	23	355,370,390	389,492,010
		349,040,919	**374,934,338**
ජංගම බැරකම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ		4,689,869,254	4,052,364,854
ගෙවිය යුතු බදු	24	540,269,694	610,906,591
		5,230,138,948	**4,663,271,446**
මුළු කාරක ප්‍රාග්ධනය හා බැරකම්		**18,872,311,823**	**16,517,179,747**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 47 සිට 60 දක්වා ඇත. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යොමුකර ඇති සේම රජයේ විගණන දෙපාර්තමේන්තුවට ද ඉදිරිපත් කර ඇත.

සභාපති :.............................

අධ්‍යක්ෂ: ....

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මූල්‍ය) :.............................

දිනය : 15.05.2025

ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින්)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ලාභය / (අලාභය)	ප්‍රත්‍යාගණන සංචිතය	ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	ප්‍රදාන - බලශක්ති කාර්යක්ෂම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය	එකතුව
2024.01.01 දිනට ශේෂය	**3,106,173,044**	**7,376,658,041**	**557,996,541**	**438,146,336**	-	**11,478,973,962**
බලශක්ති කාර්යක්ෂමතා මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් සඳහා වන ව්‍යාපෘතිය	-	-	-	-	31,446,753	31,446,753
වර්ෂය සඳහා ක්ෂය කිරීම	-	-	-	(25,328,181)	(1,573,774)	(26,901,955)
වර්ෂය සඳහා ලාභය	-	2,156,030,075	-	-	-	2,156,030,075
වෙනත් විස්තීර්ණ ආදායම්	-	(15,330,076)	-	-	-	(15,330,076)
මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය	-	(300,000,000)	-	-	-	(300,000,000)
පෙර වර්ෂයේ ගැලපුම්	-	(31,086,805)	-	-	-	(31,086,805)
2024.12.31 දිනට ශේෂය	**3,106,173,044**	**9,186,271,236**	**557,996,541**	**412,818,155**	**29,872,980**	**13,293,131,956**
	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ලාභය / (අලාභය)	ප්‍රත්‍යාගණන සංචිතය	ප්‍රදානය - ලෝක බැංකු සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	ප්‍රදාන - බලශක්ති කාර්යක්ෂම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය	එකතුව
2023.01.01 දිනට ශේෂය	**690,079,000**	**6,145,370,588**	**557,996,541**	-		**7,393,446,129**
රජයේ ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස මාරු කිරීම	2,416,094,044	-	-	-		2,416,094,044
පෙනිසිලින් කලාප සංවර්ධන ව්‍යාපෘතිය (CERHSP)	-	-	-	438,146,336		438,146,336
වර්ෂය සඳහා ලාභය	-	1,518,555,307	-	-		1,518,555,307
වෙනත් විස්තීර්ණ ආදායම්	-	13,493,833	-	-		13,493,833
මහා භාණ්ඩාගාරය වෙත දායකත්වය	-	(300,000,000)	-	-		(300,000,000)
පෙර වර්ෂයේ ගැලපුම්	-	(761,686)	-	-		(761,686)
2023.12.31 දිනට ශේෂය	**3,106,173,044**	**7,376,658,041**	**557,996,541**	**438,146,336**		**11,478,973,962**

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	2024	2023
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
බදු සහ අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය / (අලාභය)	3,083,004,066	2,173,308,106
පෙර වර්ෂයේ ගැලපුම්	(31,052,305)	(761,686)
ගැලපුම් :-		
ස්ථාවර වත්කම් මත ක්ෂය	288,078,275	258,320,398
වර්තමාන පාරිතෝෂික පිරිවැය	13,411,030	9,944,092
සේවක පොළී පිරිවැය	23,072,704	29,768,523
සැලසුම් වත්කම් මත අපේක්ෂිත ලාභය	(24,965,201)	(28,262,541)
අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	-	800,926,792
ණයහිමියන්ගේ උපලබ්ධි නොවූ විනිමය ලාභය	332,038	1,182,184
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/අලාභ	429,134	167,416
ආදායම් - ප්‍රදාන	(26,901,955)	-
හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය	4,651,566	956,432
පොළී ආදායම	(587,396,153)	(611,027,968)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**2,742,663,199**	**2,634,521,748**
කාරක ප්‍රාග්ධන අයිතමයන්හි වෙනස් වීම්		
තොග අඩු /(වැඩි) වීම	(201,025,381)	(787,361,785)
ණයගැතියන්ගේ හා අයවිය යුතුදේහි අඩු / (වැඩි) වීම	(513,166,888)	(18,410,208)
තැන්පතු වල සහ පෙර ගෙවීම්වල අඩු / (වැඩි) වීම	(4,786,872)	25,746,916
බැරකම් වල (අඩු) /වැඩි වීම	637,172,362	182,571,573
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල	**2,660,856,421**	**2,037,068,244**
පාරිතෝෂික ගෙවීම්	(25,190,440)	(15,097,410)
ආදායම් බදු ගෙවීම්	(1,025,162,476)	(674,401,394)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල	**1,610,503,505**	**1,347,569,440**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
කෙටිකාලීන ආයෝජන (සටහන - අ)	(2,356,183,373)	(1,719,245,538)
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	(147,819,472)	(209,443,180)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම	269,632	172,003
ලැබුණු පොළිය	724,662,252	596,804,790
වෙනත් ජංගම නොවන වත්කම් ඉහළ නැංවීම	453,503	(5,456,960)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල	**(1,778,617,459)**	**(1,337,168,885)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්		
මහා භාණ්ඩාගාර දායකත්වය	(300,000,000)	(300,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල	**(300,000,000)**	**(300,000,000)**
මුදල් සහ ආසන්න මුදල්වල ශුද්ධ වැඩි/ (අඩු) වීම.	(468,113,954)	(289,599,445)
වර්ෂය ආරම්භක මුදල් සහ ආසන්න මුදල්	468,896,309	758,495,754
වර්ෂය අවසාන මුදල් හා ආසන්න මුදල් (සටහන ආ)	**782,355**	**468,896,309**

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

	2024	2023
සටහන (අ) - ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
වර්ෂය තුළ මුදල් ගලා ඒම්	(327,743,972,955)	(250,086,842,213)
වර්ෂය තුළ මුදල් ගලා යෑම්	330,100,156,329	251,806,087,751
ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,356,183,373**	**1,719,245,538**
සටහන (ආ) - මුදල් සහ ආසන්න මුදල්		
ලංකා බැංකුව - රත්මලාන ශාඛාව	149,855	18,550
ලංකා බැංකුව - ආයතනික ශාඛාව	288,586	2,173,504
මහජන බැංකුව - රත්මලාන ශාඛාව	136,565	136,565
මහජන බැංකුව - ආයතනික ශාඛාව	87,349	48,435
ඩොලර් ආන්තිකය - ලංකා බැංකුව, ආයතනික ශාඛාව	-	466,399,254
මුදල් ශේෂය	100,000	100,000
සුළු මුදල් ශේෂය	20,000	20,000
	782,355	**468,896,309**

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.ආයතනික තොරතුරු

පොදු තොරතුරු

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත කර ඇත. මෙය රත්මලාන ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවතේ අංක 11 දරණ ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය සංස්ථාවකි.

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ වලට 2025 පෙබරවාරි 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ,

(අ) ස්වකීයව හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුළත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම.
(ආ) පාලිත සමාගම් නිර්මාණය කිරීම.
(ඇ) අනාගත ආයෝජකයින් සමඟ ජාත්‍යන්තර ගිවිසුම්වලට එළඹීම.
(ඈ) ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
(ඉ) ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතකරණය කිරීම.
(ඊ) සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මගින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මගින් කරන ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය.

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ වල අගයන් ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන මත ඔවුන්ගේ වගකීම පිළිගෙන ඇත.

2.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල වී ඇත.

3. මූලික ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1 මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සටහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වීම් ඇත්නම් ඒවා ද අන්තර්ග්‍රහණය කොට ගණනය කළ ශුද්ධ පිරිවැය ලෙසය. එම පිරිවැයට දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණවලට අළුතින් කොටස් මාරු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ පිරිවැය නිර්ණායක වලට අනුකූල වන්නේ නම්, දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණයට ගැනීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් නියමිත කාලයකට වරක් දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල වැදගත් කොටස් වෙනුවට අලුත් ඒවා යෙදීම අවශ්‍ය වන්නේ නම්, එම ඉවත් කරනු ලබන කොටසට අදාළ පිරිවැය මුළු පිරිවැයෙන් ඉවත්කරන අතර නව කොටසෙහි පිරිවැය ඇතුළත් කරන අතර ක්ෂය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මත ගණනය කරනු ලබයි. එලෙසම, ප්‍රධාන පෙළේ පිරික්සීමක් සිදු කරනු ලබන අවස්ථාවේදී එහි පිරිවැය, පිරිවැය නිර්ණායක සපුරා ලන්නේ නම්, දේපළ හා පිරියතෙහි ලියාපදිංචි අගයට ඇතුළත් කරනු ලබයි. දේපළ හා පිරියතෙහි අනිකුත් අලුත්වැඩියා කිරීම් හා නඩත්තු වියදම්, ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1.2 ක්ෂය

ක්ෂය කිරීම් LKAS 16 මත පදනම්ව සිදු කරන අතර ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය කිරීම් එම වත්කම් භාවිතය ආරම්භ වූ දිනයේ සිට SLFRS 05 ට අනුව එම වත්කම විකිණීමට තීරණය කළ දිනය දක්වා සරල මාර්ග ක්‍රම පදනම අනුව, ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

බදු ඉඩම්	99 අවුරුදු බදු කාලය සඳහා
භූමි අලංකරණ වියදම්	99 අවුරුදු බදු කාලය සඳහා
ගොඩනැගිලි	අවුරුදු 40
වාහන නවත්වන ගොඩනැගිල්ල	අවුරුදු 12
පිරියත හා යන්ත්‍රෝපකරණ	අවුරුදු 1 සිට 20 දක්වා
මෝටර් වාහන	අවුරුදු 3 සිට 8 දක්වා
යතුරු පැදි	අවුරුදු 7
පා පැදි හා කරත්ත	අවුරුදු 7 සිට 20 දක්වා
උපකරණ	අවුරුදු 1 සිට 5 දක්වා
පරිගණක උපාංග	අවුරුදු 1 සිට 5 දක්වා
ලී බඩු හා සවිකිරීම්	අවුරුදු 3 සිට 20 දක්වා
මෙවලම්	අවුරුදු 1 සිට 15 දක්වා

3.1.3 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් වල මූලික පිරිවැය වන්නේ අත්පත් කරගැනීමේ පිරිවැයයි. මූලික පිරිවැය හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත අපචය අඩු කරමිනි. ප්‍රාග්ධනීකරණය කරන ලද සංවර්ධන පිරිවැය අගයන් හැර අභ්‍යන්තරිකව ජනනය කරන ලද අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කරනු නොලබන අතර වියදම ඇති වූ වර්ෂයේ ආදායම් ප්‍රකාශය තුළ අදාළ වියදම පිළිබිඹු කෙරේ.

3.1.4 දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල හානිකරණය

දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍ර වල ධාරණ වටිනාකමේ හානිකරණය සමාලෝචනය කරනු ලබන්නේ වාර්ෂිකව හෝ වෙනස්කම් සිදුවීම් මගින් හෝ දේපළ, පිරියත හා යන්ත්‍රසූත්‍රවල ධාරණ වටිනාකම අය කර ගත නොහැකි වීමට ඉඩ ඇති බව හඳුනා ගත් අවස්ථාවකදීය. එබඳු තත්ත්වයක් පවතින්නේ නම් සහ ධාරණ වටිනාකම ඇස්තමේන්තුගත අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන්නේ නම්, වත්කම් ඒවායේ අය කර ගත හැකි වටිනාකමට සටහන් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි ප්‍රත්‍යාගණන අතිරික්තයන් සටහන් කිරීමට ප්‍රතිවිරුද්ධ සටහනක් ලෙස වත්කම් හානිකරණ අලාභ සටහන් කරනු ලැබේ.

3.1.5 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

වත්කමක් හානි විය හැකි බව දක්වන සංඥාවක් ඇතිදැයි සංස්ථාව එක් එක් වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. කවර හෝ සංඥාවක් පවතී නම්, එසේත් නැති නම් වත්කමක් සඳහා වාර්ෂික හානි පිරික්සුමක් අවශ්‍ය වූ විට, සංස්ථාව අදාළ වත්කමේ අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරයි. වත්කමක අය කර ගත හැකි ප්‍රමාණය වනාහි වත්කමේ හෝ මුදල්-උත්පාදන ඒකකයේ CGU සාධාරණ වටිනාකමෙන්, විකිණීමේ වියදම් අඩු කිරීමෙන් ලැබෙන අගය හා භාවිතයේදී එහි වටිනාකම අඩු කළ විට ලැබෙන අගය යන අගයන් දෙකෙන් වඩා විශාල අගයයි. එය තනි වත්කම් සඳහා නිර්ණය කරනු ලබන්නේ වෙනත් වත්කම් වලින් හෝ වත්කම් සමූහ වලින් ආයතනය තුලට එන මුදල් ප්‍රවාහ වලින් ස්වායත්තව අදාළ තනි වත්කම ආයතනය තුලට මුදල් උත්පාදනය කරන්නේ නම් පමණි. වත්කමක හෝ මුදල්-උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අය කර ගත හැකි ප්‍රමාණය ඉක්මවා යන විට, වත්කම හානිකරණය වී ඇතැයි සැලකෙන අතර, එය එහි අය කර ගත හැකි ප්‍රමාණය ලෙස සටහන් කරනු ලැබේ. භාවිතයේදී වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ වර්තමාන අගය සහ වත්කමට ආවේණික අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු අගයන් පිළිබිඹු කරන බදු-පූර්ව වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් විකිණීමේ පිරිවැය අඩු කොට අගය නිර්ණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු (තිබේ නම්) සැලකිල්ලට ගනු ලැබේ. එබඳු ගනුදෙනු හඳුනා ගත නොහැකි නම්, උචිත තක්සේරු ක්‍රමයක් භාවිතා කරනු ලැබේ.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1.6 බදුකරණය

3.1.6.1 වර්තමාන බදුකරණය

වර්තමාන සහ පෙර වර්ෂවල දී මෙන් බදු ආයතන වලට,ආයතනයේ බදු වත්කම් සහ බැරකම් මත බදු ගෙවීමක් සිදු කරයි. එම බදු ප්‍රමාණයන් ගණනය කිරීමට යොදා ගන්නා ලද බදු අනුපාතික හා බදු නීති වනාහි ශේෂ පත්‍ර දින වන විට පනවා තිබූ ඒවා වේ.

ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ හා එයට කරන ලද සංශෝධන හා විධිවිධාන වලට අනුකූලව පනතේ නියම කර ඇති අනුපාතිකයන්ට අනුව බදු ගෙවීමේ කාර්යය සඳහා ගලපන ලද වර්ෂයේ ලාභය පදනම් කරගනිමින් බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්තේ පනතේ නියම කර ඇති අනුපාතික වලට යටත්ව ගිණුම්ගත ලාභය පදනම් කරගෙනය.

3.1.6.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති වත්කම් සහ වගකීම් වලට අදාල තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු බැරකම් හා වත්කම් ප්‍රතිපාදන කර ඇත. අපගේ මූල්‍ය ප්‍රකාශයන් තුළ ප්‍රධාන වශයෙන් ස්ථාවර වත්කම් වල ලියාහල පොත් අගය හා ලියාහල බදු වටිනාකම සඳහා විලම්බිත බදු බැරකමක්ද, විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් වූ ප්‍රතිපාදනය සඳහා විලම්බිත බදු වත්කමක්ද හඳුනා ගත්තෙමු. විලම්බිත බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් බදු අනුපාත අනුවය.

3.2. භාණ්ඩ තොග

'ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කල' පදනමින් අගය තක්සේරු කෙරෙන අභාවිත හෝ මන්දගාමී චලනයක් සහිත භාණ්ඩ සඳහා නිසි වෙන් කිරීම් කළ පසුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ තොග අගය කරනු ලැබේ.

3.2.1 තොග අගය කිරීම

තොග පිරිවැය

අමුද්‍රව්‍ය
කවර හෝ පසු වියදම්ද ඇතුළුව මිලට ගැනීමේ පිරිවැය

නොනිමි වැඩ
අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

නිමි භාණ්ඩ
අමුද්‍රව්‍ය පිරිවැය සහ සම්පූර්ණ විචල්‍ය නිෂ්පාදන පිරිවැය

වෙනත් තොග
පිරිවැය නිශ්චය කර ඇත්තේ බර තැබූ සාමාන්‍යය පදනමිනි.

3.2.2 වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ

වෙළඳ සහ අනිකුත් අය විය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත හඳුනා ගෙන පසු වර්ෂයන්හිදී හානිකරණය සඳහා ප්‍රතිපාදන වලට යටත්ව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. සංස්ථාව විසින් 2023.12.31 දිනට දීර්ඝ කාලයක් හිග හිටි වෛද්‍ය සැපයුම් අංශය වෙතින් අය විය යුතු මුදල් සඳහා අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදු කොට ඇත.

3.2.3 මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් හා මුදල්වලට සමාන දේ යන්නට අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටි කාලීන ආයෝජන ඇතුළත්ය.

3.2.4 සබැඳි පාර්ශවයන් සමග ගනුදෙනු

කළමණාකරන පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු

සංස්ථාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පුද්ගලයින් ප්‍රධාන කළමණාකරන නිලධාරීන් ගනයට වැටේ. එම හඳුන්වා දීම අනුව සංස්ථාවේ විධායක සහ විධායක නොවන ගණයට අයත් අධ්‍යක්ෂකවරුන් ප්‍රධාන කළමණාකරන නිලධාරීන් ලෙස වර්ගීකරණය කළ හැක.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රධාන කළමණාකරන නිලධාරීන්ට (අධ්‍යක්ෂක මණ්ඩලයට) ගෙවන ලද දීමනා පහත පරිදි වේ.

	2024	2023
කෙටිකාලීන ප්‍රතිලාභ	2,394,055	2,830,423
තෑගි වවුචර	215,000	180,000

රාජ්‍ය හා රාජ්‍ය පාලනය සහිත ආයතන සමග ගනුදෙනු

සංස්ථාව සිය සාමාන්‍ය මෙහෙයුම් වලදී සබැඳි පාර්ශවයන් සමඟ ගනුදෙනු වලට එළඹෙයි. සබැඳි පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය (රජය : සංස්ථාවේ හිමිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන ඇතුළත්ය. රජය සහ රජය විසින් පාලනය කරනු ලබන හා තනි තනිව වැදගත් වන්නාවූ හෝ අන් සමහර ගනුදෙනු සම්බන්ධයෙන් තනි තනිව නොව, සාමූහිකව වැදගත් වන්නා වූ ආයතන සමග සංස්ථාව එළඹුනු ගනුදෙනු හා විධිවිධාන පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

	2024	2023
ගනුදෙනු	රු	රු
සංස්ථාව සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වල ආයෝජන	8,411,745,348	6,166,594,367
වර්ෂය තුළ රජය වෙත කල ගෙවීම්	300,000,000	300,000,000
විකුණුම්	28,202,081,82	29,331,718,691
හිඟ ශේෂ	රු	රු
රා. ඖ. සං. වෙතින් අය විය යුතු දේ	11,599,411	8,426,990
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් අය විය යුතු දේ	2,885,941,368	2,378,686,753

3.2.5 ප්‍රාග්ධනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අනුදත් ප්‍රාග්ධනයෙහි වෙනසක් වී නොමැත.

3.2.6 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට පසු සිදු වූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනයෙහි අවශ්‍ය අවස්ථාවන්හිදී යෝග්‍ය වෙනස්කම් සිදු කර ඇති අතර, අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශයට අනාවරණයන් සිදු කර ඇත.

3.2.7 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබා ගැනීමේ අරමුණින් සිදු කරන ලද පර්යේෂණ කටයුතු සඳහා වියදම් ඇති වූ අවස්ථාවේදී ඒවා ලාභාලාභ ගිණුම තුළ පෙන්වා ඇත.

4. බැරකම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

4.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිර්වචනය කරන ලද දායකත්ව සැලැස්මක්ම නොවන පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. සුදුසුකම් ලත් ස්වාධීන ආයු ගණක විශ්ලේෂකයෙකු විසින් තීරණය කරනු ලබන මෙම බැඳියාවේ ඇස්තමේන්තුකරණයෙහිලා දිගු කාලීන උපකල්පන අවශ්‍යයෙන්ම ඇතුළත් වන්නේ ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS – 19) අනුව, නියමිත ප්‍රතිපාදන ගණනය කිරීමේ දී ආයු ගණක තක්සේරු ක්‍රමය අනුගමනය කරන ලද රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විෂයයෙහි නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ තක්සේරුව තීරණය කිරීම සඳහා සුදුසුකම් ලත් ආයු ගණක විශ්ලේෂකයෙකුගේ සේවය ලබා ගැනේ. සමාගම විසින් අනුගමනය කරන ලද ආයු ගණක තක්සේරුව අරබයා ආසන්න වශයෙන් වූ ක්‍රියාකාරී තාක්ෂණික ශිල්ප ක්‍රම ද මෙම ප්‍රමිතිය මඟින් සපයා දෙයි.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය, ආයු ගණක උපකල්පන භාවිතයෙන් ප්‍රවර්තන දත්ත ප්‍රක්ෂේපණය කර දක්වන අතර අදාළ සහභාගිත්වය දරන තැනැත්තන්ගේ උපකල්පිත විශ්‍රාම දිනයේ දී ඊට සබැඳි ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ද ගණනය කර පෙන්වයි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇති නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙන් අඩු කරන ලද නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ ප්‍රවර්තන අගය නියෝජනය කරයි. ආයු ගණක ලාභ සහ අලාභ, ඒවා පැන නගින මූල්‍ය වර්ෂය තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායම හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා බැඳි පාරිතෝෂික වගකීම්, පාරිතෝෂික අරමුදලක් මගින් වෙන් වශයෙන් හඳුනා ගනු ලබන අතර, එකී අරමුදලේ ආයෝජනය ප්‍රධාන වශයෙන් රජයේ බැංකුවක් හරහා සිදු කෙරෙන භාණ්ඩාගාර බිල්පත් අනුසාරයෙන් වන්නේ ය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS -19) අනුකූලව, සේවයේ පළමු වසරේ සිට සියලුම සේවකයින් වෙනුවෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳියාව සඳහා ප්‍රතිපාදන වෙන් කර සලසා දෙනු ලබයි.

ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය / ගිණුම්කරණ ප්‍රමිතිය යටතේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ ප්‍රවර්තන ආයු ගණක අගය (PVDBO) යනු, තක්සේරු දිනය දක්වා වූ සේවා කාලය මත පදනම් වන නමුත්, සේවකයා තම රැකියාවෙන් ඉවත් වෙතැයි (අයහපත් සෞඛ්‍ය තත්ත්වය, විශ්‍රාම ගැනීම, මරණය සිදු වීම, සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා) අනුමාන කරනු ලබන දිනය දක්වා වූ ප්‍රක්ෂේපිත අවසාන වැටුප් ප්‍රමාණ සමඟ, යෝජනා ක්‍රමය තුළ දැනට සිටින සේවක සේවිකාවන් විෂයයෙහි උපචිත වන සියලුම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම වේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීමේ පනත යටතේ, සේවකයකු විෂයයෙහි අදාළ වගකීම උද්ගත වන්නේ, අඛණ්ඩ සේවා කාලය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

ආයු ගණක ලාභ සහ අලාභ හඳුනා ගැනීම

මුළු ආයු ගණක ලාභය හෝ අලාභය, එය සිදු වන කාල සීමාව තුළදීම රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනේ.

ප්‍රවර්තන සේවා පිරිවැය හඳුනා ගැනීම

සේවා අවසන් කිරීමේ පාරිතෝෂික නිශ්චිත ප්‍රතිලාභය, ව්‍යවස්ථාපිත ප්‍රතිලාභයක් වන බැවින්, ප්‍රවර්තන සේවා පිරිවැය හඳුනා ගැනීම පැන නගින්නේ, සේවා නියුක්තිය අවසන් කිරීමේ දී පොරොන්දු වූ ප්‍රතිලාභය වැඩි කිරීම සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික මුදල් ගෙවීම් පනත ඉදිරියේ දී සංශෝධනය කළහොත් පමණි. එවැනි අවස්ථාවක දී, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් දැනට පවත්නා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කරනු ඇත.

සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය, ආයු ගණක තක්සේරු කිරීම් භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ආයු ගණක තක්සේරුකරණයෙහි ලා විවිධ උපකල්පනය කිරීම්, වට්ටම් අනුපාත තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වේ. තක්සේරුවේ සංකීර්ණත්වය, ඊට පාදක වූ උපකල්පන සහ ඒවායේ දිගු කාලීන ස්වභාවය කරණ කොට ගෙන, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිත තත්වයකට යටත් වේ. අදාළ සියලු උපකල්පන සෑම වාර්තාකරණ දිනයක දී ම සමාලෝචනයට හසු කෙරේ.

සුදුසු වට්ටම් අනුපාතය තීරණය කිරීමේ දී, කළමනාකාරිත්වය ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල පොලී අනුපාත සලකා බලයි. මර්ත්‍යතා අනුපාතිකය, දැනට ප්‍රකාශිතව පවත්නා අදාළ මර්ත්‍යතා වගු මත පදනම් වේ. අනාගත වැටුප් වැඩිවීම් පිළිබඳ ඇස්තමේන්තුව පදනම් වනුයේ, අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය යන කරුණු මත ය. සැලසුම් වත්කම්වල ආයෝජන කළඹ, වෙළෙඳපළ අවදානම්වලට සහ ණය අවදානම්වලට නිරාවරණය වේ.

සැලසුමක ප්‍රතිලාභ වෙනස් කරනු ලබන විට හෝ සැලසුමක් ලුහුඬු කරන කල්හි, අතීත සේවයට අදාළ ප්‍රතිලාභ විෂයයෙහි සිදු වන වෙනස හෝ අදාළ ලුහුඬු කිරීමේ ලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ ගිණුම තුළ වහා හඳුනා ගැනේ. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් එකී ලාභය හෝ අලාභය නිශ්චිත සැලැස්මක් නිරාකරණය කිරීම මත හඳුනා ගනු ලබන්නේ, එම නිරවුල් කිරීම සිදු කරන අවස්ථාවේ දී ය.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව නිර්ණය කරනු ලැබ ඇත්තේ, සීමාසහිත ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවේට් ලිමිටඩ් ආයතනයේ ආයු ගණකඥ, මුනිසාමි පූපලනාදන් මහතා විසින් සිදු කරන ලද ආයු ගණක තක්සේරු කිරීම් මත පදනම්ව ය

4.1.2 නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට හා සේවක භාරකාරත්ව අරමුදල් දායකත්වයට සුදුසුකම් ඇති සියලුම සේවකයන් අදාල රෙගුලාසි වලට අනුකූලව අදාළ දායකත්ව අරමුදල් මගින් ආවරණය කරනු ලැබේ. සේවකයන් ආවරණය කරමින් අර්ථසාධක අරමුදලට හා භාරකාර අරමුදලට සැපයෙන දායකත්වයන් පිළිබඳ වගකීම් භාරයන් ආදායම් ප්‍රකාශය තුළ වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

සේවක අර්ථසාදක අරමුදල

සංස්ථාවේ සියලුම සේවකයින් සේවක අර්ථසාදක අරමුදලේ සාමාජිකයන් වන අතර සංස්ථාව විසින් සේවක ඒකාබද්ධ වැටුපෙන් 15% ක් අරමුදලට දායක කරනු ලබයි.

සේවක භාරකාර අරමුදල

සංස්ථාව සේවකයන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

4.1.3 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දේ ඒවායේ පිරිවැය අනුව සඳහන් කර ඇත. වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දේ ප්‍රථමයෙන් සාධාරණ වටිනාකම මත අගය කර පසුව සඵල පොළී අනුපාතිකය ආධාරයෙන් ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට හානිකරණ සඳහා ප්‍රතිපාදනයන් අඩුකරයි. 2024.12.31 දිනට සැලකිය යුතු අවදානමක් නොමැති බැවින් පසු වර්ෂයන්හිදි ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත පිරිවැයන් සඳහා සංස්ථාව කිසිදු ප්‍රතිපාදනයක් සිදු කොට නැත.

4.1.4 ප්‍රතිපාදන

පොදු

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන (නෛතික හෝ අර්ථවිග්‍රහ කළ) වගකීම් භාරයක් සංස්ථාවට ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. අදාළ වගකීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභයක් ඇති වත්කම් වලින් මුදල් ප්‍රවාහයක් ගලා යන්නේ නම් සහ වගකීම් භාරයේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වීමේ හැකියාව තිබිය හැකිය. සංස්ථාව ප්‍රතිපාදනයෙන් කොටසක් හෝ සමස්තයම ප්‍රතිපූරණය කෙරෙනු ඇතැයි අපේක්ෂා කරන තැන්හිදී (නිදසුනක් ලෙස රක්ෂණ ගිවිසුමක් යටතේ) වුවද ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස හඳුනා ගනු ලබන්නේ ප්‍රතිපූරණය නිශ්චිතවම හඳුනාගත් විටය. කවර හෝ ප්‍රතිපාදනයක් සම්බන්ධයෙන් වූ වියදමක් ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ ඊට අදාල ප්‍රතිපූරණයන් අඩු කොටය.

මුදලේ වර්තමාන අගයේ වෙනස්වීම වැදගත් නම්, උචිත තැන්හිදී බැරකමට වන විශේෂිත අවදානම් සඳහා පිළිඹිබු කරන වත්මන් බදු-පූර්ව අනුපාතිකයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම්කරණය භාවිතා කරන තැන්හිදී කාලය ගත වීමත් සමගම ප්‍රතිපාදනයේ ඇති වන වෙනස මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ශ්‍රිත ක්‍රමය යොදා ගෙන ඇත්තේ එමගින් සංස්ථාවේ කාර්යසාධනයෙහි සංරචකයන් සාධාරණව නිරූපනය වන නිසාය.

5.1.1 පිරිවැටුම

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ බෙදා හරින්නන් වෙත කෙරෙන අලෙවියෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පිරිවැටුම සමන්විත වේ.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1.2 ආදායම් හඳුනා ගැනීම

ගෙවන අවස්ථාව කවරක් වුවද, ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ගලා ඒමේ හැකියාව ඇති හා ආදායම හා ඊට සම්බන්ධ පිරිවැය විශ්වාසය තැබිය හැකි අයුරින් මැනිය හැකි මට්ටමට ආදායම හඳුනා ගනු ලැබේ. ගිවිසුම්ගතව නිර්වචනය කරන ලද ගෙවීමේ නියමයන් සැලකිල්ලට ගනිමින් හා බදු හෝ තීරු ගාස්තු බැහැර කරමින්, ලැබුණු හෝ අය විය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සංස්ථාව සිය ආදායම් සැලසුම් වල විධිවිධානයන් දෙනු ලබන ප්‍රධානියා වේ. ආදායමක් වශයෙන් හඳුනාගැනීමේදී පහත සඳහන් විශේෂ පිළිගත් මිනුම්දඬු සපුරාලිය යුතුය.

භාණ්ඩ අලෙවිය

ආයතනයේ විකිණුම් ආදායම සමන්විත වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය වෙත කරන ලද විකිණුම්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට හා අප වෙත ලියාපදිංචිව සිටින බෙදා හරින්නන් වෙත කෙරෙන විකිණුම් වලින් වේ.භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගනු ලබන්නේ ආයතනයේ අවදානම සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කළ පසුවය.

සංස්ථාවේ ආදායම පහත සඳහන් ප්‍රභවයන්ගෙන් සැකසී ඇත.

(අ) වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ සැපයීම (රජයේ රෝහල්)
සංස්ථාව නිෂ්පාදනය කරන ඖෂධ සහ බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගන්නා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත විකිණීම සිදු කරයි. නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට මාරු කරන අවස්ථාවේදී “විකිණුම්” ආදායමක් ලෙස හඳුනා ගැනේ. රා.ඖ.නි.ස. බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වෛද්‍ය සැපයුම් අංශයට සපයනු ලබන්නේ මිලදී ගැනුම් මිලට 6% ක් එකතු කිරීමෙනි.

සංස්ථාව පහත සඳහන් බද්ධ ව්‍යාපාර පිහිටුවා ඇත.

ආයතනයේ නම	ලිපිනය	හිමිකාරිත්වයේ ප්‍රතිශතය	ප්‍රධාන ක්‍රියාකාරකම
සෙලොජන් ලංකා පුද්ගලික සමාගම	116, ලයාඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය
දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම	53/ඒ/1, බටගම උතුර, ජාඇල	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය
ග්ලොසන්තේ පුද්ගලික සමාගම	372, සර් කුඩාරත්වත්තේ මාවත, දොඩන්වල, මහනුවර	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය
මෙඩිකොම් පුද්ගලික සමාගම	20, විජිතපාර, නැදිමාල, දෙහිවල	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය
යාඩින් ලැබොරටොරීස් පුද්ගලික සමාගම	67, නොරිස් කැනල් පාර, කොළඹ 10	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය
සැන්ඩ්ස් ඇක්ටිව් පුද්ගලික සමාගම	36, අබ්දුල් ජබාර් මාවත, කොළඹ 12.	10%	SPMC හරහා ඖෂධ වෛද්‍ය සැපයුම් අංශය වෙත ඖෂධ නිෂ්පාදනය

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාව හා බද්ධ ව්‍යාපාර සමාගම්, බද්ධ ව්‍යාපාරයේ ඉහත සඳහන් කොටස් හිමිකම සම්බන්ධයෙන් කොටස් හිමි ගිවිසුමක් ක්‍රියාත්මක කළ යුතුය. මෙම බද්ධ ව්‍යාපාර සමාගම් SPMC වෙත ප්‍රධානය කරන ලද මෙම කොටස් හිමිකාරත්වයේ ප්‍රතිශතය, ගිවිසුමේ අපේක්ෂිත කාලය පුරාවටම පවත්වාගෙන යාමට වගබලා ගනී.

කොටස් හිමිකම පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

කොටස් හිමි ආයතනය	කොටස් ගණන	නිකුතු දිනය	වටිනාකම (රු)
සෙලොජන් ලංකා පුද්ගලික සමාගම	3,000,000	21.10.2020	3,000,000
දියත ෆාමසියුටිකල් ඇන්ඩ් හෙල්ත්කෙයා පුද්ගලික සමාගම	1,500,000	21.10.2020	1,500,000
ප්‍රීමියම් ඉන්ටනැෂනල් ඉන්ජෙක්ටබල් පුද්ගලික සමාගම	16,162	22.12.2020	16,162
සැන්ඩ්ස් ඇක්ටිව් පුද්ගලික සමාගම	33	15.11.2019	33
යාඩින් ලැබොටොරීස් පුද්ගලික සමාගම	4,111,111	07.06.2021	4,111,111
සිනර්ජි පාර්මසියුටිකල්ස් පුද්ගලික සමාගම	10	01.07.2018	10
ග්ලොසන්තේ පුද්ගලික සමාගම	10	06.06.2022	10

(ආ) බෙදා හරින්නන් හරහා ඖෂධ සැපයීම :
සංස්ථාව 2003 සිට බෙදා හරින්නන් හරහා ඖෂධ අලෙවි කරයි.

ආදායම වර්ගීකරණය
විකිණුම් වල ස්වභාවය අනුව ආදායම වර්ගීකරණය කර ඇත.

		2024	2024
වෛද්‍ය සැපයුම් අංශය	SPMC නිෂ්පාදන	6,365,874,163	6,529,310,266
	බද්ධ ව්‍යාපාර නිෂ්පාදන	19,922,270,452	20,166,340,889
රාජ්‍ය ඖෂධ සංස්ථාව	SPMC නිෂ්පාදන	18,566,907	66,827,524
	බද්ධ ව්‍යාපාර නිෂ්පාදන	9,299,089	8,647,340
බෙදාහරින්නන්	SPMC නිෂ්පාදන	1,668,560,933	2,365,477,315
	බද්ධ ව්‍යාපාර නිෂ්පාදන	217,510,274	195,115,357

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

විකිණුම් මත වට්ටම්

බෙදාහරින්නන් වෙත විකිණුම්

ණයට විකිණුම්	9%
මුදලට විකිණුම්	10%

නියෝජිත ඔසුසල් වෙත විකිණුම්

රු.50,000 සිට රු.100,000 දක්වා ණයට විකිණුම්	6%
රු.50,000 සිට රු.100,000 දක්වා මුදලට විකිණුම්	7%
වෛද්‍යවරුන් හට මුදලට විකිණුම්	5%

රාජ්‍ය ඖෂධ සංස්ථාව වෙත සෘජු විකිණුම්

ණයට විකිණුම්	10%

5.1.3 වියදම්

වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වා ගෙන යාමෙන් ඇති වූ සියලුම වියදම් ආදායමෙන් අඩු කර ඇත. අළුත්වැඩියාවන් හා අළුත් කිරීම් එම වියදම ඇති වූ වර්ෂයේ ලාභ අලාභවලට අය කරනු ලැබේ.

5.1.4 මූල්‍ය වියදම්

මූල්‍ය වියදම් සමන්විත වන්නේ බැංකු අයිරා මත පොළිය, ණයවර ලිපි විවෘත කිරීමේ වියදම්, සහ ණය පහසුකම් ගිවිසුම් ගාස්තු යන මේවායින්ය.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1.5 පොදුකාර්ය වියදම් ප්‍රතිපාදනය

මූල්‍ය ප්‍රකාශ තුළ පොදුකාර්ය ප්‍රතිපාදන ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

වියදම්	ප්‍රතිපාදන ක්‍රමය
වරිපනම් බදු, විදුලිය, ජල ගාස්තු, රක්ෂණ, උපකරණ නඩත්තු, පොදු නඩත්තු, ගොඩනැගිලි නඩත්තු, ක්ෂය	අදාල පිරිවැය සෘජුවම නිෂ්පාදන හෝ පරිපාලන වියදම් ලෙස හඳුනා ගනු ලබන අවස්ථා වලදී ඒ ඒ පිරිවැය යටතේද පොදු පිරිවැයක් වන්නේ නම් එයද 70% හා 30% වශයෙන් පිලිවෙලින් නිෂ්පාදන හා පරිපාලන වශයෙන් වෙන් කරනු ලැබේ.
සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ වාරිකය, කාර්ය මණ්ඩල සුභසාධනය, නිල ඇඳුම් හා පාවහන්, ප්‍රවාහන ගාස්තු	එක් එක් අංශයේ සිටින සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන පිරිවැය බෙදනු ලැබේ.
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු, වෙනත් දිරිදීමනා, මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු, වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය, තැපැල් හා ෆැක්ස් ගාස්තු, දුරකථන ගාස්තු, ආරක්ෂක ගාස්තු, වාහන හා ඖෂධ බලපත්‍ර ගාස්තු, මුද්‍රණ කටයුතු හා ලිපිද්‍රව්‍ය, කාර්යාල වියදම්, විගණන ගාස්තු, කුළී ගාස්තු, ප්‍රචාරක දැන්වීම්, වෙළඳ දායකත්වයන් හා වාර සඟරා, නීති හා පරීක්ෂණ වියදම්, වෘත්තීයවේදී ගාස්තු, සංග්‍රහ, වාර්ෂික දායකත්වයන්, වාර්ෂික සමුළු හා රැස්වීම්, මුද්දර ගාස්තු, ලිපිද්‍රව්‍ය තොග සත්‍යාපන ගැලපුම්.	තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ
කාර්ය මණ්ඩල ප්‍රතිලාභ සහ වෙනත් වියදම්	තථ්‍ය පිරිවැය ක්‍රමය භාවිතා කෙරේ.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

6. මූල්‍යකරන මෙවලම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මුල් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

ශ්‍රී.ල.ගි.ප්‍ර අංක 39 හි විෂයපථය තුළ මූල්‍ය වත්කම් වර්ගීකරණය වී ඇත්තේ ලාභ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම්, ණය හා අය විය යුතු දේ, කල් පිරීම දක්වා කරනු ලබන ආයෝජන හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙසයි. ඒ අනුව වටිනාකම ආයතන වලට යෝග්‍ය ආකාරයට තම මූල්‍ය වත්කම් වර්ගීකරණය නිර්ණය කළ යුතුය.

සියලුම මූල්‍ය වත්කම් වෙළඳපල වටිනාකමට අගය කලයුතු අතර වෙළඳපල අගය තීරණය කල නොහැකි අවස්ථා වල එම මූල්‍ය වත්කම් ගනුදෙනු අගය කල පිරිවැයට අගය කල යුතුය. සංස්ථාවේ මූල්‍ය වත්කම් වලට මුදල් හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ආයෝජන, වෙළඳ හා වෙනත් අයවිය යුතු දේ, කාර්ය මණ්ඩල ණය, සහ වෙනත් අය විය යුතු දේ ඇතුළත් වේ.

6.1.2 පසු තක්සේරුව

මූල්‍ය වත්කම් වල පසු වර්ෂ වල තක්සේරුව පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

6.1.3 ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම්

ලාභාලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය තක්සේරු කරන මූල්‍ය වත්කම් වලට අන්තර්ගත වනුයේ විකිණීම සඳහා වෙන් කරන ලද මූල්‍ය වත්කම් හා මුල් හඳුනාගැනීමේදී මෙම වර්ගීකරණයට අයත් යැයි නිර්ණය කරන ලද මූල්‍ය වත්කම්ය. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදී විකිණීමේ හෝ යළි මිලට ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇති නම් ඒවා විකිණීම සඳහා වෙන්කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

6.1.4 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය...

ණය සහ අය විය යුතු දේ වනාහි ක්‍රියාශීලී වෙළඳපලක තක්සේරු නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකුණා ඉපයීමක් නොකරන මූල්‍ය වත්කම්ය. මුල් හඳුනා ගැනීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසු වර්ෂයන් හි තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය. ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදී වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කල සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵලපොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් නිසා පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ.

6.1.5 කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත විවෘත වෙළඳපලේ විකිණීමක් නොකරන සංස්ථාවට කල්පිරීම දක්වා දැරීමේ හැකියාව හා සාධනීය චේතනාව තිබේ නම් ඒවා කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කල් පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන තක්සේරු කරනු ලබන්නේ හානිවීම් අඩු කර සඵල පොළී අනුපාතික ක්‍රමය EIR භාවිතා කර ක්‍රමක්ෂය කරන ලද පිරිවැයටය.

ගාස්තු හා පිරිවැය සහ අත්කර ගැනීමේදි වූ වට්ටම් හෝ විශේෂ දීමනා සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබන පොළී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම තුළ සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුලින් පැන නගින අලාභයන් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ හඳුනා ගනු ලැබේ. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල්පිරීම තෙක් රඳවනු ලබන ආයෝජන නොතිබුණි.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

6.1.6 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන වලට කාරක ප්‍රාග්ධනය හා ණය සුරැකුම් ඇතුළත්ය. විකිණීමට ඇති මූල්‍ය ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇත්තේ කාරක ප්‍රාග්ධන ආයෝජන විකිණීම සඳහා රඳවා ගනු ලබන ලෙස වර්ගීකරණය කරනු ලැබූ ,ලාභ හෝ අලාභ ගිණුම හරහා වෙළඳපල වටිනාකමට අගය කර නොමැති ඒවාය. මෙම ප්‍රභේදය තුල ඇති ණය සුරැකුම් වනාහි ද්‍රවශීලතාව සඳහා වූ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළඳපල තත්ත්වයන්ගේ වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් අලෙවි කරනු ලැබිය හැකි අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා රඳවනු ලැබීමට අපේක්ෂා කෙරෙන ඒවාය.

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන මූලික හඳුනාගැනීමෙන් පසුව, සමුච්චිත අලාභය, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය තුළ යළි වර්ගීකරණය කොට විකිණීමට ඇති සංචිතයෙන් ඉවත් කෙරෙන අතර, සමුච්චිත අලාභය වෙනත් මෙහෙයුම් ආදායම තුළ හඳුනා ගන්නා හෝ හානි වූ ලෙස නිර්ණය කරනු ලබන අවස්ථාවක, ආයෝජන ලෙස හඳුනා නොගැනීමක් කෙරෙන තෙක්, විකිණීමට ඇති සංචිතය තුළ අනෙකුත් අංග සම්පූර්ණ ආදායම ලෙස හඳුනා ගනු ලැබූ අනු උපලබ්ධි ලාභ හෝ අලාභ සමග වෙළඳපල වටිනාකමට තක්සේරු කරනු ලැබේ. විකිණීමට ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනු ලැබේ.

සංස්ථාව සිය විකිණීමට ඇති මූල්‍ය වත්කම් තක්සේරු කරනුයේ නුදුරු කාලයේදී මෙම මූල්‍ය වත්කම් විකිණීමට ඇති හැකියාව හා අභිප්‍රාය තවමත් උචිතද යන්න නිශ්චය කරනු පිණිසය. වෙළඳපලේ අක්‍රිය බව නිසා මෙම මූල්‍ය වත්කම් ගනුදෙනු කිරීමට සංස්ථාවට නොහැකි වන විට සහ එසේ කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය සාධ්‍යශ්‍ය අනාගතයේදී සැලකිය යුතු ලෙස වෙනස් වන විට,සංස්ථාව ඉතා කලාතුරකින් මෙම මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කිරීමට තීරණය කිරීමට ඉඩ ඇත. .

මූල්‍ය වත්කම් ණය හා අයවිය යුතු දේවල නිර්වචනය සපුරාලයි නම් සහ සාධ්‍යශ්‍ය අනාගතය තුළ හෝ කල්පිරෙන තෙක් මෙම වත්කම් රඳවා ගැනීමට ඇති හැකියාව හා අභිප්‍රාය බැංකුවට ඇති විට ඒවා ණය හා අයවිය යුතු දේ ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබේ. කල්පිරෙන තෙක් රඳවනු ලබන ආයෝජන ලෙස යළි වර්ගීකරණය කිරීමට අවසර ලැබෙනුයේ ආයතනයට අදාළ මූල්‍ය වත්කම එලෙස රැඳවීමට හැකියාව හා අභිප්‍රාය තිබේ නම් පමණි.

'විකිණීමට ඇති' ප්‍රභේදයෙන් ඉවත්ව යළි වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන්, කාරක ප්‍රාග්ධනය තුළ හඳුනා ගෙන ඇති එම වත්කමේ කවර හෝ පෙර ලාභයක් හෝ අලාභයක් සඵල පොළී අනුපාතික භාවිතා කරමින් ආයෝජනයේ ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය කරන ලද පිරිවැය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර ඇති වන කවර හෝ වෙනසක් වුවද සඵල පොළී අනුපාතික භාවිතා කරමින් වත්කමෙහි ඉතිරිව ඇති ආයුකාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලැබේ. අදාළ වත්කම් පසුව හානි වී ඇතැයි නිර්ණය කරනු ලබන්නේ නම්, එවිට කාරක ප්‍රාග්ධනය තුළ සටහන් කරන ලද ප්‍රමාණය ආදායම් ප්‍රකාශය වෙත යළි වර්ගීකරණය කරනු ලැබේ. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව විකිණීමට ඇති මූල්‍ය ආයෝජන නොතිබුණි.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

6.2 හඳුනා නොගැනීම්

මූල්‍ය වත්කමක් (එසේත් නැත හොත්, අදාළ අවස්ථාව අනුව, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගැනීමක් කරනු ලබන්නේ පහත අවස්ථාවන්හිදීය.

I). වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය ඉකුත් වීම
II). සංස්ථාව එම වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිවාසිකම් පවරා තිබීම හෝ 'විනිවිද යන' විධිවිධානයක් යටතේ තුන්වන පාර්ශවයකට බලවත් ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් පූර්ණ වශයෙන් ගෙවීමේ වගකීමක් භාර ගෙන තිබීම සහ
අ) සංස්ථාව වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පවරා තිබීම හෝ
ආ) සංස්ථාව, වත්කමෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත්ව පැවරීමකින් හෝ රඳවා ගැනීමකින් තොරව වත්කමේ පාලනය පවරා තිබීම.

6.3 මූල්‍ය වත්කම් හානිකරණය

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි කිසිවක් තිබේදැයි සංස්ථාව එක් එක් වාර්තාකරණ දිනයේදී තක්සේරු කර බලයි. යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී ඇතැයි සලකනු ලබන්නේ වත්කමේ මූලික හඳුනා ගැනීමට පසුව සිදු වූ සිදුවීමක හෝ කීපයක ප්‍රතිඵලය වශයෙන් හානි වීමක් පිළිබඳව පිළිගත හැකි සාක්ෂි ඇති නම් සහ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් මත විශ්වාසය තැබිය හැකි අයුරින් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් මඟින් අලාභ ගෙන දෙන සිදුවීමක් හෝ සිදුවීම් ඇති නම් පමණි.

හානිකරණයේ සාක්ෂි ලෙස ණයගැතියන්ගේ හෝ ණයගැති සමූහයේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පොළී හෝ මුල් මුදල් ගෙවීම් පැහැර හැරීම, බුන්වත්භාවය හෝ වෙනත් මූල්‍ය සංවිධානයවීම් වලට අවතීර්ණ වීම අත්විඳිමින් සිටින බව දක්වන සංඥා සහ පැහැර හැරීම්වලට සහසම්බන්ධ හිඟ වාරික හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි අඩු වීමක් තිබෙන බව හඟවන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ.

6.4 ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව මුලින්ම, තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව හානිවීමේ සහ තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහික වශයෙන් හානිවීමේ වාස්තවික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. තනිව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කම් සඳහා හානිවීමේ වාස්තවික සාක්ෂි නොමැති බවට සංස්ථාව තක්සේරු කරන්නේ නම් එම වත්කම සැලකිය යුතු එකක් වුවද, නොවුවද, සංස්ථාව එම වත්කම එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුළත් කොට, හානිවීම සම්බන්ධයෙන් අදාළ වත්කම් කණ්ඩායමම සාමූහිකව තක්සේරු කරයි. හානිවීමක් ඇතිදැයි තනි තනිව තක්සේරු කරනු ලබන හා අපව අලාභයක් ඇති හෝ අඛණ්ඩව පවතිනු ඇති ලෙස හඳුනා ගනු ලබන වත්කම් සාමූහික අපව තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

හානිවීමේ අලාභයක් සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ අගය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (තවමත් ඇති වී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභයන් ඇතුළත් නොවන) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ය.

ආයතනික තොරතුරු සහ මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. සංස්ථාව එක් එක් ණයගැති ප්‍රභේදය සඳහා විශේෂිත හානි වීම තක්සේරු කිරීම සිදු කර ඇත.

7. මූල්‍ය අවදානම් කළමණාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

මූල්‍ය අවදානම

සංස්ථාවේ අවදානම් කළමණාකරණ රාමුවේ කටයුතු ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

සංස්ථා අවදානම් කළමණාකරණ ක්‍රියාවලිය ස්ථාපිත කර ඇත්තේ සංස්ථාව මුහුණදෙන අවදානම් හඳුනාගෙන ඒවා විශ්ලේෂණය කිරීම සඳහා සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීමට, අවදානම් අධීක්ෂණය කිරීමට සහ සීමාවන්ට අනුකූල වීම සඳහාය.

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

සටහන - 1

			2024		2023	
ආදායම						
විකුණුම් - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	රා.ඖ.නි.ස.		6,365,874,163		6,529,310,266	
	බද්ද ව්‍යාපාර		19,922,270,452	26,288,144,615	20,166,340,889	26,695,651,155
විකුණුම් - බෙදාහරින්නන්	රා.ඖ.නි.ස.	1 - (අ)	1,687,127,841		2,432,304,839	
	බද්ද ව්‍යාපාර	1 - (ආ)	226,809,364	1,913,937,205	203,762,697	2,636,067,536
				28,202,081,820		**29,331,718,691**

සටහන - 1 (අ)

	2024	2023
විකුණුම් - බෙදාහරින්නන් රා.ඖ.නි.ස.		
දළ විකුණුම්	1,862,390,335	2,687,210,197
(-)වට්ටම් - 6%	(51,988)	-
(-)වට්ටම් - 7%	(3,033)	-
(-)වට්ටම් - 9%	(94,176,374)	(122,912,584)
(-)වට්ටම් - 10%	(81,031,099)	(131,992,775)
ශුද්ධ විකුණුම්	**1,687,127,841**	**2,432,304,839**

සටහන - 1 (ආ)

	2024	2023
විකුණුම් – බෙදාහරින්නන් - බද්ද ව්‍යාපාර		
දළ විකුණුම්	249,932,883	224,545,824
(-)වට්ටම් - 9%	(12,204,174)	(10,568,519)
(-)වට්ටම් - 10%	(10,919,345)	(10,214,609)
ශුද්ධ විකුණුම්	**226,809,364**	**203,762,697**

සටහන - 02

			2024		2023
විකුණුම් පිරිවැය					
	රා.ඖ.නි.ස.	4,394,327,713		4,708,703,823	
	බද්ද ව්‍යාපාර	18,822,743,554	23,217,071,267	19,043,340,361	23,752,044,184
	රා.ඖ.නි.ස.	1,147,410,416		1,907,567,989	
	බද්ද ව්‍යාපාර	212,105,750	1,359,516,166	189,765,906	2,097,333,895
නිෂ්පාදන වියදම්			643,160,857		532,591,149
			25,219,748,290		**26,381,969,228**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

සටහන - 2 (අ)

නිෂ්පාදන පිරිවැය	අවශෝෂණය නොකළ පිරිවැය	අවශෝෂණය කරන ලද පිරිවැය විකුණුම් පිරිවැය දක්වා	2024 මුළු එකතුව	2023 මුළු එකතුව
සෘජු ශ්‍රමය (නිෂ්පාදනය)				
වැටුප් හා වේතන	-	60,503,964	60,503,964	61,502,678
අනියම් සේවක වැටුප්	1,805,555	367,292	2,172,847	2,071,114
ජීවන වියදම් දීමනාව	-	29,349,791	29,349,791	13,424,798
ගමන් වියදම් දිරිදීමනා	-	10,818,071	10,818,071	10,819,138
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18%	4,793,814	13,429,458	18,223,272	14,378,933
අතිකාල	1,374,984	21,164,829	22,539,812	27,571,565
පැමිණීමේ දිරිදීමනාව	10,237,209	-	10,237,209	9,924,274
නිෂ්පාදන දිරිදීමනාව	49,974,971	3,215,035	53,190,006	57,657,883
වාර්ෂික ප්‍රසාද දීමනා	10,197,160	-	10,197,160	3,499,285
වත්මන් සහ අතීත සේවා පිරිවැය	5,523,298	-	5,523,298	4,089,983
සේවක පොළී පිරිවැය	(749,713)	-	(749,713)	554,837
සේවාමුර දිරිදීමනාව	4,422,700	-	4,422,700	4,888,500
සේවක මණ්ඩල වෛද්‍ය වියදම්	6,676,642	-	6,676,642	7,308,208
නිවාස ණය පොළී ප්‍රතිපූරණය	4,060,473	-	4,060,473	4,487,809
වැඩ බැලීමේ දීමනා	570,629	-	570,629	612,000
දුෂ්කර සේවා දීමනාව	5,291,640	-	5,291,640	4,332,780
වෘත්තියවේදී ගාස්තු	132,000	-	132,000	191,898
විශ්‍රාම ප්‍රතිලාභය	276,000	-	276,000	-
මාසික දීමනා	4,096,895	4,837,420	8,934,315	9,320,195
කාර්ය මණ්ඩල පිරිවැය	7,431,634	-	7,431,634	4,181,678
	116,115,891	**143,685,859**	**259,801,749**	**240,817,556**
වක්‍ර නිෂ්පාදන පිරිවැය				
වැටුප් හා වේතන	40,381,371	2,236,918	42,618,289	41,445,201
අනියම් සේවක වැටුප්	4,114,255	-	4,114,255	561,036
ජීවන වියදම් දීමනාව	18,299,596	-	18,299,596	8,117,678
ගමන් වියදම් දිරිදීමනා	7,363,991	-	7,363,991	7,183,955
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18%	12,537,883	-	12,537,883	9,647,989

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

අතිකාල	21,050,119	-	21,050,119	20,711,556
පැමිණීමේ දිරිදීමනාව	9,304,445	-	9,304,445	7,323,021
කාර්යසාධන දිරිදීමනාව	32,469,004	-	32,469,004	35,035,565
වාර්ෂික ප්‍රසාද දීමනා	6,334,438	-	6,334,438	1,721,544
වත්මන් සහ අතීත සේවා පිරිවැය	4,039,711	-	4,039,711	2,800,092
සේවක පොළී පිරිවැය	(540,664)	-	(540,664)	459,519
සේවාමුර දිරිදීමනාව	1,398,300	-	1,398,300	1,487,113
සේවක මණ්ඩල වෛද්‍ය වියදම්	4,683,076	-	4,683,076	4,421,509
නිවාස ණය පොළී ප්‍රතිපූරණය	1,909,273	-	1,909,273	2,355,751
සුපරීක්ෂක දීමනා	108,000	-	108,000	135,968
දුෂ්කර සේවා දීමනාව	2,239,235	-	2,239,235	1,846,860
විශ්‍රාම ප්‍රතිලාභ	260,000	-	260,000	92,000
වෘත්තියවේදී ගාස්තු	323,313	-	323,313	252,484
මාසික දීමනා	5,753,162	-	5,753,162	5,434,993
කාර්ය මණ්ඩල පිරිවැය	4,691,602	-	4,691,602	2,562,245
විශේෂ වැඩ බැලීමේ දීමනාව	-	-	-	69,042
සන්නිවේදන දීමනාව	215,292	-	215,292	187,549
සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමයේ වාරිකය	633,566	10,512,360	11,145,925	8,992,905
කාර්ය මණ්ඩල සුභසාධනය	9,710,947	72,869,769	82,580,715	74,971,734
කාර්ය මණ්ඩල පුහුණුව	7,995,750	-	7,995,750	2,288,901
නිල ඇඳුම් හා පාවහන්	896,158	3,631,405	4,527,563	5,440,428
ජල ගාස්තු	-	9,758,618	9,758,618	6,823,329
වරිපනම් හා බදු	-	1,275,920	1,275,920	1,267,918
විදුලිය	6,265,570	84,449,294	90,714,864	108,626,519
රක්ෂණය - පොදු	-	5,241,297	5,241,297	4,701,487
ආරක්ෂක ගාස්තු - නිෂ්පාදන	7,618,576	-	7,618,576	7,527,444
උපකරණ නඩත්තුව	213,668	4,750,289	4,963,956	6,422,620
නිෂ්පාදන නඩත්තු කටයුතු	230,190	22,164,085	22,394,275	37,692,126
ගොඩනැගිලි නඩත්තු කටයුතු	4,342,286	7,102,854	11,445,140	5,623,091
ක්ෂය	244,703,184	-	244,703,184	215,698,863
ප්‍රවාහන ගාස්තු	525,256	885,735	1,410,991	448,900
අමතර කොටස් පරිභෝජනය	465,883	50,058,363	50,524,246	27,968,748
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය පරිභෝජනය	-	44,482,086	44,482,086	53,313,395
යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු	9,581,486	15,006,029	24,587,515	18,424,559
තත්ත්ව පාලන වියදම්	31,455,449	-	31,455,449	32,972,640
අමුද්‍රව්‍ය විනාශ කිරීමේ පිරිවැය	1,357,161	-	1,357,161	3,285,131
ප්‍රතික්ෂේපිත අමුද්‍රව්‍යවල පිරිවැය	2,352,642	-	2,352,642	1,344,532

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

ප්‍රතික්ෂේපිත ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය	1,036,545	-	1,036,545	1,251,655
ප්‍රතික්ෂේපිත නොනිමි ද්‍රව්‍ය පිරිවැය	20,869,052	-	20,869,052	2,087,653
අමුද්‍රව්‍ය ගැලපුම - සාමාන්‍ය ඖෂධ	(1,628,638)	-	(1,628,638)	(1,118,496)
අමුද්‍රව්‍ය ගැලපුම - පෙනිසිලින් ඖෂධ	312,397	-	312,397	72,499
අමුද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය	(1,498,900)	-	(1,498,900)	(905,325)
ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය	(1,856,429)	-	(1,856,429)	(2,537,976)
ඇසුරුම් ද්‍රව්‍ය ගැලපුම	248,175	-	248,175	(14,561)
තොග සත්‍යාපන ගැලපුම - නඩත්තු	81,946	-	81,946	(56,894)
නොනිමි ද්‍රව්‍ය ගැලපුම - තොග සත්‍යාපනය	968,107	-	968,107	(22,704)
විකුණුම් පිරිවැය - ඉන්වොයිසි විචලනය	3,229,540	-	3,229,540	10,019,179
	643,160,857	**478,110,879**	**1,121,271,736**	**1,027,280,526**

සටහන - 3

	2024	2023
වෙනත් මෙහෙයුම් ආදායම්		
විවිධ ආදායම්	11,353,816	13,993,363
ආදායම් - ප්‍රදාන	26,901,955	-
අමුද්‍රව්‍ය විකුණුම්	332,442	102,973
	38,588,212	**14,096,336**

සටහන - 3 (අ)

විවිධ ආදායම්		
ඉවතලන විකුණුම්	4,610,222	7,211,381
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	883,000	729,000
ටෙන්ඩර් ලේඛන ගාස්තුව	4,697,350	3,058,630
ණයහිමියාගේ ශේෂය සහ ලංසු බැඳුම්කර ගෙවිය යුතු ශේෂය කපා හැරීම	-	1,972,769
පොදු	1,163,243	1,021,583
	11,353,816	**13,993,363**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 4	2024	2023
පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	43,200,362	43,850,364
අනියම් සේවක වැටුප්	2,526,899	1,351,040
ජීවන වියදම් දීමනාව	17,268,252	7,995,465
ගමන් වියදම් දිරිදීමනා	13,598,224	15,346,579
සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් ගෙවීම් - 18%	11,407,027	9,273,844
අතිකාල	17,412,126	17,499,593
පැමිණීමේ දිරිදීමනාව	8,387,569	7,097,780
නිෂ්පාදන දිරිදීමනාව	31,187,732	33,207,773
වාර්ෂික ප්‍රසාද දීමනා	5,834,500	1,581,025
වත්මන් සහ අතීත සේවා පිරිවැය	3,848,021	3,054,017
සේවක පොළී පිරිවැය	(602,120)	491,627
සේවාමුර දිරිදීමනාව	615,400	582,800
කාර්ය මණ්ඩල පිරිවැය	4,345,881	2,462,722
සේවක මණ්ඩල වෛද්‍ය වියදම්	5,977,738	4,677,774
නිවාස ණය පොළී ප්‍රතිපූරණය	3,499,898	3,767,121
වැඩ බැලීමේ දීමනා	285,968	300,000
දුෂ්කර සේවා දීමනාව	729,285	542,190
වෘත්තියවේදී ගාස්තු	904,782	1,060,073
විශේෂ වැඩ බැලීමේ දීමනාව	1,183,479	1,058,360
මාසික දීමනා	5,281,932	5,524,211
පාරිතෝෂික දීමනා	360,000	472,000
දුරකථන බිල්පත් ප්‍රතිපූරණය	456,498	523,508
සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය	4,056,913	3,591,617
කාර්ය මණ්ඩල සුභසාධනය	28,296,729	25,983,258
කාර්ය මණ්ඩල පුහුණුව	1,545,231	748,156
නිල ඇඳුම් හා පාවහන්	1,081,407	1,432,006
ගමන් වියදම් - විදේශ	-	666,722
අධ්‍යක්ෂ ගාස්තු	296,000	320,000
වෙනත් දිරිදීමනා	5,631,800	7,167,800
වරිපනම් හා බදු	545,068	545,146
විදුලිය	28,550,974	32,908,839
ජල ගාස්තු	3,315,649	2,858,135
රක්ෂණය - පොදු	730,041	822,547
රක්ෂණය - වාහන	361,911	331,248

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව	13,698,978	10,425,767
වාහන සඳහා ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	13,433,062	15,011,119
උපකරණ නඩත්තුව	3,136,818	1,979,551
නඩත්තු පරිපාලන	7,528,263	6,775,809
ගොඩනැගිලි නඩත්තු කටයුතු	2,148,410	294,109
ක්ෂය	43,375,091	42,621,535
ප්‍රවාහන ගාස්තු	1,718,651	921,243
තැපැල් හා ෆැක්ස් ගාස්තු	1,504,372	911,268
දුරකථන ගාස්තු	1,069,521	1,118,724
ආරක්ෂක ගාස්තු	3,894,395	2,166,244
පරිත්‍යාග	709,415	392,950
බලපත්‍ර ගාස්තු - මෝටර් වාහන	132,341	124,934
බලපත්‍ර ගාස්තු - ඖෂධ	7,539,777	7,749,877
බලපත්‍ර ගාස්තු - වෙනත්	344,628	354,568
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	11,356,947	10,589,662
කාර්යාල වියදම්	2,528,546	2,203,723
විගණන ගාස්තුව	2,300,000	1,955,400
කුලී ගාස්තු	30,775,599	41,796,482
ප්‍රචාරක දැන්වීම්	5,616,165	5,869,241
වෙළඳ දායකත්වයන් හා වාර සඟරා	144,920	123,420
නීති හා පරීක්ෂණ වියදම්	520,000	-
වෘත්තීයවේදී ගාස්තු	5,230,802	324,129
සංග්‍රහ වියදම්	2,906,796	2,377,011
වාර්ෂික දායකත්වයන්	173,000	74,635
මුද්දර ගාස්තු	55,975	62,600
හානි වූ හා අභාවිත ද්‍රව්‍ය පිරිවැය	4,651,566	956,432
ලිපි ද්‍රව්‍ය ගැලපුම්- තොග සත්‍යාපනය	2,414	-
	418,617,627	**396,275,773**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 05	2024	2023
අලෙවි හා බෙදාහැරීම් වියදම්		
ප්‍රවර්ධන වට්ටම්	78,005,017	132,015,605
විකුණුම් ප්‍රවර්ධන වියදම්	4,397,045	4,093,499
ප්‍රතික්ෂේප කරන ලද නිමි භාණ්ඩවල පිරිවැය	2,521,736	-
අඩමාණ ණය	4,806,807	800,926,792
නිමි භාණ්ඩ ගැලපීම-තොග සත්‍යාපනය	(2,793,859)	-
	86,936,746	**937,035,896**

සටහන - 06	2024	2023
වෙනත් මෙහෙයුම් වියදම්		
සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන වියදම්	12,670,936	22,112,506
තොග ගණන් ගැනීමේ ගැලපුම් - පර්යේෂණ හා සංවර්ධන වියදම්	426,163	6,459
බැහැර කිරීමේ අලාභ	429,134	167,416
	13,526,232	**22,286,381**

සටහන - 07	2024	2023
මූල්‍ය වියදම්		
බැංකු ගාස්තු	714,558	562,502
අයිරා පොළිය	36,970	52,984
විනිමය අලාභ	24,264,412	56,873,126
	25,015,940	**57,488,612**

සටහන - 08	2024	2023
මූල්‍ය ආදායම		
කාර්ය මණ්ඩල ණය පොළිය	2,313,600	2,314,357
භාණ්ඩාගාර බිල්පත් පොළිය	587,396,153	611,027,968
පොළී ආදායම - කාර්යමණ්ඩල ණය	16,469,116	9,206,645
	606,178,870	**622,548,970**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 09		2024	2023
ආදායම් බදු වියදම			
වත්මන් බදු වියදම	සටහන 09 (අ)	954,145,027	826,482,763
විලම්බිත බදු වියදම	සටහන 09 (ආ) (i)	(27,171,036)	(171,729,964)
		926,973,991	**654,752,798**

සටහන - 09 (අ)		2024	2023
වත්මන් බදු වියදම			
වර්ෂයේ ලාභය මත බදු	සටහන 09 (අ) (i)	954,525,578	828,511,769
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන වැඩි / අඩු		-	-
සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභයේ ආදායම් බද්ද		(380,552)	(2,029,006)
		954,145,027	**826,482,763**

සටහන - 09 (අ) (i)	2024	2023
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	3,083,004,066	2,173,308,106
(-) වෙළෙඳ කටයුතු ලාභයේ කොටසක් නොවන ආදායම		
භාණ්ඩාගාර බිල්පත් මත පොලිය	(612,361,354)	(639,290,509)
වෙළෙඳ කටයුතුවලින් ශුද්ධ ලාභය	2,470,642,712	1,534,017,597
(+) ඉඩ නොදෙන වියදම්	337,983,154	1,101,800,822
(-) ඉඩ දෙන වියදම්	(240,673,972)	(520,312,387)
(+) දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත ලාභය	170,175	146,003
බදු අය කළ හැකි ආදායම	**2,568,122,069**	**2,115,652,035**
මෙහෙයුම් ආදායම් මත බදු අනුපාතිකය	30%	30%
පොළී ආදායම් මත බදු අනුපිතිකය	30%	30%

මෙහෙයුම් ආදායම් මත ආදායම් බද්ද	30%	2,568,122,069	770,436,621	30%	2,115,652,035	634,695,611
පොළී මත ආදායම් බද්ද	30%	613,629,859	184,088,958	30%	646,053,861	193,816,158
මුළු ආදායම් බද්ද			**954,525,578**			**828,511,769**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 09 (ආ)

විලම්බිත බදු		2024		2023
වර්ෂයට අදාළ විලම්බිත බද්ද හඳුනාගත් / (ලියාහල)	තාවකාලික වෙනස		තාවකාලික වෙනස	
විලම්බිත බදු බැරකම මත විලම්බිත බදු සටහන 09 'ආ' (vi)	2,512,483,689	753,745,107	2,589,133,750	776,740,125
විලම්බිත බදු වත්කම් මත විලම්බිත බදු සටහන 09 'ආ' (vii)	(1,327,915,718)	(398,374,715)	(1,290,827,046)	(387,248,114)
වර්ෂය අවසානයේදී විලම්බිත බදු බැරකම		355,370,391		389,492,011
වර්ෂය ආරම්භයේදී විලම්බිත බදු බැරකම		389,492,011		557,467,909
වර්ෂය තුළ හඳුනාගත් / (ලියාහල) විලම්බිත බදු		**(34,121,620)**		**(167,975,899)**

සටහන 09 (ආ) (i)

විලම්බිත බදු ගැලපුම	2024	2023
ලාභාලාභ ගිණුමට අයගත කළා - සටහන 9 ආ (ii)	(27,171,036)	(171,729,964)
වෙනත් විස්තීර්ණ ආදායමට අයගත කළා - සටහන 9 ආ (iii)	(6,950,584)	3,754,066
	(34,121,620)	**(167,975,898)**

සටහන 9 ආ (ii)

ලාභාලාභ ගිණුමට අයගත කළ විලම්බිත බදු ගැළපුම		2024	2023
තාවකාලික වෙනස්කම්වල උත්පාදනය හා ප්‍රත්‍යාවර්තනය	සටහන 9 ආ (iv)	(27,171,036)	(171,729,964)
බදු අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ආරම්භක විලම්බිත බදු බැඳියාවලට ගැළපුම්	සටහන 9 ආ (v)	-	-
		(27,171,036)	**(171,729,964)**

සටහන 9 ආ (iii)

වෙනත් විස්තීර්ණ ආදායමට අයගත කළ විලම්බිත බදු ගැළපුම	2024	2023
දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගනිත අතිරික්තයට ආරෝපණය කළ හැකි විලම්බිත බදු	-	-
සේවක ප්‍රතිලාභ බැඳියා සඳහා වන ප්‍රතිපාදනවල ආයු ගණක (ලාභය) /අලාභය මත බද්ද	(6,950,584)	3,754,066
	(6,950,584)	3,754,066
මුළු විලම්බිත බදු ගැළපුම	**(34,121,620)**	**(167,975,898)**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන 9 ආ (iv)	2024	2023
තාවකාලික වෙනස්කම්වල උත්පාදනයට හා ප්‍රත්‍යාවර්තනයට අදාළ විලම්බිත බදු වියදම/(ආදායම)		
වර්ෂය සඳහා මුළු ශුද්ධ විලම්බිත බද්ද	355,370,391	389,492,011
(-) ආරම්භක විලම්බිත බදු බැඳියාව	(389,492,011)	(557,467,909)
බදු අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ආරම්භක විලම්බිත බදු බැඳියාවලට ගැළපුම්	-	-
සේවක ප්‍රතිලාභ බැඳියා සඳහා වන ප්‍රතිපාදනවල ආයු ගණක (ලාභය) /අලාභය මත බද්ද	6,950,584	(3,754,066)
	(27,171,036)	**(171,729,964)**

සටහන 9 ආ (v)	2024	2023
බදු අනුපාතිකය වැඩිවීම හේතුවෙන් ආරම්භක විලම්බිත බදු බැඳියාවලට ගැළපුම්		
ආරම්භයේ දී ශුද්ධ තාවකාලික වෙනස	1,298,306,703	2,170,644,282
ආරම්භක විලම්බිත බදු බැඳියාවට ගැළපුම්	-	-

සටහන 9 ආ (vi)

විලම්බිත බදු වත්කම්

	2024		2023	
තාවකාලික වෙනස්කම්වල ආකාර	**තාවකාලික වෙනස්කම්**	**බදු බලපෑම 30%**	**තාවකාලික වෙනස්කම්**	**බදු බලපෑම 30%**
බදු කාර්යයන් සඳහා දේපළ, පිරියත හා උපකරණවල කඩිනම් ක්ෂය	2,512,483,689	753,745,107	2,589,133,750	776,740,125
ශුද්ධ විලම්බිත බදු බැඳියාව		**753,745,107**		**776,740,125**

සටහන 9 ආ (vii)

	2024		2023	
විලම්බිත බදු බැඳියාව තාවකාලික වෙනස්කම්වල ආකාර	**තාවකාලික වෙනස්කම්**	**බදු බලපෑම 30%**	**තාවකාලික වෙනස්කම්**	**බදු බලපෑම 30%**
ගෙවනු ලබන විට පමණක් බදු කාර්යයන් සඳහා අඩු කරනු ලබන සේවක ප්‍රතිලාභ වගකීම්	(211,944,243)	(63,583,273)	(177,482,336)	(53,244,701)
අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	(1,115,639,437)	(334,691,831)	(1,113,344,710)	(334,003,413)
විදේශ විනිමය පාඩුව - උපලබ්ධි නොවූ	(332,038)	(99,611)		-
ශුද්ධ විලම්බිත බදු වත්කම්		**(398,374,715)**		**(387,248,114)**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

10 සටහන

දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්

පිරිවැය

2024

විස්තරය	2024.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම	2024.12.31 දිනට ශේෂය	හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12)	හානි වූ හා අභාවිත ගැලපූ පසු 2024.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්						
භූමි අලංකරණ වියදම්	6,113,388	-	-	6,113,388	-	6,113,388
ඉඩම්	49,471,918	-	-	49,471,918	-	49,471,918
ගොඩනැගිලි	1,391,070,033	18,050,990	-	1,409,121,023	-	1,409,121,023
පිරියත හා යන්ත්‍ර	2,677,578,644	109,961,778	-	2,787,040,422	(6,288,349)	2,780,752,073
මෝටර් වාහන	63,450,000	-	(500,000)	63,450,000	-	63,450,000
යතුරුපැදි	185,000	-	-	185,000	-	185,000
උපකරණ	257,581,191	41,372,786	-	298,613,477	(3,982,571)	294,630,906
පරිගණක උපාංග	28,008,254	12,286,801	(340,500)	39,376,005	(281,600)	39,094,405
ලී බඩු හා සවිකිරීම්	31,081,453	3,815,510	(919,050)	34,894,463	(495,304)	34,399,159
පාපැදි හා කරත්ත	3,364,532	-	(2,500)	3,364,532	-	3,364,532
මෙවලම්	3,458,825	-	-	3,458,825	(6,750)	3,452,075
වාහන නවත්වන ගොඩනැගිලි	3,200,000	-	-	3,200,000	-	3,200,000
එකතුව	**4,514,563,238**	**185,487,865**	**(1,762,050)**	**4,698,289,054**	**(11,054,574)**	**4,687,234,480**

ක්ෂය

විස්තරය	2024.01.01දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීමට අදාළ සමුච්චිත ක්ෂය	හානි වූ හා අභාවිත ගැලපුම්	2024.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්					
භූමි අලංකරණ වියදම්	2,283,742	60,788	-	-	2,344,530
ඉඩම්	-	-	-	-	-
ගොඩනැගිලි	115,995,325	70,096,052	-	-	186,091,377
පිරියත හා යන්ත්‍ර	294,569,067	164,442,961	(123,858)	(1,286,759)	457,601,411
මෝටර් වාහන	24,102,619	8,856,865	-	-	32,959,484
යතුරුපැදි	52,857	26,429	-	-	79,286
උපකරණ	51,698,755	28,744,831	(185,913)	(1,455,378)	78,802,295
පරිගණක උපාංග	11,673,099	5,870,106	(651,476)	(117,744)	16,773,985
ලී බඩු හා සවිකිරීම්	6,169,124	3,786,679	-	(34,821)	9,920,982
පාපැදි හා කරත්ත	611,972	327,416	-	-	939,388
මෙවලම්	1,163,277	543,333	-	-	1,706,610
වාහන නවත්වන ගොඩනැගිලි	533,333	266,667	-	-	800,000
එකතුව	**508,853,170**	**283,022,129**	**(961,247)**	**(2,894,702)**	**788,019,350**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

පිරිවැය 2023

විස්තරය	2023.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම	2023.12.31 දිනට ශේෂය	හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 12)	හානි වූ හා අභාවිත ගැලපූ පසු 2023.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්						
භූමි අලංකරණ වියදම්	6,113,388	-	-	6,113,388	-	6,113,388
ඉඩම්	49,471,918	-	-	49,471,918	-	49,471,918
ගොඩනැගිලි	1,160,828,144	230,241,889	-	1,391,070,033	-	1,391,070,033
පිරියත හා යන්ත්‍ර	2,379,662,018	297,916,626	-	2,677,578,644	(1,116,600)	2,676,462,044
මෝටර් වාහන	63,450,000	-	-	63,450,000	-	63,450,000
යතුරුපැදි	185,000	-	-	185,000	-	185,000
උපකරණ	196,048,090	61,533,101	-	257,581,191	(1,853,119)	255,728,072
පරිගණක උපාංග	23,222,901	5,318,203	(532,850)	28,008,254	(181,800)	27,826,454
ලී බඩු හා සවිකිරීම්	26,788,750	4,292,703	-	31,081,453	(439,737)	30,641,716
පාපැදි හා කරත්ත	3,364,532	-	-	3,364,532	-	3,364,532
මෙවලම්	3,458,825	-	-	3,458,825	(6,750)	3,452,075
වාහන නවත්වන ගොඩනැගිලි	3,200,000	-	-	3,200,000	-	3,200,000
එකතුව	**3,915,793,566**	**599,302,522**	**(532,850)**	**4,514,563,238**	**(3,598,006)**	**4,510,965,232**

ක්ෂය

විස්තරය	2023.01.01දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීමට අදාල සමුච්චිත ක්ෂය	හානි වූ හා අභාවිත ගැලපුම්	2023.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්					
භූමි අලංකරණ වියදම්	2,222,954	60,788	-	-	2,283,742
ඉඩම්	-	-	-	-	-
ගොඩනැගිලි	57,873,263	58,122,062	-	-	115,995,325
පිරියත හා යන්ත්‍ර	150,103,957	144,630,442	-	(165,332)	294,569,067
මෝටර් වාහන	12,051,310	12,051,309	-	-	24,102,619
යතුරුපැදි	26,429	26,428	-	-	52,857
උපකරණ	25,845,610	26,916,977	-	(1,063,832)	51,698,755
පරිගණක උපාංග	6,011,517	6,049,989	(240,606)	(147,801)	11,673,099
ලී බඩු හා සවිකිරීම්	2,905,431	3,327,202	-	(63,509)	6,169,124
පාපැදි හා කරත්ත	284,556	327,416	-	-	611,972
මෙවලම්	599,744	563,533	-	-	1,163,277
වාහන නවත්වන ගොඩනැගිලි	266,667	266,666	-	-	533,333
එකතුව	**258,191,438**	**252,342,812**	**(240,606)**	**(1,440,474)**	**508,853,170**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

10 සටහන

දේපළ, පිරියත හා උපකරණ - ක්ෂය වන වත්කම්

ලියාහල අගය **2024**

විස්තරය	2024.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්	
භූමි අලංකරණ වියදම්	3,768,858
ඉඩම්	49,471,918
ගොඩනැගිලි	1,223,029,646
පිරියත හා යන්ත්‍ර	2,323,150,662
මෝටර් වාහන	30,490,516
යතුරුපැදි	105,714
උපකරණ	215,828,611
පරිගණක උපාංග	22,320,420
ලී බඩු හා සවිකිරීම්	24,478,177
පාපැදි හා කරත්ත	2,425,144
මෙවලම්	1,745,464
වාහන නවත්වන ගොඩනැගිලි	2,400,000
එකතුව	**3,899,215,130**

ලියාහල අගය **2023**

විස්තරය	2023.12.31 දිනට ශේෂය
ක්ෂය වන වත්කම්	
භූමි අලංකරණ වියදම්	3,829,646
ඉඩම්	49,471,918
ගොඩනැගිලි	1,275,074,708
පිරියත හා යන්ත්‍ර	2,381,892,977
මෝටර් වාහන	39,347,381
යතුරුපැදි	132,143
උපකරණ	204,029,317
පරිගණක උපාංග	16,153,355
ලී බඩු හා සවිකිරීම්	24,472,592
පාපැදි හා කරත්ත	2,752,560
මෙවලම්	2,288,798
වාහන නවත්වන ගොඩනැගිලි	2,666,667
එකතුව	**4,002,112,062**

11 සටහන අස්පෘශ්‍ය වත්කම්

2024

පිරිවැය

විස්තරය	2024.01.01 දිනට පිරිවැය / ප්‍රත්‍යාගණිත අගය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම්	2024.12.31 දිනට ශේෂය	හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 2 අ)	හානි වූ හා අභාවිත ගැලපූ පසු 2024.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	10,777,455	780,375	(71,000)	11,486,830	-	11,486,830
එකතුව	**10,777,455**	**780,375**	**(71,000)**	**11,486,830**	-	**11,486,830**

ක්ෂය

විස්තරය	2024.01.01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීමට අදාල සමුච්චිත ක්ෂය	හානි වූ හා අභාවිත ගැලපුම්	2024.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	5,289,015	1,750,525	(48,836)	-	6,990,704
එකතුව	**5,289,015**	**1,750,525**	**(48,836)**	-	**6,990,704**

ලියාහල අගය

විස්තරය	2024.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	4,496,126
එකතුව	**4,496,126**

2023

විස්තරය	2023.01.01 දිනට පිරිවැය / ප්‍රත්‍යාගණිත අගය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම්	2023.12.31 දිනට ශේෂය	හානි වූ හා අභාවිත ගැලපුම් (සටහන 2 අ)	හානි වූ හා අභාවිත ගැලපූ පසු 2023.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	8,935,842	1,949,113	(107,500)	10,777,455	-	10,777,455
එකතුව	**8,935,842**	**1,949,113**	**(107,500)**	**10,777,455**	-	**10,777,455**

ක්ෂය

විස්තරය	2023.01.01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීමට අදාල සමුච්චිත ක්ෂය	හානි වූ හා අභාවිත ගැලපුම්	2023.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	2,677,379	2,671,961	(60,325)	-	5,289,015
එකතුව	**2,677,379**	**2,671,961**	**(60,325)**	-	**5,289,015**

ලියාහල අගය

විස්තරය	2023.12.31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	5,488,440
එකතුව	**5,488,440**

12 සටහන

හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය ගැලපුම්

විස්තරය	2024.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය	වර්ෂය තුළ විකිණීම්	2024.12.31 දිනට ශේෂය
පිරියත හා යන්ත්‍ර	1,116,600	5,171,749	-	6,288,349
උපකරණ	1,853,119	2,156,952	(27,500)	3,982,571
පරිගණක උපාංග	181,800	162,000	(62,200)	281,600
ලී බඩු හා සවිකිරීම්	439,737	55,567	-	495,304
මෙවලම්	6,750	-	-	6,750
පරිගණක මෘදුකාංග	-	-	-	-
එකතුව	**3,598,006**	**7,546,268**	**(89,700)**	**11,054,574**

විස්තරය	2023.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ හඳුනාගත් හානි වූ සහ අභාවිත ද්‍රව්‍ය	වර්ෂය තුළ විකිණීම්	වසර තුළ නැවත භාවිතා කිරීම	2023.12.31 දිනට ශේෂය
පිරියත හා යන්ත්‍ර	724,250	392,350	-	-	1,116,600
උපකරණ	388,117	1,465,002	-	-	1,853,119
පරිගණක උපාංග	14,600	167,200	-	-	181,800
ලී බඩු හා සවිකිරීම්	67,382	372,355	-	-	439,737
මෙවලම්	6,750	-	-	-	6,750
පරිගණක මෘදුකාංග	-	-	-	-	-
එකතුව	**1,201,099**	**2,396,907**	-	-	**3,598,006**

සටහන 13

පෙර ගෙවූ කල් බදු

පිරිවැය

2024

විස්තරය	2024.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම්	2024.12.31 දිනට පිරිවැය
බදු ඉඩම්	327,327,643	-	-	327,327,643
එකතුව	**327,327,643**	-	-	**327,327,643**

ක්ෂය

විස්තරය	2024.01.01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීම් සඳහා සමුච්චිත ක්ෂය	2024.12.31 දිනට ශේෂය
බදු ඉඩම්	8,249,680	3,305,623	-	11,555,303
එකතුව	**8,249,680**	**3,305,623**	-	**11,555,303**

ලියාහල අගය

විස්තරය	2024.12.31 දිනට ශේෂය
බදු ඉඩම්	315,772,340
එකතුව	**315,772,340**

පිරිවැය

2023

විස්තරය	2023.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුළ විකිණීම්	2023.12.31 දිනට පිරිවැය
බදු ඉඩම්	327,327,643	-	-	327,327,643
එකතුව	**327,327,643**	-	-	**327,327,643**

ක්ෂය

විස්තරය	2023.01.01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය සඳහා ක්ෂය	විකිණීම් සඳහා සමුච්චිත ක්ෂය	2023.12.31 දිනට ශේෂය
බදු ඉඩම්	4,944,057	3,305,623	-	8,249,680
එකතුව	**4,944,057**	**3,305,623**	-	**8,249,680**

ලියාහල අගය

විස්තරය	2023.12.31 දිනට ශේෂය
බදු ඉඩම්	319,077,963
එකතුව	**319,077,963**

වසර 99 ක ඉඩම් බද්ද

රාජ්‍ය ඖෂධ සංස්ථාව 1981.09.11 දින නාගරික සංවර්ධන අධිකාරියෙන් අවුරුදු 99 ක බද්දකට ඉඩමක් ලබාගෙන තිබුණි. මෙම ඉඩමෙන් අක්කර 3 යි රූඩ් 3 යි පර්චස් 8.29 ක භූමි ප්‍රමාණයක් කර්මාන්ත ශාලාවක් පිහිටුවීම සඳහා 1984.06.29 දිනැති අංක 60 දරන බදු ගිවිසුමක් හරහා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට වෙන් කරන ලදී. අදාළ බදු මුදලින් කොටසක් ඒ වන විට රාජ්‍ය ඖෂධ සංස්ථාවට ගෙවා තිබුණි, ඉඩම වෙන් කරන ලද අතර බදු ඉඩම අත්පත් කර ගැනීම සිදුවෙමින් පවතී. අවුරුදු 99 ක බදු කාලය තුළ බදු මුදල සරල මාර්ගික පදනමක් මත ගිණුම්ගත කර ඇත.

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 14

වෙනත් ජංගම නොවන වත්කම්	2024	2023
තැන්පතු	5,906,360	6,397,360
ආරක්ෂක තැන්පතු	458,973	421,476
	6,365,333	**6,818,836**

සටහන - 15

තොග	2024	2023
අමුද්‍රව්‍ය	1,856,288,021	2,267,953,484
ඇසුරුම් ද්‍රව්‍ය	264,752,480	247,821,565
නිමි භාණ්ඩ	1,322,020,581	975,563,478
නොනිමි වැඩ	251,177,281	140,495,164
මාර්ගස්ථ තොග - අමුද්‍රව්‍ය	124,328,349	6,870,851
තොග - සංයෝජන, පර්යේෂණ හා සංවර්ධන	23,348,477	26,414,306
පිරියත හා යන්ත්‍ර අමතර කොටස්	247,419,422	216,624,072
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	4,610,371	4,931,857
ලිපිද්‍රව්‍ය තොග	4,478,607	4,014,966
තොග පාලනය - ණය දීමනා	13,983,400	20,691,867
	4,112,406,987	**3,911,381,608**

සටහන - 16

වෙළඳ ණයගැතියෝ සහ අයවිය යුතු දේ		2024		2023
ණයගැතියෝ - රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	2,030,400		3,780,000	
(-) අඩමාණ ණය සඳහා වෙන් කිරීම	-	2,030,400	(3,780,000)	-
ණයගැතියෝ - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	2,885,941,368		2,378,686,753	
(-) අඩමාණ ණය සඳහා වෙන් කිරීම	(1,115,639,437)	1,770,301,931	(1,108,484,710)	1,270,202,043
ණයගැතියෝ - බෙදාහැරීම්	166,710,560		166,083,051	
(-)අඩමාණ ණය සඳහා වෙන් කිරීම	-	166,710,560	(1,080,000)	165,003,051
ආපදා ණය		57,235,143		55,245,938
අයවිය යුතු දේ		125,757,864		118,741,956
පාපැදි ණය		10,742,191		10,456,982
ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බදු		1,128,599		979,329
උත්සව අත්තිකාරම්		1,499,000		1,492,500
ආනයන තැන්පතු ආපසු ලැබීම්		645,000		762,000
		2,136,050,687		**1,622,883,799**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 17

පූර්ව ගෙවීම්	2024	2023
අත්තිකාරම් ගෙවීම්	1,422,044	3,822,429
අත්තිකාරම් ගෙවීම් - යන්ත්‍ර සූත්‍ර සහ අමතර කොටස්	32,078,710	19,444,864
පූර්ව ගෙවීම්	6,607,683	7,818,969
කාර්යමණ්ඩලයට කළ පූර්ව ගෙවීම්වල පිරිවැය	7,297,838	11,533,141
	47,406,275	**42,619,403**

සටහන - 18

වෙනත් මූල්‍ය වත්කම්	2024	2023
භාණ්ඩාගාර බිල්පත්	8,193,471,634	5,974,554,359
	8,193,471,634	**5,974,554,359**

භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය

REPO වර්ගීකරණය කර ඇත්තේ ක්ෂය කරන පිරිවැයට මනිනු ලබන ජංගම වත්කම් ලෙසය. ණය අවදානමට නිරාවරණය වීම සීමා කිරීම සඳහා සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රජයේ බැංකු (ලංකා බැංකුව,මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව) සමග පමණක් REPO පවත්වාගෙන යනු ලබයි.

සටහන - 19

අත ඇති හා බැංකුවේ ඇති මුදල්	2024	2023
ලංකා බැංකුව - රත්මලාන ශාඛාව	149,855	18,550
ලංකා බැංකුව - ආයතනික ශාඛාව	288,586	2,173,504
මහජන බැංකුව - රත්මලාන ශාඛාව	136,565	136,565
මහජන බැංකුව - ආයතනික ශාඛාව	87,349	48,435
ඩොලර් ආන්තිකය - ලංකා බැංකුව,ආයතනික ශාඛාව	-	466,399,254
අතැති මුදල්	100,000	100,000
සුළු මුදල්	20,000	20,000
	782,355	**468,896,309**

සටහන - 20

ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය , ජපන් යෙන් මිලියන 2,564 ක හුවමාරු වටිනාකම වූ රු. 0.186 බැගින් රු.476,904,000.00ක ජපන් ප්‍රදානයකින්, මහා භාණ්ඩාගාර ප්‍රදානයක් වූ රු. 208,375,000.00ක් සහ රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනයක් වූ රු. 2,416,094,044.00 ක් මෙන්ම රු. 4,800,000.00 ක් වටිනා රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් පවරන ලද ඉඩමකින් සමන්විත වේ.

සටහන - 21 (අ)

ලෝක බැංකුවේ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය

2023 මැයි මස 7 වන දින අනුමත කරන ලද මෙම ව්‍යාපෘතිය, වෙනම ප්‍රසම්පාදන දෙකක් හරහා ක්‍රියාත්මක කර ඇත. පළමු ටෙන්ඩරය ඖෂධ නිෂ්පාදන කලාපය අත්පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. 2023 වර්ෂය සඳහා අදාළ මුදල් ප්‍රමාණයන් සමඟ පහත සඳහන් යන්ත්‍රෝපකරණ කාණ්ඩ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ප්‍රාග්ධනීකරණයට හසු කරන ලද අතර දෙවන ටෙන්ඩරය, දැනට පවත්නා පෙනිසිලින් ඖෂධය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලදී.

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	වටිනාකම (රු)
මිශ්‍ර කිරීමේ යන්ත්‍රය	17,510,835
බෙහෙත් කරල් පිරවීමේ යන්ත්‍රය	53,961,607
කුඩා බෝතල තොග ඇසුරුම් කිරීමේ පේළි යන්ත්‍රය	77,421,689
බෙහෙත් පෙති සම්පීඩක යන්ත්‍රය	56,357,730
බුබුලු ඇසුරුම් යන්ත්‍රය සහ කුඩා පෙට්ටි ඇසුරුම් යන්ත්‍රය (Blister Packaging Machine with Carton Packing)	35,897,384
පෙනිසිලින් ඖෂධ කලාපය පිළිසකර කිරීම	196,997,091
	438,146,336

ප්‍රදාන ක්ෂය කිරීම විස්තරය	2024.01.01 දිනට ශේෂය (රු.)	වර්ෂය තුළ ක්‍රමක්ෂය (රු.)	2024.12.31 දිනට ශේෂය (රු.)
මිශ්‍ර කිරීමේ යන්ත්‍රය	17,510,835	1,167,389	16,343,446
බෙහෙත් කරල් පිරවීමේ යන්ත්‍රය	53,961,607	3,597,440	50,364,167
කුඩා බෝතල තොග ඇසුරුම් කිරීමේ පේළි යන්ත්‍රය	77,421,689	5,161,446	72,260,243
බෙහෙත් පෙති සම්පීඩක යන්ත්‍රය	56,357,730	3,757,182	52,600,548
කපු ඇසුරුම් සහිත බෙහෙත් බුබුළු ඇසුරුම් කිරීමේ යන්ත්‍රය	35,897,384	1,794,869	34,102,515
පෙනිසිලින් ඖෂධ කලාපය පිළිසකර කිරීම	196,997,091	9,849,855	187,147,236
	438,146,336	**25,328,181**	**412,818,155**

සටහන - 21 (ආ)

ආසියානු සංවර්ධන බැංකුව - බලශක්ති කාර්යක්ෂම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය

ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරියේ අධීක්ෂණය යටතේ බලශක්ති කාර්යක්ෂමතාව සඳහා මධ්‍යගත වායු සමීකරණ පද්ධති ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව නියමු ව්‍යාපෘතියක් ලෙස අරමුදල් සපයා ඇත.

ප්‍රදාන ක්ෂය කිරීම විස්තරය	2024.01.01 දිනට ශේෂය (රු.)	වසර තුළ ලැබුණු ප්‍රදාන (රු.)	වර්ෂය තුළ ක්ෂය වීම (රු.)	2024.12.31 දිනට ශේෂය (රු.)
බලශක්ති කාර්යක්ෂම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය	-	31,446,753	1,573,774	29,872,980
	-	**31,446,753**	**1,573,774**	**29,872,980**

සටහන - 22

	2024	2023
ශුද්ධ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව		
නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගය	211,944,243	177,482,336
සැලසුම් වත්කමේ සාධාරණ අගය	(218,273,714)	(192,040,008)
ශුද්ධ විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව	**(6,329,471)**	**(14,557,672)**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 22

	2024	2023
විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවේ සංචලනය		
ජනවාරි මස 01 වන දිනට ශේෂය	177,482,336	165,380,683
කාල සීමාව සඳහා පොලී පිරිවැය	23,072,704	29,768,523
කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය	13,411,030	9944092
කාල සීමාව තුළ ගෙවන ලද / ගෙවිය යුතු පාරිතෝෂිකය	(25,190,440)	(15,097,410)
නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගයෙහි ආයු ගණක (ලාභය) / අලාභය	23,168,613	(12,513,552)
දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**211,944,243**	**177,482,336**

	2024	2023
සැලසුම් වත්කම් සංචලනය		
ජනවාරි මස 01 වන දිනට සැලසුම් වත්කම්වල අගය	192,040,008	157,014,115
සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභය	24,965,201	28,262,541
සැලසුම් වත්කම් විෂයයෙහි ගෙවන ලද දායකත්වය	-	-
සැලසුම් වත්කම් මගින් ගෙවන ලද ප්‍රතිලාභ	-	-
සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභය / (අලාභය)	1,268,505	6,763,352
දෙසැම්බර් 31 වන දිනට සැලසුම් වත්කම්වල අගය	**218,273,714**	**192,040,008**

	2024	2023
සැලසුම් වත්කම් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.		
ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	218,273,714	192,040,008
	218,273,714	**192,040,008**

	2024	2023
ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇති මුදල		
වත්මන් සහ අතීත සේවා පිරිවැය	13,411,030	9,944,092
පොලී පිරිවැය	23,072,704	29,768,523
සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභය	(24,965,201)	(28,262,541)
ශුද්ධ මුදල	**11,518,533**	**11,450,074**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	2024	2023
වෙනත් විස්තිරණ ආදායම් තුළ හඳුනා ගෙන ඇති මුදල		
නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගය මත ආයු ගණක ලාභය / (අලාභය)	(23,168,613)	12,513,552
සැලසුම් වත්කම් මත ආයු ගණක ලාභය / (අලාභය)	1,268,505	6,763,352
එකතුව	**(21,900,108)**	**19,276,904**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ආයු ගණක උපකල්පන පිළිබඳ විස්තර පහත දැක්වේ.

	31.12.2024 දිනට	31.12.2023 දිනට
ආයු ගණක උපකල්පන		
වට්ටම් අනුපාතිකය	11.00 %	13.00 %
අනාගත වැටුප් වැඩිවීම්	9.00 %	11.00 %
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතිකය	4.00 %	2.00 %

ආයු ගණක උපකල්පනවල වෙනස්කම් සිදු වනුයේ, වෙළඳපළ අනුපාතවල වෙනස්වීම් සහ අපේක්ෂිත වැටුප් වැඩිවීම්වල වෙනස්කම් හේතුවෙනි. 2024 සහ 2023 යන වර්ෂවල දී සිදු කරන ලද සංවේදීතා විශ්ලේෂණයේ දී භාවිතා කරන ලද ක්‍රමය සහ උපකල්පන වෙනස්වී නොමැත.

මර්ත්‍යතාව හා අබලතාව

මර්ත්‍යතාව	වයස	20	25	30	35	40	45	50	55
අනුපාතික	අනුපාතිකය	0.00089	0.00069	0.00065	0.00086	0.00144	0.00264	0.00479	0.00844
අබලතාව	වයස	20	25	30	35	40	45	50	55
අනුපාතික	අනුපාතිකය	0.000089	0.000069	0.000065	0.000086	0.000144	0.000264	0.000479	0.000844

පාරිතෝෂික වගකීම් තක්සේරු කිරීමේ දී භාවිතා කරන උපකල්පනවල සංවේදීතාව

සේවක ප්‍රතිලාභ බැඳියා මානනයෙහි නියතව පවත්නා වෙනත් සියලු විචල්‍යයන් සමඟ භාවිතා කරනු ලබන සැලකිය යුතු ආයු ගණක උපකල්පනවල වෙනස්වීම් මත සිදු වන නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ සහ විස්තිරණ ආදායම් ප්‍රකාශයේ බලපෑම, පහත දැක්වෙන වගුව මගින් නිරූපණය වේ.

වෙනස් වූ විචල්‍යයන් (අනෙකුත් සියලු උපකල්පන නොවෙනස්ව පවතින අතර)	**නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වත්මන් අගය (රු.)**
වට්ටම් අනුපාතිකය එක් ප්‍රතිශතයකින් වැඩි වීම (+1%)	197,118,475
වට්ටම් අනුපාතිකය එක් ප්‍රතිශතයකින් අඩු වීම (-1%)	228,860,464
වැටුප් ඉහළ යාමේ අනුපාතිකය (දීමනා ඇතුළුව) එක් ප්‍රතිශතයකින් වැඩි වීම (+1%)	229,062,753
වැටුප් ඉහළ යාමේ අනුපාතිකය (දීමනා ඇතුළුව) එක් ප්‍රතිශතයකින් අඩු වීම (-1%)	196,693,888

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සේවක දත්ත

සක්‍රීය සේවක දත්තවල සාරාංශය පහත දක්වා ඇත.

වයස් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	මුළු මාසික වැටුප් (රු.)	සාමාන්‍ය අතීත සේවය (අවුරුදු)	උපකල්පනය කිරීම් අනුව සාමාන්‍ය අනාගත සේවා කාලය (අවුරුදු)
20 to 24	21	815,060	0.6	18.8
25 to 29	51	2,357,855	2.9	17.6
30 to 34	66	3,232,515	5.6	16.4
35 to 39	69	3,541,890	10.6	14.4
40 to 44	37	2,026,355	12.9	12.3
45 to 49	27	1,623,350	17.4	10.3
50 to 54	46	3,199,885	24.4	6.7
> 55	24	1,779,235	28.5	2.9
එකතුව	**341**	**18,576,145**	**11.8**	**13.1**

සටහන - 23

	2024	2023
විලම්බිත බදු වගකීම්		
වසර ආරම්භයේදී ශේෂය	389,492,010	557,467,909
වර්ෂය තුළ විලම්බිත බද්දක් ලෙස අය කිරීම/(ආපසු හැරවීම)	(34,121,620)	(167,975,898)
	355,370,390	**389,492,010**

2024.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන - 24

	2024	2023
වෙළඳ ණයහිමියෝ හා අනෙකුත් ගෙවීම්		
ණයහිමි පාලනය - ඇසුරුම් ද්‍රව්‍ය	12,123,396	48,943,051
ණයහිමි පාලනය - අමුද්‍රව්‍ය	48,487,562	44,383,924
ණයහිමි පාලනය - ලිපිද්‍රව්‍ය	1,464,522	4,058,194
ණයහිමි පාලනය - උපකරණ හා යන්ත්‍රසූත්‍ර	3,318,380	4,893,920
ණයහිමි පාලනය - රසායනික ද්‍රව්‍ය	2,423,081	-
ණයහිමි පාලනය - පොදු	504,300,492	409,031,466
ණයහිමි පාලනය - බැංකු	103,359,305	92,353,154
ණයහිමි පාලනය - සේවක	5,700,062	4,413,901
ණයහිමි පාලනය - සේවා	10,447,358	11,348,245
ණයහිමි පාලනය - බද්ධ ව්‍යාපාර	3,961,173,602	3,397,477,435
සේවක ආරක්ෂක ඇපකරය - මූල්‍ය	11,490	11,194
සේවක ආරක්ෂක ඇපකරය - ගබඩා	447,483	410,282
ගෙවිය යුතු ටෙන්ඩර් බැඳුම්කර	36,487,144	34,311,367
ගෙවිය යුතු සේවක අර්ථසාධක හා භාරකාර අරමුදල් - 28%	-	(2,432)
වැටුප් පාලනය	-	46,355
තොග පාලනය -ණය ගැනීම්	125,375	684,802
	4,689,869,251	**4,052,364,858**

සටහන - 25

ආශ්‍රිත පාර්ශව අනාවරණයන්

සැලකිය යුතු ආශ්‍රිත පාර්ශව අනාවරණයන්හි විස්තර පහත පරිදි වේ:

සංවිධානය		**සම්බන්ධතාවය**	**ගනුදෙනුවේ ස්වභාවය**	**වර්ෂය තුළ විකිණීම්**
වෛද්‍ය සැපයුම් අංශය		ගනුදෙනුකරු	භාණ්ඩ විකිණීම	26,288,144,615
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	- බෙදාහරින්නන් හරහා	ගනුදෙනුකරු	භාණ්ඩ විකිණීම	27,865,997
	- ටෙන්ඩරපත් හරහා	ගනුදෙනුකරු	භාණ්ඩ විකිණීම	-
බෙදාහරින්නන්				1,886,071,208
එකතුව				**28,202,081,820**

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

එම්එස්යූ/සී/එස්පීඑම්සී/1/24/28 2025 ජූනි 12 දින

සභාපති
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

1.3 සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සදහන් නිරික්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති හා රෙගුලාසි වලට යොමුව		**අනුකූල නොවීම**
(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත		
(i) 64(1) වගන්තිය		සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචිය අළුත්කළ යුතු ඖෂධ 08 කට අදාල ලියකියවිලි ඖෂධ නියාමන අධිකාරියට නිසි කාලසීමාව තුල ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත්කිරීමට දින 107 ත් 219 ත් අතර පරාසයක කාල සීමාවක් ප්‍රමාද වී තිබුණි.
(ii) 64(2) වගන්තිය		ඖෂධ 07 ක ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අදාළ ගාස්තු ගෙවා තිබුණද අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රමාද කර තිබුණි.

විගණකාධිපති වාර්තාව

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i) 3(2)(iii) මුදල් රෙගුලාසි		රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කරන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05 ක් පිහිටුවීමේ අරමුණින් ආරම්භ කරන ලද ලෝටස් ෆාමා ව්‍යාපෘතිය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් කර නොතිබූ අතර 2021 සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රසම්පාදන කටයුතු හා සේවක වැටුප් මෙන්ම අදාල ඉඩම මිලදී ගැනීමට පිළිවෙලින් රු.මිලියන 55.58 ක්, රු.මිලියන 322.41 ක් ලෙස එකතුව රු.මිලියන 377.99 ක් ගෙවා තිබුණි.
(ii) 110 මුදල් රෙගුලාසි		හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය 2.10 ඡේදය		වැඩ බැලීම හා පරිවාසික පත්වීම් ඇතුළුව සියළුම පත්වීම්, වැටුප් වර්ධක වෙනස්කම්, සේවයෙන් පහකිරීම, ඉල්ලා අස්වීම් හා විශ්‍රාම ගැන්වීම්, නැවත සේවයේ පිහිටුවීම් හා මරණයන් පිළිබඳ සම්පූර්ණ විස්තර ඒ ඒ අවස්ථාවලදී විගණකාධිපතිට වාර්තා කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය.		වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 09 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන රු. 1,541,368 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි. ඊට අමතරව 2022 දෙසැම්බර් 31 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි අලෙවි තනතුරු 02 සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරිණියන් දෙදෙනෙකු පත් කර තිබුණි.
(ඉ) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ VI ඡේදය		අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම යෑමේදී අදාල පුරප්පාඩු පිරවීම සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඊ) 2015 මැයි 15 දිනැති අංක මු.අ 01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 ඡේදය (අ) හා 2023 මාර්තු 14 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ ලිපිය		නියම කරන ලද උපදෙස් වලින් බැහැරව අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබූ රු.1,689,108 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2		අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක්ද සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි.
(ඌ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 5.3 ඡේදය		2007 අංක 7 දරන සමාගම් පනතේ දක්වා ඇති පරිදි බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් ඒකාබද්ධ අරමුදලට බැර කරණු ඇතැයි අපේක්ෂා කර ඇති නමුත් 2023 වර්ෂයට අදාළ බදු පසු ලාභයෙන් සියයට 30කට අදාල කොටස රු.455,566,592 ක් වුවද රු.300,000,000ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි.
(එ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය		
(i) 2.6 ඡේදය		අනුමත වූ කාර්ය මණ්ඩලය තුළ ඉහළ කළමණාකරන මට්ටමේ සාමාජිකයකුට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරයකු සිටිය යුතු වුවද සුදුසුකම් සහිත අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරයකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) 3.2 ඡේදය		ශේෂපත්‍ර දිනයෙන් මාස 5 කට පසුව හා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම පැවැත්විය යුතු වුවද 2023 වර්ෂය සඳහා වූ යථෝක්ත රැස්වීම පවත්වා නොතිබුණි
(iii) 3.2 ඡේදය ඇමුණුම් 01 හි 2 කොටස (අ)		වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරම සඳහා මූල්‍ය ඇස්තමේන්තු වටිනාකම සඳහන් කළ යුතු වුවද, මානව සම්පත් අංශයේ එක් එක් ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ඇස්තමේන්තු වටිනාකම සඳහන් කර නොතිබුණි.
(iv) 4.3 ඡේදය		අවම වශයෙන් මාස 03 කට වරක් බැගින් අවදානම් කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්විම් 02ක් පමණක් පවත්වා තිබුණි.
(ඒ) 2015 ජූනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය		සංස්ථාවේ සේවකයින් සඳහා ගෙවනු ලබන පා පැදි ණය රු.20,000 සිට රු.75,000 දක්වා වැඩි කර තිබුණු නමුත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබා නොතිබුණි.

(ඔ) සංස්ථාව සහ වෙනත් ඖෂධ නිෂ්පාදකයින් අතර බද්ධ ව්‍යාපාර සඳහා වූ ගිවිසුම		
(i) 5.2.4 දරන වගන්තිය		ආයෝජකයන් විසින් ගිවිසුම් ගතවී මාස 03 ක් ඇතුළත සිය නිෂ්පාදනාගාර ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු වුවද, ආයෝජකයින් 07 දෙනෙකු සම්බන්ධයෙන් අදාළ තොරතුරු පරීක්ෂාකර නොතිබුණි.
(ii) 3.16 වගන්තිය		මෙඩිකොම් බද්ධ ව්‍යාපාරය විසින් ඖෂධ අයිතම 16ක් නිෂ්පාදනය කර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත සැපයීමට නියමිතව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිම ඖෂධයක් සපයා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාල වන සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුව නොහොත් ඉංජිනේරු ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු බවත් 4.3.2 වගන්තිය ප්‍රකාරව එම මුළු පිරිවැය ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු බවත් දක්වා තිබුණද සංස්ථාවේ තත්ත්ව පාලන රසායනාගාරයේ සිවිලිම සැපයීම හා ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර පහත සඳහන් අඩුපාඩුද නිරීක්ෂණය විය.

(i). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදනයට අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කර ඇති බවට ස්ථිර බැඳීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ නොකළ යුතු වුවද යථෝක්ත ප්‍රසම්පාදනයට අවශ්‍ය රු.මිලියන 5ක අරමුදල් වලින් රු.මිලියන 03ක් 2024 වාර්ෂික අයවැයට අනුව වෙන්කර තිබූ නමුත් ඉතිරි රු. මිලියන 2 ක අරමුදල ලබාගැනීම සඳහා කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද දිනය වූ 2024.02.02 දින දක්වාම මූල්‍ය අංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහක මුදලක් කාර්ය සාධන සුරක්ෂණයක් කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනය අවසන් වී තවත් දින 28ක් ඔබ්බට වලංගු වන අයුරින් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත යුතු වුවද කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(iii). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 වගන්තිය අනුව පූර්ව සුදුසුකම් පරීක්ෂාව යටතේ සමාන කොන්ත්‍රාත් පිළිබඳව ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ අතීත කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ලංසුකරුවන්ගෙන් ලබාගත යුතු බවට දක්වා තිබුණද, එම තොරතුරු තෝරාගත් ලංසුකරුගෙන් ලබාගෙන නොතිබුණු අතර එම ව්‍යාපාරය ආරම්භ කළ දින වන 2022.12.24 දින සිට වසරක පමණ කාලයක් සඳහා වූ බැංකු ගිණුමක විස්තර පමණක් ඉදිරිපත් කර තිබුණි.

(iv). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව රු. 250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තෝරාගත් ලංසුකරු වෙත විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කිරීමත් සමගම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් දෙපාර්ශවය විසින් අත්සන් කළ යුතු බව දක්වා තිබුණද අස්ථිත්වය විසින් කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සංස්ථාවේ වෙළඳ ණයගැති වෛද්‍ය සැපයීම් ගිණුම් තුළ ඇතුළත් 2018 සිට 2024 වර්ෂය දක්වා වෛද්‍ය සැපයීම් අංශයට සපයා ඇති බද්ධ ව්‍යාපාර ඖෂධ වලට අදාල ඉන්වොයිසි සඳහා ඖෂධ මිල විචලනයන් මත හා නියමිත කාල සීමාවට ඖෂධ නොසැපයීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස වෛද්‍ය සැපයීම් අංශය විසින් සංස්ථාවෙන් අය කරන ලද රු.1,106,420,551 ක මුදල බද්ධ ව්‍යාපාර වලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගැනීම් මත ඇතිවන ණයහිමි ශේෂය ගිවිසුම් ප්‍රකාරව දින 60ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට රු.4,399,405,216 ක් වූ බද්ධ ව්‍යාපාර සඳහා ගෙවිය යුතු ශේෂය තුළ දින 60ක් ඉක්මවූ රු.1,661,541,201 ක ශේෂයක් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වල ඇතුළත් පිරිවැය රු. 119,158,776 ක් වූ අයිතම 135ක් භෞතිකව සත්‍යාපනය වී නොතිබුණි.

(ඈ) කෙරීගෙන යන වැඩ ගිණුමේ රු.73,582,498 ක ශේෂය තුළ වසර 7කට වඩා වැඩි කාලයක් පරිශේෂව පැවැති රු.27,550,136 ක් පිළිබඳ පරීක්ෂා කිරීමේදී එය 2018 සිට මෙතෙක් ඉදිනොකළ සිවිමහල් පරිපාලන ගොඩනැගිල්ලක් වෙනුවෙන් වැය කර තිබුණු අනාර්ථික වියදමක් බව අනාවරණය විය.

(ඉ) ඖෂධ අමුද්‍රව්‍ය හුවමාරු ක්‍රමය යටතේ ණය පදනම මත සංස්ථාවෙන් බද්ධ ව්‍යාපාර වෙත 2023 මාර්තු 03 දින රු.13,557,223 ක් වටිනා අමුද්‍රව්‍ය තොගයක් නිකුත්කර තිබුණද අදාළ මුදල් වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 16කදී මහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.මිලියන 25,780.89ක් අදාල සැපයුම් ඉන්වොයිස් සමග සැසඳුම් කර නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ණයගැති ගිණුමට බැර කර තිබුණි.

(උ) පර්යේෂණ හා සංවර්ධනය අංශය විසින් සංවර්ධනය කළ ඖෂධ වෙළඳ පොළේ අධික ඉල්ලුමක් සහිත ඖෂධ වර්ග 08ක්, වාණිජ්‍ය නිෂ්පාදන වශයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය සඳහා 2023 දී ඉදිරිපත් කර තිබුණද, ඒ සමග ඉදිරිපත් කළ යුතු ලියවිලි නිසි පරිදි ඉදිරිපත් නොකිරීම නිසා වර්ෂ 1½ කටත් අධික කාලයක සිට එම වාණිජ්‍ය නිෂ්පාදන වෙනුවෙන් අනුමැතිය ලැබී නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ඌ) Flucloxacillin Capsule BP 500 mg හා Mebendazole Tab USP 100 mg යන ඖෂධවල ලියාපදිංචි සහතික පිළිවෙලින් 2024 දෙසැම්බර් 16 හා 17 දින කල් ඉකුත් වී තිබීමත් සංස්ථාව විසින් නියමිත දින වලට එම සහතික නැවත අළුත් කර ගැනීමට කටයුතු නොකිරීමත් පිළිවෙලින් 2025 ජනවාරි 29 දින හා 2025 පෙබරවාරි 01 දින නැවත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචිය අළුත් කිරීමත් හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලුම් කරන ලද අදාළ ඖෂධ ඇණවුම් වෙනුවෙන් ඖෂධ සැපයීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 26,177,276 ක් වූ ඖෂධ සංස්ථාවේ වෛද්‍ය සැපයීම් අංශ ගබඩාව තුළ ඉතිරිව තිබුණි.

(එ) Clopidogrel Tablets USP 75 mg (500 Pack Size) ඖෂධය නව ඖෂධයක් ලෙස සංස්ථාව තුළ නිපදවීම සඳහා 2020 වර්ෂයේ හඳුන්වා දී තිබුණද එහි නිෂ්පාදන සූත්‍රයෙහි පවතින දුර්වලතාවයන් හේතුවෙන් නිපදවීම අසාර්ථක වී තිබුණි. නිෂ්පාදන සූත්‍රය සංවර්ධනය කර මෙම ඖෂධය සංස්ථාව තුළ නිපදවා වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් සැපයුමෙහි නම් සියයට 10ක ලාභයක් ළඟා කර ගැනීමට අවස්ථාව තිබුණද සංස්ථාව එසේ කටයුතු නොකර බද්ධ ව්‍යාපාර හරහා සියයට 6ක ලාභයක් සහිතව ඇසුරුම් 1700ක් පමණක් සපයා තිබුණි.

(ඒ) 2023 වර්ෂයේදී පෙනිසිලින් කලාපය පුළුල් කිරීම ප්‍රතිසංස්කරණය හා ඖෂධීය උපකරණ මිලදී ගැනීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ රු. 438,146,336 ක් ලැබී තිබූ අතර සංස්ථාවද ඒ වෙනුවෙන් රු.24,895,256 ක පිරිවැයක් දරා තිබුණි. මෙහිදී අධිවේගී කරල් පිරවුම් යන්ත්‍ර හා අනෙකුත් ඖෂධීය යන්ත්‍ර උපකරණ පෙනිසිලින් කලාපයට මිලදී ගැනීම තුළින් යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීමටද, Co-Amoxiclav පෙති වැනි නව නිෂ්පාදන සඳහා නව අඩු ආර්ද්‍රතා ප්‍රදේශයක් සංවර්ධනය කිරීමටද, අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පෙනිසිලින් කලාපය තුළ දැනට නිෂ්පාදනය කරමින් පවතින පෙනිසිලින් කරල් වර්ග පහකින් මිලියන 261ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, කරල් මිලියන 191ක් පමණක් නිෂ්පාදනය කිරීමට හැකි වී තිබුණු අතර 2019 වර්ෂයේදී කරල් මිලියන 275ක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව පෙනිසිලින් කලාපය වැඩි දියුණු කළද සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගැනීමට සමත් වී නොතිබුණි.

(ඔ) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත වෛද්‍ය සැපයීම් අංශයෙන් Tramadol Hydrochloride Capsule 50 mg ඖෂධ කරල් මිලියන 7.5 ක් මිලදී ගැනීම සඳහා 2023 සැප්තැම්බර් 06 දින 2024/SPM/N/R/P/00029 දරණ ඇණවුම ලබා දි තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 06 හා 2024 මැයි 06 යන දිනවල පිළිවෙලින් ඖෂධ කරල් මිලියන 4 ක් හා මිලියන 3.5 ක් බැගින් නියමිත කාල රාමුව තුල සැපයීම් කළ යුතු වුවද 2024 වර්ෂය තුළ අදාළ ඇණවුම වෙනුවෙන් ඖෂධ කරල් මිලියන 5.256ක් පමණක් සපයා තිබූ අතර ප්‍රමාද වී ඖෂධ සැපයීම හේතුවෙන් බිල්පත් 5ක් වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශයට රු. මිලියන 1.298ක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවීමට සිදුවී තිබුණි. තවද සංස්ථාවේ අලෙවි සැලැස්මට අනුව ඖෂධයෙන් ඒකක මිලියන 7.5ක් අලෙවි කිරීම තුළින් රු. මිලියන 118.57ක අලෙවි ආදායමක් ලබාගැනීමට අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 60.175ක අලෙවි ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලැස්ම අනුව Metformin BP 500 mg ඖෂධයෙන් ඒකක මිලියන 84ක් නිපදවීමට අපේක්ෂා කළද ඒකක මිලියන 9.28ක් පමණක් නිෂ්පාදනය කර පෞද්ගලික වෙළඳපොල වෙත නිකුත් කර තිබුණි.මෙම ඖෂධය සංස්ථාව තුළ නිෂ්පාදනය කිරීම මගින් සියයට 12ක ලාභයක් ඉපයීමට හැකියාව තිබුණ ද වෛද්‍ය සැපයීම් අංශයෙන් අංක 2024/SPM/N/R/P/00015 දරණ ඇණවුම යටතේ ලැබුණු රු මිලියන 50ක ඇණවුමක් සැන්ඩ්ස් ඇක්ටිව් බද්ධ ව්‍යාපාරය වෙත ලබාදී සියයට 06 ක ලාභයක් පමණක් උපයාගෙන තිබුණි. තවද, ඖෂධ ඒකක මිලියන 250ක් සපයාගැනීම වෙනුවෙන් වූ වෛද්‍ය සැපයීම් අංශයේ අංක 2024/SPM/N/R/P/00015 දරණ ඖෂධ ඇණවුම සංස්ථාවට හා සංස්ථාවේ බද්ධ ව්‍යාපාර වන සෙලොජන් ලංකා සමාගම වෙත හා සැන්ඩ්ස් ඇක්ටිව් සමාගම වෙත ලබාදී තිබූ අතර සෙලොජන් ලංකා සමාගම නියමිත කාල රාමුව තුල ඖෂධ නොසැපයීම හේතුවෙන් රු. 12,311,005ක දඩ මුදලක් ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි. එසේ වුවද අදාල දඩමුදල් සෙලෝජන් ලංකා සමාගමෙන් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ක) සමාලෝචිත වර්ෂයේ අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඉහළ වෙලඳපොළ ඉල්ලුමක් ඇති Rosuvastatin Tablets IP 10 mg ඖෂධය නිෂ්පාදනයට, අලෙවියට හා අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සැලසුම් කර නොතිබුණි. 2023 මාර්තු 21 දින ලැබුණු රු. 12,991,560ක් පිරිවැය වූ ඖෂධ අමුද්‍රව්‍ය 75 kg ක් 2024 ජූනි මාසය දක්වා නිෂ්පාදනයට භාවිතා කර නොතිබුණු අතර ආයතනයේ පවතින නිෂ්පාදන පහසුකම් හා ක්‍රියාත්මක කළ හැකි නිෂ්පාදන කාල රාමුව සලකා බලා ඊට අනුගාමීව අමුද්‍රව්‍ය මිලදී ගැනීම සිදු නොකිරීම හේතුවෙන් දරන ලද පිරිවැය සඳහා නිසි ප්‍රතිලාභ අදාල කාල පරිච්ඡේදය තුළ සංස්ථාව වෙත ලැබී නොතිබුණි. තවද අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව වසරකට පසු එනම් 2024 ජූනි 24 දින පරීක්ෂා කර එම අමුද්‍රව්‍ය තොගය IP පිරිවිතර හා එකග නොවන බව සංස්ථාවේ තත්ත්ව පාලන අංශයෙන් තහවුරු කර තිබුණු නමුත් අදාළ තොගය ආපසු යවා ඒ වෙනුවට සැපයුම්කරුගෙන් යෝග්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ග) Aspirin AR Tablets 75 mg ඖෂධයේ තාක්ෂණික දෝෂ පැවතියද ඒ පිළිබඳව නොසලකා 2022 හා 2023 වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු. 1,786,398ක් පිරිවැය වූ Aspirin AR ඖෂධ අමුද්‍රව්‍ය කි.ග්‍රෑ. 641ක් ඌන උපයෝජිතව ගබඩාවේ පැවතුණි.

(ච) 2020 වර්ෂයේදී Covid – 19 වසංගතයට භාවිතා කිරීමේ අපේක්ෂාවෙන් මිලදීගෙන තිබුණු 2025 මාර්තු 31 දිනට කල්පිරීමට නියමිත රු. 6,698,610ක් පිරිවැය වූ Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය කි. ග්‍රෑ. 600 සමාලෝචිත වර්ෂයේ ද නිෂ්කාර්යව ගබඩා පරිශ්‍රය තුළ පැවති නමුත්, එම අමුද්‍රව්‍ය සැපයුම්කරුට ප්‍රතිඅපනයනය කිරීමට හෝ වෙනත් පාර්ශවයකට අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය සඳහා වූ නිෂ්පාදන සැලැස්ම අනුව අයවැයගත නිෂ්පාදනය ඖෂධ ඒකක මිලියන 4,020ක් වූ අතර සත්‍ය නිෂ්පාදනය ඖෂධ ඒකක මිලියන 3,146.54ක් වීමෙන් අහිතකර විචලනය ඖෂධ ඒකක මිලියන 874.3 ක් වී තිබුණි.මෙය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ඖෂධ ඒකක මිලියන 381.08කින් ඖෂධ නිෂ්පාදනය අඩුවීමකි.

(ට) 2018 සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නව ඖෂධ වර්ග 29 ක් පමණ හඳුන්වා දුන්නද ඉහළ ඉල්ලුමක් ඇති ඖෂධ කිහිපයක් හැර අළුතින් හඳුන්වා දුන් ඖෂධ අඛණ්ඩව නිෂ්පාදනයට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබීම හේතුවෙන් සංස්ථාවේ නිෂ්පාදන මිශ්‍රණය සඳහා එම හඳුන්වාදීම් වලින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොතිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය කර තිබුණු ඇතැම් ඖෂධවල පෙති කුඩා කොටස් වලට කැඩීයාමේ හැකියාව ඉහළ යාම, ඖෂධ පෙතිවල බරෙහි ඇතිවූ විචලතා, අයහපත් පෙනුම සහ ඖෂධ පෙති කැඩීමට ඇති වූ අපහසුතා වැනි හේතුන් මත අවස්ථා 14කදී නිෂ්පාදනය අතරමග නවතා අතිරේක පිරිවැයක් දරා නැවත නිෂ්පාදනය කර තිබුණි. එය සාමාන්‍ය නිෂ්පාදන ක්‍රියාවලියෙන් පරිබාහිර ක්‍රියාවක් වන නමුත් සෑම වර්ෂයකම නිෂ්පාදන ක්‍රියාවලියේ සිදු වන මෙම අයහපත් තත්ත්වයන් අවම කර ගැනීමට සුදුසු පාලන ක්‍රම හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.

(ණ) වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ සැපයිමේදි පිළිපැදිය යුතු කොන්දේසි පිළිබඳව වෛද්‍ය සැපයීම් අංශයේ 2017 අප්‍රේල් 04 දිනැති අංක MSD/SB11/SPMC/ORD/PO/2017 දරණ ලිපිය මගින් දැනුවත් කර තිබුණ ද, සංස්ථාව විසින් බද්ධ ව්‍යාපාර සමඟ ඇති කරගත් ගිවිසුම් වල එම කොන්දේසි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව වෛද්‍ය සැපයුම් අංශයට බෙදාහරින අවස්ථාව වන විට අදාළ ඖෂධයේ ඵලදායී ජීව කාලය අවම වශයෙන් සියයට 85 ක් පමණ පැවතිය යුතු වුවද බද්ධ ව්‍යාපාර ගිවිසුම් වල එය සියයට 75 ක් විය යුතු බව දක්වා තිබීමත්, ඖෂධ ප්‍රමිතියෙන් බැහැර අවස්ථාවලදී එම කාණ්ඩයට අදාළ මුළු ඉන්වොයිස් වටිනාකමට සමාන අගයක් හා එම ඖෂධ නිසිපරිදි විනාශ කිරීම වෙනුවෙන් ඉන්වොයිස් වටිනාකමින් සියයට 25 ක පරිපාලන ගාස්තුවක් අය කරන නමුත් බද්ධ ව්‍යාපාර ගිවිසුම්වල එවැනි කොන්දේසීන් ඇතුළත් කර නොතිබීමත්, ප්‍රමාද වී සැපයුම් කළහොත් ඒ සඳහා දඩමුදල් අයකරන බව සඳහන් කර තිබුණද ඒ සම්බන්ධ කොන්දේසීන් බද්ධ ව්‍යාපාර ගිවිසුම් වල ඇතුළත් කර නොතිබීමත් හේතුවෙන් සංස්ථාවට පමණක් අදාල වගකීම් හා අලාභ දැරීමට සිදුව තිබුණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ක) යෝජිත ලෝටස් ශාඛා නව නිෂ්පාදනාගාරය තුළ රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කෙරෙන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණු අතර වසර 03කට පසුව ඉන් ප්‍රථම අදියර ලෙස මුඛ මාර්ගයෙන් ලබා දෙන සාමාන්‍ය ඖෂධ නිපදවීම සඳහා වන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 13.1කට සමාන රු.මිලියන 4,349.2ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. 2022 ඔක්තෝබර් 20 දිනැති අංක BP/44/22 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හා ඔක්තෝබර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත නිෂ්පාදනාගාර 03 ක් ඉදිකිරීමට අක්කර 20ක වපසරිය ප්‍රමාණවත් බව දක්වා තිබුණද රු. මිලියන 322.4ක් වැයකර අක්කර 65ක් මිලදී ගෙන තිබුණි. තවද, 2024 පෙබරවාරි 02 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතියට අදාල සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකළ යුතු බව දන්වා තිබුණද, ඒ සඳහා කටයුතු කර නොතිබුණි. 2022 සිට 2026 දක්වා වූ පස් අවුරුදු සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය වසර 03කදී නිම කිරීමට බලාපොරොත්තු වුවද විගණිත දිනය වූ 2025 මැයි 27 දින වන විට වසර 03කුත් මාස 05ක් ඉකුත් වී තිබුණද භෞතික ප්‍රගතිය ශූන්‍ය වී තිබුණි.

(ද) වර්ග අඩි 18,439 පමණ වපසරියකින් යුත් සංස්ථාව සතු බුලත්සිංහල පිහිටි සිව් මහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 3,762 පමණ වන බිම් මහල පමණක් සංස්ථාවේ ගබඩා කටයුතු වෙනුවෙන් උපයෝජනය කර තිබුණද, වර්ග අඩි 10,837 ක පමණ වපසරියකින් යුත් අනෙකුත් මහල් 3 හි ප්‍රශස්ත භාවිතයකින් තොරව නිෂ්කාර්යව තිබුණි. තවද ගොඩනැගිල්ල තුළ පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් ස්ථාපිත කිරීමේ අරමුණින් ලබාගත් ශ්‍රවනාගාර පුටු 30 ක් හා ආලින්ද පුටු 10 ක් වසර 05 ක කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එම භාණ්ඩ විනාශ වෙමින් පැවතුණි.

(න) සංස්ථාවේ දැනට භාවිතා වන සිසිලන පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය පිළිබඳ 2019 වර්ෂයේදී සිදුකළ සවිස්තරාත්මක බලශක්ති විගණනයේ නිර්දේශයන් ප්‍රකාරව සකස්කළ සිසිලන ඉල්ලුම සපුරාලන කාර්යක්ෂම සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීමේ යෝජනාවට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ප) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ විකුණුම් ඇස්තමේන්තුව රු.මිලියන 29,250.25 ක් වූ අතර තත්‍ය විකුණුම් ආදායම රු.මිලියන 28,202.08 ක් වී තිබුණි. 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ බද්ධ ව්‍යාපාර නිෂ්පාදන වලින් දක්වන දායකත්වය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ අලෙවිය වැඩිවී තිබුණද සංස්ථාවේ නිෂ්පාදන තුළින් සංස්ථාවේ අලෙවි ආදායම සඳහා දක්වන දායකත්වය පහළ ගොස් තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ බද්ධ ව්‍යාපාර වලින් සමස්ථ ආදායමට දක්වන දායකත්වය රු.මිලියන 20,149.08 ක් එනම් සියයට 71.4ක්ද සංස්ථාවේ දායකත්වය රු.මිලියන 8,053ක් එනම් සියයට 28.6 ක්ද වී තිබුණි.

(බ) 2016 වර්ෂයේදී Paracetamol ඖෂධය Pacidol යන වෙළඳනාමය යටතේ වෙළඳපොලට හඳුන්වා දී තිබුණු අතර මෙම ඖෂධයෙන් සමාලෝචිත වර්ෂයේ ඇසුරුම් ඒකක 720,000 ක් අලෙවි කර රු. 178,200,000ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණි. බෙහෙත් වට්ටෝරු අවශ්‍ය නොවන ඉහළ වෙළඳපොල ඉල්ලුමක් පවතින මෙම ඖෂධයේ වෙළඳනාමය ප්‍රවර්ධනය කිරීම සඳහාද ප්‍රවර්ධන වියදම් දරා තිබුණද සැලසුම් කළ පරිදි නිෂ්පාදනය සිදුනොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලෙවිකර තිබුණු ප්‍රමාණය Pacidol ඇසුරුම් ඒකක 114,150ක් වූ අතර ඉන් උපයාගෙන තිබුණු ආදායම රු. 30,513,176ක් පමණක් විය.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ම) Ciprofloxacin Tablets USP 500 mg ඖෂධයෙන් 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා දේශීය වෙළඳපොළ බෙදාහරින්නන් විසින් ඖෂධ ඒකක මිලියන 32.81ක් ඉල්ලීම් කර තිබුණි. 2024 ඔක්තෝබර් 23 දින වන විට ඖෂධ ඒකක මිලියන 2.36ක් වැනි ඉතා කුඩා ප්‍රමාණයක් සැපයීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ අලෙවි සැලැස්මට අනුව Ciprofloxacin USP 250 mg හා 500 mg ඖෂධ පිළිවෙලින් මිලියන 13.5 ක් හා 13.2ක් වශයෙන් අලෙවි කිරීම සඳහා සැලසුම් සකස් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ Ciprofloxacin Tab 250 mg ඖෂධයෙන් කිසිදු ඒකකයක් නිෂ්පාදනය කිරීමට නිෂ්පාදන අංශය අපොහොසත් වී තිබුණි. දේශීය වෙළඳපොළ බෙදාහරින්නන්ගෙන් ඉහළ ඉල්ලුමක් සහිත Ciprofloxacin Tab USP 250 mg හා 500 mg ඖෂධ නිෂ්පාදනය කිරීමට Ciprofloxacin HCL USP ඖෂධ අමුද්‍රව්‍ය විශාල වශයෙන් ගබඩාවේ පැවතියද නිෂ්පාදන අංශයට එම ඖෂධ නිසි කාලය තුළ නිෂ්පාදනය කිරීමට නොහැකිවීම නිසා සංස්ථාවට ලැබීමට තිබූ ඉහළ ආදායමක් අහිමි වී තිබුණි.

(ය) 2025 අප්‍රේල් 30 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 449 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 334ක් වීමෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 115 ක් වී තිබුණි. ඒ අනුව මානව සම්පත් හා මූල්‍ය අංශ වල ප්‍රධාන තනතුරු 02 ක්ද ඇතුළුව තනතුරු 10ක්, විධායක නොවන ශ්‍රේණියේ තනතුරු 82 ක් හා සුළු සේවක තනතුරු 23ක් පුරප්පාඩු වී තිබුණි.

(ර) බඳවා ගැනීමේ පරිපාටිය 2013 මාර්තු 28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු අතර එම අනුමැතිය ලැබීමෙන් පසු වරින් වර අනුමත කරගත් සංශෝධනයන් හා නව තනතුරු වලින් සමන්විත බඳවාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන බැවින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වී තිබූ අතර එකම කාණ්ඩයට අයත් තනතුරු සඳහා විවිධ සුදුසුකම් යටතේ බඳවාගැනීම් කිරීමට මේ යටතේ අවස්ථාව සැලසී තිබුණි.

(ල) 2018 ඔක්තෝබර් 04 දින සිට 2024 දෙසැම්බර් 01 දක්වා කාල සීමාව තුළ අවස්ථා 6කදී පුවත්පත් දැන්වීම් මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු හා පරීක්ෂණ) තනතුර සඳහා නිලධාරියෙක් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණද සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු නොකර එම තනතුරේ රාජකාරී ඉටුකිරීම සඳහා 2016 වර්ෂයේ සිට කළමණාකරුවෙකු පත් කර තිබුණි.

(ව) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරක් නොතිබුණු අතර, කනිෂ්ඨ කළමණාකරන මට්ටමේ පුද්ගලික ලේකම් තනතුරු 02 ක් පමණක් අනුමත වී තිබුණි. ඒ අනුව අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට අදාල යම් කටයුතු සිදු කිරීමේ කාර්යයන්ද පුද්ගලික ලේකම් වෙත ලිඛිතව පවරා තිබුණි.

(ශ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද තත්ත්ව පාලන නිලධාරී තනතුරු 02ක් සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයකින් අභ්‍යන්තර අයදුම්කරුවෙකු ලෙස එකී තනතුරක් සඳහා තෝරාගෙන තිබුණු නිලධාරීයකුට අදාළ සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය සම්බන්ධව ලකුණු 25 ම ලබාදී අනෙකුත් අභ්‍යන්තර අයදුම්කරුවන්ට ලකුණු 5 ක් 7 ක් වැනි අඩු ලකුණු ලබාදී තිබීම හා කාර්යය සාධනය සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් එක්ව ලකුණු ලබා දී තිබීම යන කරුණු හේතුවෙන් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉලක්ක ගත අපේක්ෂකයෙකු බඳවා ගැනීමට කටයුතු නොකර ස්වාධීනව හා අපක්ෂපාතීව කටයුතු කර ඇති බවක් විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

ජේ. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2.2.2

(අ) 2015 අංකය 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ

(i) 64 (1) වගන්තිය

සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචිය අළුත් කළ යුතු ඖෂධ 08 කට අදාළ ලියකියවිලි ඖෂධ නියාමන අධිකාරියට නිසි කාල සීමාව තුලදී ඉදිරිපත් නොකිරීම හා වෙනත් බාහිර කරුණු හේතුවෙන් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත් කිරීමට දින 30 ත් 90 ත් අතර කාල පරාසයක ප්‍රමාදයක් සිදු වී ඇත.මේ වන විට එවැනි ප්‍රමාදයන් වලක්වන ආකාරයට කළමණාකරනය කිරීමට පියවර ගෙන කටයුතු කරමින් පවතියි.

(ii) 64 (2) වගන්තිය

ඉන් ඖෂධ 07 ක ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අදාල ගාස්තු ගෙවා තිබුණද අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත් කිරීමද ප්‍රමාදවී තිබුණි.

මේ වන විට එවැනි ප්‍රමාදයන් වලක්වන ආකාරයට කළමණාකරනය කිරීමට පියවර ගෙන කටයුතු කරමින් පවතියි.

(ආ)

(i) සැලකිල්ලට ගන්නා ලදි. එසේම මේ සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට අමාත්‍යංශ උපදේශන කමිටුව මගින් කමිටුවක් පත් කරන ලද අතර මෙලෙස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට පත් කරන ලද කමිටුවෙහි නිර්දේශ සහ උපදෙස් පරිදි ඉදිරියේදි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 110

2025 වර්ෂයට අදාලව ආයතනය සම්බන්ධයෙන් හානි පාඩු ලේඛණයක් පවත්වාගෙන යාමට මේ වන විට කටයුතු කර ඇත. එය 2025 වර්ෂය වෙනුවෙන් නියමාකාරයෙන් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

(ඇ) VI පරිච්ජේදයේ 2.10 ජේදය

මින් ඉදිරියේදී ලබා දෙන සියළු පත්වීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

(ඈ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ 2 වන ඡේදය.

තනතුර	පුවත්පත් දැන්වීම් පළ කළ දින	ලැබුණු අයදුම්පත් ගනන	බඳවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මානව සම්පත්	2017.07.02	11	2017.08.15 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙක් 2017.09.20 දින බඳවා ගන්නා ලදි.
	2018.09.23	09	2019.06.27 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් බඳවා ගැනීමට සුදුසු අයදුම්කරුවෙකු නොවීය.
	2019.09.08	07	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය.
	2020.09.20	29	2021.12.01 සම්මුඛ පරීක්ෂණ පවත්වා නිලධාරියෙක් 2022.01.18 දින බඳවා ගන්නා ලද අතර ඔහු 2022.12.01 සේවයෙන් ඉල්ලා අස්වන ලදි.
	2024.12.01	15	2025.03.18 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් බඳවා ගැනීමට සුදුසු අයදුම්කරුවෙකු නොවීය.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - මූල්‍ය	2025.03.16		2024.02.14 දින සිට මෙම තනතුර පුරප්පාඩු වූ අතර මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් හා අග්‍රාමාත්‍ය කමිටුවෙන් අනුමැතිය ලබා ගන්නා ලදි. 2025.03.16 වන දින කැඳවන ලද අයදුම්පත් සාමාන්‍යාධිකාරීතුමියගේ කාර්යාලයට ලැබී ඇත.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන	2018.10.04 2019.02.24 2019.09.08 2021.12.12	01 05 03 07	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය
	2020.09.20 2024.12.01	12 08	2021.12.01 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට පැමිණියේ නැත. සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

(ඇ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය.

තනතුර	පුවත්පත් දැන්වීම් පළ කළ දින	ලැබුණු අයදුම්පත් ගනන	බඳවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - තත්ත්ව පාලන	2019.05.26 2019.09.08	02 06	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය.
	2020.09.20	12	2021.12.01 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට පැමිණියේ නැත.
	2021.12.12	10	2022.03.29 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් බඳවා ගැනීමට සුදුසු අයදුම්කරුවෙකු නොවීය.
	2024.12.01	09	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය

ඉ. 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොත 3.4 (X) හා 2020 ඔක්තෝබර් 26 දිනැති කළමණාකරණ සේවා චක්‍ර ලේඛ අංකය 02/2020 හි VI ඡේදය

මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇත.

ඊ. නිළධාරින් කිප දෙනෙකුගෙන් මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරි නිළධාරින් විසින් මේ සම්බන්ධව ලිඛිතව අභියාචනයක් අමාත්‍යංශයේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ලබා දෙනු ලබන පිළිතුර මත ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා සිටිමු.

උ. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශය

වර්තමානයේ සිදු කරන ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කිරීම සිදු කරයි.

ඌ. 5.3 වගන්තිය

ආයතනයේ අවශ්‍ය අරමුදල් කළමණාකරණය කර ගනිමින් උපරිම වශයෙන් භාණ්ඩාගාරය වෙත ලබාදිය හැකි ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට ලබා දීමට කටයුතු කර ඇත.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

එ. 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රෙල්ඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ

i 2.6 ජේදය

මෙම තනතුරහි බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය පිරිවිතර සකස් කර, ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.

ii 3.2 ජේදය

2023 වර්ෂය වෙනුවෙන් පැවැත්විය යුතු වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීමක් පැවැත්වීමට නොහැකි වූයේ 2024 වර්ෂයේ පැන නැගුණු විවිධ තත්වයන් සහ 2024 සැප්තැම්බර් මස සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයක් නොමැති වීම වැනි කාරනා නිසාවෙනි. 2024 වර්ෂයට අදාලව මෙම රැස්වීම 2025 මාර්තු 25 වන දින පැවැත්වීමට කටයුතු සූදානම් කලත් මහාභාණ්ඩාගාරයේ සාමාජික මහතුන් හට සහභාගි වීමට නොහැකි වීම මත එය වෙනත් දිනයකට කල් තබන ලදී. ඉදිරියේදී මෙම රැස්වීම නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ

iii 3.2 ජේදය

ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සඳහා එක් එක් ක්‍රියාකාරකම සඳහා මූල්‍ය ඇස්තමේන්තු වටිනාකම සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය.

Iv 4.3 ජේදය

සමාලෝචිත වර්ෂයේ අවධානම් කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇති අතර අවසාන කාර්තුවේ අවධානම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. එනම් අදාල කාලය තුල අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර නොමැති වීමයි.

ඒ .2015 ජූනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

මේ සම්බන්ධයෙන් ලිඛිතව අනුමැතිය ඉල්ලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත ලියා ඇති අතර ඒ සඳහා තවමත් නිසි පිළිතුරක් ලැබී නොමැත. එසේම මේ අනුමැතිය සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂ ජනරාල්තුමාව හමුවී සාකච්ඡා කල අතර ඉදිරියේදී අනුමැතිය ලබා දීමට බලාපොරොත්තු වන බව දන්වන ලදී. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කටයුතු කරමින් සිටියි.

ඔ

i බද්ධ ව්‍යාපාර ඇති කර ගනු ලැබූ ආයෝජකයින්ගේ නිෂ්පාදනාගාර ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් අප විසින් නිරීක්ෂණය කරනු ලැබේ. උදාහරණයක් ලෙස, Greenthrough ආයතන විසින් ඔවුන්ගේ නිෂ්පාදනගාර ඉදිකිරීම් කටයුතු බැලීම සඳහා පැමිණෙන ලෙසට දැනුවත් කර තිබූ අතර අප විසින් එම ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කරන ලදි.

ii සැලකිල්ලට ගන්නා ලදි.
Medicom ආයතනය මිල කමිටු අනුමැතිය ලැබූ නිෂ්පාදන නියමාකාරයෙන් 2022 වර්ෂයේ සැපයුම් නොකරන ලදි. එම නිසා වෛද්‍ය සැපයුම් අංශයට අවශ්‍ය ඖෂධ නිසි පරිදි සැපයීමට නොහැකි වීම මත Medicom ආයතනයේ සැපයුම් කාර්ය සාධන මට්ටම ඉතා පහළ මට්ටමකට පත් වූ බැවින් ඔවුන්ගෙන් ඖෂධ මිලදී නොගන්නා ලදි.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2.2.4
අ .මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කෙටි පැහැදිල් කිරීමක් පහත දක්වමු.

ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ SEA මගින් නියමු ව්‍යාපෘතියක් ලෙස තත්ත්ව පාලන රසායනාගාරය වෙත නොමිලේ පිරිනැමුණු අති නවීන ලක්‍ෂණයන්ගෙන් හා ඉහළ කාර්යක්‍ෂමතාවයකින් යුතු AC පද්ධතිය පිහිටුවීමේ ව්‍යාපෘතියට අනුකූලව ඊට අනුග්‍රහයක් වශයෙන් හා එහිම අනු අංග ලෙස SPMC ආයතනය මගින් සිදු කිරීමට යෙදුණු අනු ව්‍යාපෘති පාදක කර ගෙන මෙම ප්‍රසම්පාදන කටයුතු සිදු විය.

මෙම මධ්‍යගත වායු සමිකරණ පද්ධතිය දැනට පවතින නවීනම අංගයන්ගෙන් සමන්විත එවකට USD 100,000.00 ක් (LRK 35,000,000.00) පමණ වටිනා වායු සමීකරණ පද්ධතියක්වූ අතර එය සියළු පාර්ෂවයන්ගේ අන්‍යෝන්‍ය සුහදතාවය සහ අවබෝධය මත පදනම්ව සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කරන ලද පරිත්‍යාගයක් විය.
ඉහත ප්‍රධාන ව්‍යාපෘතියට අදාලව SPMC ආයතනය මගින් සිදු කිරීමට ඉතිරිව තිබුණේ ඉතාම සුළු අවශ්‍යතා කිහිපයක් ඉටුකර දීම පමණි. ඒනම්,

01. සියළු කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
02. සිවිලිම ගලවා Ducting සඳහා ඉඩ ලබා දීම
03. ගැලපෙන නව සිවිලිමක් සවි කිරීම
04. Ducting සඳහා අවශ්‍ය විවර සාදා දීම හා සම්බන්ධ කටයුතු
05. අවශ්‍ය පරිදි විදුලිය හා අනෙකුත් පහසුකම් සැපයීම

ඒ අනුව මූලික ව්‍යාපෘතියට අමතරව සිදු කරන ලද අනු ව්‍යාපෘතීන් එක් විෂය පථයක් ලෙස ගෙන කරගෙන යාම අපහසු කටයුත්තක්වූ අතර එක් එක් සේවා සපයන්නන් විවිධ විය. ඒ අනුව මෙහිදී වෙනස්වූ සේවාවන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම කෙටි කාලීනව සිදුකිරීම ප්‍රායෝගිකව පහසු කාර්යයක් නොවිය.

ඒ අනුව ඉදිරියේදී මෙවැනි සේවාවන් ලබාගැනීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමු.

i ඉහත පැහැදිලි කළ පරිදි මෙම අනු ව්‍යාපෘතීන් හදිසි කටයුත්තක් ලෙස සිදුවූ බැවින්, මූල්‍ය ඌනතාව සඳහා මූල්‍ය අංශයේ අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සමගාමීව සිදු කර ඇත.

ii මෙම කටයුත්ත සඳහා ප්‍රධානය කිරීමේ ලිපිය 2024.02.02 දින යොමු කරන ලද අතර සම්පූර්ණ ව්‍යාපෘතිය 2024.02.08 දිනට පෙර නිම කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව මෙය ඉතාමත් හදිසි කටයුත්තක් ලෙස සිදුවූ බැවින් කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනිම මගහැරී ඇත.
ඒ අනුව ඉදිරියේදී මෙවැනි සේවාවන් ලබා ගැනීමේදී කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමු.

iii පූර්ව සුදුසුකම් ලෙස නාරම්මල සහ බදුල්ල ප්‍රදේශයේ කරන ලද ව්‍යාපෘති වල විස්තර ලංසු ලියවිල සමඟ ඉදිරිපත් කර ඇත. (File Folio – 22/52 – 22/53)
මෙම ලංසු කැඳවීම ඉතා හදිසි සහ අත්‍යාවශ්‍ය කටයුත්තක් වූ බැවින් හා ඉදිරිපත් කර තිබූ ලංසු දෙක අතරින් වසරක බැංකු ගිණුම් වාර්තා සැලකිල්ලට ගෙන මෙම ටෙන්ඩරය ප්‍රධානය කර ඇත.

iv මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය 2024.02.08 දිනට පෙර නිම කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව මෙය ඉතාමත් හදිසි කටයුත්තක් ලෙස සිදු වූ බැවින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් සකස් කොට අත්සන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොවීය.
ඒ අනුව ඉදිරියේදී මෙවැනි සේවාවන් ලබා ගැනීමේදී කොන්ත්‍රාත් ගිවිසුමක් සකසා අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමු.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2.3. වෙනත් කරුණු

අ. මේ සම්බන්ධයෙන් අදාල බද්ධ ව්‍යාපාර මගින් අයකර ගන්නා බව දන්වමින් ලිඛිතව දන්වා ඇත. විශේෂයෙන්ම වෛද්‍ය සැපයීම් අංශයෙන් අයකර ඇති මෙම අයකිරීම් නැවත පරීක්ෂා කර අදාල අයකර ගැනීමේ ප්‍රමාණයන් හැකි ඉක්මනින් ලිඛිතව දන්වා අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. එසේම 2025 වර්ෂය වෙනුවෙන් අදාල අයකර ගැනිම් මේ වන විට අයකර ගෙන ඇත

ආ. මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් කරන ප්‍රමාණය අනුව ආයතනයේ අවශ්‍යතාවය මත අදාල මුදල් කළමණාකරනය කර ගනිමින් හැකි උපරිම ආකාරයෙන් අදාල ගෙවීම් බද්ධ ව්‍යාපාර අතර බෙදාහැරිමට කටයුතු කරනු ලැබේ. ඉදිරියේදි භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන ආකාරය අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය මුදල් කළමණාකරනය කර ගනිමින් අදාල ගෙවිය යුතු ශේෂයන් උපරිම වශයෙන් අවම කිරිමට කටයුතු කරනු ලැබේ.

ඇ. 2024 වසරේ ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී භෞතිකව නොතිබුණු ස්ථාවර වත්කම් සැබෑ ලෙසෙම නොතිබී ඇත්දැයි නැවත පරීක්ෂාවට ලක්කල යුතු අතර ඇතැම්විට ස්ථාවර වත්කම් අංක ගැලවී යාම හා ස්ථාවර වත්කම් නිසි ලෙස මාරු කිරීම යාවත්කාලීන නොකිරීම නිසාවෙන් සිදු වූ අතපසු වීමකින් භෞතිකව සමීක්ෂණයට ලක් නොවිය හැක. වත්කම් හඳුනාගැනීමේ අංක ගැලවී නොයන ලෙස නව ක්‍රමවේදයක් භාවිතා කිරීමට සැලසුම් කරමින් සිටින අතර ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඈ. කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුලත් පරිපාලන ගොඩනැගිල්ල වෙනුවෙන් මේ වන තෙක් රු. 27,550,136 ක් වැය කර ඇති අතර මෙම පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් ඉහල කළමණාකරණය මගින් නිශ්චිත තීරණයක් ගෙන නොමැති බැවින් ඉදිරියේදී පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමටද ඉඩ ප්‍රස්ථා ඇති අතර පරිපාලන ගොඩනැගිල්ල කෙරීගෙන යන වැඩ ගිණුම තුල පවත්වා ගත යුතුය.

ඊ. 2024 වර්ෂයේ වෛද්‍ය සැපයීම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලද රු. 25,780,890,000.00 සැපයුම් ඉන්වොයිස් වලට අදාල බිල්පත් නිරවුල් කිරිම නිවැරදිව ගිණුම් ගත කර ඇත. එනම් 2024 වර්ෂය සඳහා 96% ක් පමණ බිල්පත් නිරවුල් කිරීම් හදුනාගෙන ඇති අතර ඉතිරි සුළු ප්‍රමාණයකට පමණක් බිල්පත් නිරවුල් කිරීම් ලැබි නොමැත. 2024 වර්ෂයට අදාලව ණයගැති කාල විශ්ලේෂණයක් පිළියෙල කල හැකි අතර 2024 වසර අවසාන ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් සිදු කල නොහැක්කේ 2023 වසර සඳහා රු. 19,452,851,018.67 ක ඉන්වොයිස් වටිනාකම් වලට අදාලව බිල්පත් තවමත් නිරවුල් කල නොමැති නිසාවෙනි. මෙම බිල්පත් නිරවුල් කර ගැනීමට දිගින් දිගමට වෛද්‍ය සැපයීම් අංශය සමඟ කටයුතු කරගෙන යමින් පවතී.

උ. පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් සංවර්ධනය කර වාණිජ නිෂ්පාදනය සඳහා 2023 වර්ෂයේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලබා ගැනිම සඳහා යොමු කරන ලද ඖෂධ 12 න් 04 ක් සඳහා අනුමැතිය 2024 වර්ෂයේ දී ලැබුණි. එම ඖෂධයන් නම්,

1. Celecoxib Capsule 200 mg
2. Montelukast Tablets 5 mg
3. Montelukast Tablets 10 mg
4. Methyl Prednisolone Tablets 4 mg

ඉතිරි ඖෂධ 08 න් Levetiracetam Tablets USP 250 mg ඖෂධය සඳහා මේ වන (2025 වර්ෂයේදී) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලැබී ඇත.

2024 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

ඉතිරි ඖෂධයන් 07 න් කිහිපයක ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන ලියකියවිලි මේ වන විට සංස්ථාව විසින් NMRA වෙත යොමු කර ඇත. තවද ඉතිරි ඖෂධයන්හි ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන ලියකියවිලි සංස්ථාව විසින් තවමත් සකස් කරමින් පවතින අතර කඩිනමින් එම ලියකියවිලි සකස් කොට NMRA අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

ඌ. මෙම ඖෂධයන්හි ලියාපදිංචිය ප්‍රමාද වූ නිසාවෙන් 2024 දෙසැම්බර් මාසයේ ලබා දීමට නොහැකි වූ ඇණවුම් ප්‍රමාණය 2025 ජනවාරි මස වන විට ලබා දීමට හැකි විය.

එ. Clopidogrel Tablets USP 75 mg ඖෂධයේ සූත්‍රය සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

ඒ. පෙනිසිලින් කලාපය තුල නව ප්‍රතිජීවක නිෂ්පාදනය කිරීම තව දුරටත් අධ්‍යයනය කිරීමට සිදු වේ. Co – Amoxiclav ඖෂධය නිෂ්පාදනය සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

ඔ.වෛද්‍ය සැපයුම් අංශය විසින් 2024 වර්ෂය සඳහා Tramadol Capsules 50mg අයිතමයට අදාලව 2024/SPM/N/R/P/00029 අංකය යටතේ පෙති මිලියන 7.5 ක ඇණවුමක් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ලබා දී තිබිණ. එමෙන්ම, මෙම ඇණවුමට අදාලව නිෂ්පාදන අංශය වෙතින් ලද නිමි තොග ඒකක මිලියන 5.256 ක ප්‍රමාණයක් වෛද්‍ය සැපයුම් අංශයට සපයන ලදී.

තවද, මෙලෙස වෛද්‍ය සැපයුම් අංශයේ ඇණවුමට අදාල සැපයුම් ඉල්ලා ඇති කාල රාමුවෙන් ප්‍රමාද වී සැපයුම් කිරීම මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට දඩ මුදල් ගෙවීමට සිදුවීම සංස්ථාවට අවාසිදායක වන බව සත්‍ය නමුත් වෛද්‍ය සැපයුම් අංශයෙන් වර්ෂය සඳහා ලබා දෙන ඇණවුම් සියල්ලෙහි සැපයුම් කාලරාමුන් සලකා බැලීමේදී ඒවායෙහි ඉල්ලා ඇති මාසික සැපයුම් ප්‍රමාණයන් සංස්ථාවේ මාසික නිෂ්පාදන ධාරිතාවයන්ට අනුකූල නොවීම හා අප නිෂ්පාදනාගාරය තුල සිදු කරනු ලබන නිෂ්පාදන කළඹ නිෂ්පාදනය කිරීමේදී ඇති වන යම් යම් ගැටළුන් මේ සඳහා හේතු වනු ලබයි.
එබැවින්, ඇණවුම් ලබාදීමේදී ඒවායෙහි සැපයුම් කාල රාමුන් මාසික හා සාධාරණ පදනමකට ලබා දෙන ලෙස වෛද්‍ය සැපයුම් අංශයෙන් ඉල්ලා ඇති අතර සංස්ථාවේ සියළු අංශයන්හි සාමුහික වගකීමක් සේ සලකා මෙම ඇණවුම් අදාල කාල රාමුන් තුලදීම සැපයීමට කටයුතු කිරීමට අපේක්ෂා කරමු.

ඕ. Metformin BP 500 mg ඖෂධය 2025 වර්ෂයේදී නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

ක. තොගය නැවත ප්‍රතිස්ථාපනය කරදීමට සැපයුම්කරු එකඟ වී ඇති අතර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙම ක්‍රියාවලියෙහි අවසාන අදියර ලෙස සැපයුම්කරුගේ රටෙහි රේගු නිෂ්කාශනයට අදාල අනුමැතීන් ලබා ගනිමින් පවතින බව දන්වා ඇත.

ච. 2020 වසරේ Covid-19 වසංගතය ඉතා උග්‍රව පැතිර ගිය අතර ලොව පුරා Chloroquine Phosphate BP 250mg යන ඖෂධය Covid-19 වසංගතය සඳහා භාවිතා කිරීමට නිර්දේශ විය. ඒ වන විට අප සතුව පැවති Chloroquine Phosphate අමුද්‍රව්‍ය තොගය භාවිත කරමින් ඉතා කෙටි කාලයක් ඇතුලත Chloroquine Phosphate BP 250mg පෙති මිලියන පහක ප්‍රමාණයක් නිෂ්පාදනය කර රටේ අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දීමට අපට හැකි විය.

Covid-19 වසංගතය සඳහා Chloroquine Phosphate ඖෂධය භාවිතා කිරීමට නිර්දේශ කිරීමත් සමගම මෙම Chloroquine Phosphate අමුද්‍රව්‍ය සඳහා ලෝක වෙළඳපලේ පැවති ඉල්ලුම ඉතා ඉහළ ගිය අතර ලංකාවාසී ජනතාව වෙනුවෙන් මෙම ඖෂධය ලබා දීමේ වගකීම අප සංස්ථාව සතු බව විශ්වාස කරමින් වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි, 600kg ක ප්‍රමාණයක් ඉක්මණින් ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කළෙමු. මෙලෙස ප්‍රසම්පාදනය කරණ ලද්දේ, එවැනි වසංගත අවස්තාවක රටේ ජනතාවට අප විසින් කළ යුතු මෙහෙය නොපිරිහෙලා ඉටු කිරීමේ උදාර අරමුණෙනි.

නමුත් බලාපොරොත්තු වූ ආකාරයට මෙම ඖෂධය භාවිතා නොවීම නිසා මෙම තොගය භාවිතා කළ නොහැකි විය.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

මෙම තොගය නැවත ප්‍රති අපනයනය කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස IPCA Laboratories – India (19/01/2021, 27/02/2023) ආයතනය වෙත දන්වා ඇත. එමෙන්ම මෙම තොගය හෝ එහි නිෂ්පාදන United Nations Children Fund – Thailand (29/06/2020) වෙත ලබා දීමේ ඇති හැකියාව සොයා බලන ලෙසද ඉල්ලීම් කර ඇත.

එමෙන්ම මෙම නිෂ්පාදිත ඖෂධ හෝ අමුද්‍රව්‍ය තොගය දේශීය හෝ විදේශීය පාර්ශවයකට අවශ්‍ය නම් එය සම්බන්ධීකරණය කර දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයේ අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා) වෙත ඉල්ලීම් කර ඇති අතර ෆිජි දූපත් රටක් සඳහා ප්‍රදානයක් ලෙස ලබාදීමේ ඇති හැකියාව සොයාබලමින් පවතින බව අප හට දන්වා තිබුණි.

මෙම කිසිදු ඉල්ලීමකට සුභවාදී පිළිතුරක් මෙතෙක් ලැබී නැත.
තවද මෙම Chloroquine Phosphate අමුද්‍රව්‍ය සක්‍රිය ඖෂධ කාරකයක් වන බැවින් වෙනත් ඖෂධ නිෂ්පාදනයන් සඳහා භාවිතා කළ නොහැකිය.

ජ. 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ සමස්ථ නිෂ්පාදනය පෙති / කරල් මිලියන 387.8 අඩු වී ඇත. මෙයට මූලික හේතු වන්නේ 2024 වර්ෂයේදී පෙනිසිලීන් අංශයේ ගොඩනැගිල් හා යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා (ලෝක බැංකු ආධාර යටතේ) මාස කිහිපයක් වසා තැබීම හා 2024 දී නිෂ්පාදන අංශයේ පුහුණු සේවකයන් 12 දෙනෙකු සේවයෙන් ඉවත් වීමයි. (පුහුණු වන සේවකයින් 02 ක් ද සේවයෙන් ඉවත් විය) නිෂ්පාදන අංශයේ පුහුණු සේවකයන් ඉවත් වූ පසු නවක බඳවා ගන්නා සේවකයින් හට වසර 1 ½ පුහුණු කාලයක් පවතින බැවින් සේවකයන් කිහිපදෙනෙකු ඉවත්ව ගිය විට එම අඩුව නිෂ්පාදන කටයුතු වලට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

සමහර ඖෂධ වර්ග නිපදවීම අඩු වීමට අමුද්‍රව්‍ය හිඟය (Paracetamol Tablets 500 mg) හා තාක්ෂණික කරුණු (Cetirizine 10 mg, Prednisolone 5 mg, Bisoprolol 5 mg, Ciprofloxacin 250 mg, Ciprofloxacin 500 mg) බලපෑමක් ඇති කරන ලදි. Levothyroxine Tablets 50 mcg සඳහා ලැබුණු ඇණවුම් අඩුවීම නිසා නිෂ්පාදනය කල ප්‍රමාණය අඩු කරන ලදි.

ඒසේම ඉල්ලුම වැඩි සමහර ඖෂධ වර්ග (Omeprazole 20 mg, Amoxicillin 250 mg, Amoxicillin 500 mg) වැනි ඖෂධ 2023 වර්ෂයට සාපේක්ෂව වැඩියෙන් නිපදවා ඇත.

ඒසේම 2023 වර්ෂයේදී නිෂ්පාදන නොකල Indomethacin 25 mg, Metronidazole 200 mg, Rosuvastatin Tab. 10 mg වැනි ඖෂධ 2024 දී නිපදවන ලදි.

2023 දී නිපදවූ පෙති මිලියන 3559.92 SPMC ඉතිහාසයේ වසරකට නිපදවන ලද වැඩිම ඖෂධ ප්‍රමාණය වේ. 2018 දී JICA ආධාර යටතේ ඖෂධාගාරය වැඩි දියුණු කිරීමේදී වාර්ෂික නිෂ්පාදන ධාරිතාව මිලියන 3200 පමණ ලෙස දැක්විනි. (Plant Capacity) එබැවින් මිලියන 4020 ක ඉලක්යක් යනු දැනට පවතින තත්තවයන් යටතේ ලඟාවීමට ඉතා අපහසු ඉලක්කයනි. එහෙත් 2023 වසර අවසානයේ පැවති තත්ත්වය පදනම්ව මෙම ඉලක්කය තීරණය විය.

ට. මෙම කාල පරිච්ඡේදය තුළ හඳුන්වා දෙන ලද නව ඖෂධ අතරින් සමහර ඖෂධ වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාව සඳහා පමණක් නිෂ්පාදනය කරනු ලබන අතර පුද්ගලික වෙළඳපල තුල මෙම ඖෂධ සඳහා ඉල්ලුමක් නොමැත.
උදා :- Nimodipine Tablets 30mg
Prednisolone Tablets 1mg

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

තවත් සමහර අයිතම සඳහා වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාවක් නොමැති අතර පුද්ගලික වෙළඳපල පමණක් ඉල්ලුම පවතී. නමුත් පුද්ගලික වෙළඳපල ඉල්ලුම blister ඇසුරුම් සඳහා වන අතර දැනට අප සතු blister ඇසුරුම් යන්ත්‍ර මේ සඳහා ප්‍රමාණවත් නොවන හෙයින් මෙම අයිතමයන් සඳහා වෙළඳපල දැනට පවතින ඉල්ලුමද සැපයීමට නොහැකි වී ඇත.
උදා :- Rosuvastatin Tablets 5mg
Sitagliptine Tablets 50mg
Loratadine Tablets 10mg
Cetirizine Tablets 10mg
Losartan Potassium Tablets BP 25 mg
Mefenamic acid Tablets BP 500 mg

ඩ වාර්ෂිකව බිලියන 3.1 කට වඩා ඖෂධ නිපදවීම යනු එක ඖෂධ Lot එකක් පෙති මිලියන 1.5 ලෙස සැලකූ විට (උපකල්පනයකි. සාමාන්‍ය ලෙස 0.5 m සිට 2.8 m දක්වා විචලනයවේ.) වසරකටය Lot 2066 නිපදවා ඇත. එයින් අවස්ථා 14 යනු 0.67% වැනි ප්‍රතිශතයකි.

ප්‍රති නිෂ්පාදන (Rework) වලට ප්‍රධාන හේතුව වන්නේ මිශ්‍රණයේ හැසිරීම් රටාව වරින් වර වෙනස් වීමය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ අමුද්‍රව්‍ය වල හැසිරීම වෙනස් වීමයි.

SPMC ආයතනය tender මඟින් අමුද්‍රව්‍ය මිලදී ගැනීම නිසා අමුද්‍රව්‍ය නිරත වෙනස්වේ. වෙනත් ඖෂධ නිෂ්පාදනාගාර තුල මෙවැනි තත්ත්වයන් ඇති නොවේ. මෙවැනි පරිසරයක 0.67% ඖෂධ ප්‍රමානයක් පමණක් ප්‍රති නිෂ්පාදනය කිරීමට සිදු කිරීම ඉතා හොඳ තත්ත්වයක් සේ සැලකිය හැක.
අමුද්‍රව්‍ය සපයන ආයතනය නොවෙනස්ව පවතී නම් මීට වඩා ප්‍රති නිෂ්පාදන (rework) අඩුකර ගත හැක.

ණ. 25% ක් වන මෙම පරිපාලන ගාස්තුව සම්බන්ධව බද්ධ ව්‍යාපාර ගිවිසුමට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.

ත. සියලු කරුණු සැලකිල්ලට ගන්නා ලදි. එසේම ඉදිරියේදී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කරණු ලබන අතර ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට අමාත්‍යාංශ උපදේශන කමිටුව මඟින් කමිටුවක් පත් කරන ලදි. එම පත් කරන ලද කමිටුවෙහි නිර්දේශ සහ උපදෙස් පරිදි ඉදිරියේදි ශක්‍යතා අධ්‍යනයක් සිදු කොට වාර්තාවක් සකස් කිරීමට බලාපොරොත්තු වේ.

ද. සියලු කරුණු සැලකිල්ලට ගන්නා ලදි. එමෙන්ම එහි තිබෙන ශ්‍රවනාගාර පුටු රජයේ විශ්ව විද්‍යාලයකට ලබා දීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරගෙන යනු ලැබේ. එසේම වර්තමානයේ තාවකාලිකව ගබඩාවක් වශයෙන් භාවිතා කරනු ලබයි.

න. නව සිසිලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ (SHLPC – Standing High Level Procurement Committee) අනුමැතියට යටත්ව තාක්ෂණික හා මූල්‍ය ලංසු කැඳවීම් කරන ලදි. තාක්ෂණික ලංසු විවෘත කරන ලද අතර එමඟින් මූලික තාක්ෂණික සුදුකම් සපුරණ ලද ලංසුකරුගේ, මූල්‍ය ලංසුවද 2025.04.23 වන දින විවෘත කරන ලදි. එම මූල්‍ය ලංසුවෙහි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් සිදු කොට ටෙන්ඩරය ප්‍රධානය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට SHLPC වෙත යොමු කිරීමට නියමිතව ඇත.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

NMRA විසින් සිදු කල නිරීක්ෂණ වාර්තාවේ, පවතින සිසිලන පද්ධතියේ දුර්වලතාවයන් පෙන්වා දී ඇතැයි දක්වා තිබෙන කාරණය සම්පූර්ණයෙන්ම සාවද්‍ය නිරීක්ෂණයකි. එනම් ඔවුන් සඳහන් කර ඇත්තේ වායු මෙහෙයුම් ඒකක (Air Handling Unit – AHU) පිරිසිදු කිරීමේ හා ආදේශ කිරීමේ (cleaning & replace) ක්‍රියාවලිය සඳහා සම්මත මෙහෙයුම් පටිපාටියක් (Standard Operating Procedure) ඇති බවත් (SPMC/SOP/ENG/005) එයට අනුව HEPA filters හි අඛණ්ඩතාවය පරීක්ෂා කිරීම කලයුතු බවත් (HEPA filter integrity should be checked) නමුත් පවතින පද්ධතියේ එවැන්නක් නොමැති බවත්ය (But it is not in place due to central HEPA filters of old HVAC system).

මෙහිදී අප විසින් සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) සඳහා HEPA filter integrity should be checked ලෙස දක්වා ඇත්තේ ඉදිරියේදී ස්ථාපනය කරනු ලබන පද්ධතිය සඳහාද ගැලපෙන අයුරින් මෙම පිරිසිදු කිරීමේ හා ආදේශ කිරීමේ (cleaning & replace) ක්‍රියාවලිය සිදු කලයුතු බැවිනි. NMRA විසින් එය කඩිනමින් නිවැරදි කලයුතු බවට නිර්දේශ ලබා දී නැත (ඇමුණුම 22). එනම් මෙම නව සිසිලන පද්ධතිය ස්ථාපනය කලත් දැනට පවතින වායු මෙහෙයුම් ඒකක (Air Handling Unit – AHU) වෙනස් කිරීමක් සිදු කලයුතුව නැත. දැනට තිබෙන වායු මෙහෙයුම් ඒකක තවත් වසර කීපයක් භාවිතා කල හැක.

සිසිලන පද්ධතිය පිළිබඳව සවිස්තරාත්මක පිළිතුරක් MSU/C/SPMC/BC/2023/AQ-41 දරණ විගණන විමසුම මඟින් ඉදිරිපත් කර ඇත.

ප. 2025 වර්ෂය තුලදී සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය තුලින් දක්වන දායකත්වය වැඩි කිරීමට සැලසුම් කර ඇත.

බ. SPMC Pacidol අයිතමය සඳහා වෙළඳපොල පවතින ඉල්ලුම මත 2024 වර්ෂය සඳහා අලෙවි කිරීමට ඇසුරුම් ඒකක 720,000 ඇස්තමේන්තු කරන ලදී. නමුත්, මෙම Pacidol අයිතමය Blister ඇසුරුම් කරනු ලබන යන්ත්‍රයේ තවත් අයිතම 08ක් පමණ ඇසුරුම් කරනු ලබයි. එබැවින්, 2024 වර්ෂය තුළ Pacidol අයිතමයෙන් ඇසුරුම් කර වෙළඳපොලට අලෙවිය සඳහා ලැබී ඇත්තේ ඇසුරුම් ඒකක 114,150ක් වන අතර එම සම්පූර්ණ ප්‍රමාණය වර්ෂය තුළ අලෙවි කර ඇත.

තවද, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රවර්ධන කටයුතු සඳහා SPMC නිෂ්පාදන මිශ්‍රයෙහි ඇති OTC ඖෂධයන් වන Pacidol ඖෂධයෙහි නාමය බොහෝවිට භාවිතා කරනු ලබන අතර මෙය හුදෙක්ම Pacidol ප්‍රවර්ධනය සඳහා නොවන අතර SPMC නාමය (Image) ප්‍රවර්ධනය කිරීමද සිදු වේ.

ම. 2024 වර්ෂය හා සැසඳීමේදී 2025 වර්ෂය තුල Ciprofloxacin Tablets USP 500 mg ඖෂධයේ වැඩි වීමක් වී ඇත. උදාහරණයක් ලෙස Ciprofloxacin ඉදිරියේදී වැඩියෙන් නිෂ්පාදනය කිරීමට කටයුතු කරනු ලබයි. තවද Ciprofloxacin නිෂ්පාදන

වාර්ෂික නිෂ්පාදනය

වර්ෂය	Ciprofloxacin 250 mg	Ciprofloxacin 500 mg
2021	1.5	0
2022	3.0	4.0
2023	8.75	10.0
2024	0	2.4
2025	7.5	3.6

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

මේ අනුව Ciprofloxacin ඖෂධය වර්ෂයකට නිෂ්පාදනය කල හැකි ප්‍රමාණ දැක්විය හැක. (එය ඉතා කුඩා අගයන් වේ.)

මෙම අමුද්‍රව්‍ය 2025 මුල් මාස දෙක තුලදී භාවිතා කර Ciprofloxacin 250 mg මිලියන 7.5ක් හා Ciprofloxacin 500 mg මිලියන 3.6 නිපදවන ලදි.

මෙම ඖෂධ නිපදවීම තාක්ෂණික වශයෙන් ඉතා අසීරු අතර එම කර්තව්‍යය සඳහා සහභාගී කර ගත්තේ පළපුරුදු සේවකයන් කිහිප දෙනෙකු පමණි. නැතහොත් මෙම පෙති යන්ත්‍රයේ ඇලීම, කැඩී යාම වැනි හේතු නිසා නිෂ්පාදන කටයුතු සඳහා වැඩි කාලයක්, ශ්‍රමයක් අවශ්‍ය වන අතර ප්‍රතිනිෂ්පාදන සම්භාවිතාවයද වැඩිවේ. 2024 වර්ෂයේදී පුහුණු සේවකයන් 12 දෙනෙකු ඉවත්ව යාම නිසා ඇතිවූ පුරප්පාඩුව හේතුවෙන් කුමන ඖෂධ සඳහා ප්‍රමුඛතාවය දෙන්නේද යන්න තීරණයක් ගත යුතුව තිබිණි.

එහිදී MSD (වෛද්‍ය සැපයුම් අංශය) ඇණවුම් සඳහා සපයන ඖෂධ වලට ප්‍රමුඛතාවය ලබා දෙන ලදි. 2024 වර්ෂය සඳහා Ciprofloxacin 250 mg හා Ciprofloxacin 500 mg සඳහා MSD ඇණවුම් නොතිබූ පසුබිමක මෙම ඖෂධ නිෂ්පාදනයට ප්‍රමුඛතාවය ලබා දී නොමැත. එහෙත් මෙම අමුද්‍රව්‍ය සියල්ල 2025 වර්ෂය තුලදී භාවිතා කිරීමට සැලසුම් කර දැනටමත් නිෂ්පාදන කටයුතු ද සිදු කර ඇත.

ය.

සේවා ගණය	තනතුර	පුරප්පාඩු	වර්තමාන තත්වය
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන	1	2024.12.01 දින අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය.
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ත්ව පාලන	1	2024.12.01 දින අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය.
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි	1	2025.04.01 දින බඳවා ගන්නා ලදි.
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන	1	2024.12.01 දින අයදුම්පත් කැඳවා ඇත.
MM 1-1	කළමණාකරු -නිෂ්පාදන	1	බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතය
MM 1-1	කළමණාකරු - තත්ත්ව පාලන	1	2025.02.03 වන දින බඳවා ගන්නා ලදි.
MM 1-1	කළමණාකරු - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන	1	2025.02.03 වන දින බඳවා ගන්නා ලදි.
MM 1-1	කළමණාකරු - තොරතුරු තාක්ෂණ	1	SOR අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
MM 1-1	කළමණාකරු - පුහුණු හා සංවර්ධන	1	SOR අනුමැතියසඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
MM 1-1	නීත නිලධාරී	1	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
MM 1-1	කළමණාකරු -නිරාපද	1	SOR අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
MM 1-1	කළමණාකරු - තත්ත්ව සහතික	1	SOR අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

JM 1-1	මූල්‍ය නිලධාරී	1	2025.03.03 දින බඳවා ගන්නා ලදි.
JM 1-1	අභ්‍යන්තර විගණන නිලධාරී	1	2024.03.01 දින බඳවා ගන්නා ලදි.
JM 1-1	අලෙවි නිලධාරී	2	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
JM 1-1	ඖෂධ තාක්ෂණඥ (සැලසුම් හා ප්‍රසම්පාදන)	1	2024.03.01 දින බඳවා ගන්නා ලදි.
JM 1-1	තත්ත්ව පාලන නිලධාරී	1	2025.01.15 දින බඳවා ගන්නා ලදි.
JM 1-1	ඖෂධ තාක්ෂණඥ (නිෂ්පාදන)	3	2024.03.01 දි තනතුරු 2ක් බඳවා ගන්නා ලද අතර 2025.02.03 තනතුරු 1ක්සඳහා බඳවා ගන්නා ලදි.
JM 1-1	සහකාර ඉංජිනේරු	1	2025.03.03 දින බඳවා ගන්නා ලදි.
JM 1-1	පරිපාලන නිලධාරී	1	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
JM 1-1	පෞද්ගලික ලේකම්	1	2024.12.01 දින අයදුම්පත් කැඳවා ඇත. සුදුසුකම් ලැබූ අයදුම්පත් නොතිබුණු අතර නැවත වරක් අයදුම්පත් කැඳවීමට නියමිත වේ.
JM 1-1	ඉංජිනේරු සහකාර (පරිගණක අංශය)	1	SOR අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
MA 2-1	ඖෂධ තාක්ෂණ ශිල්පී (නිෂ්පාදන)	9	2024.07.15 දින බඳවා ගන්නා ලදි
MA 2-1	ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පී	6	2025.03.16 දින අයදුම්පත් කැඳවා ඇත.
MA 2-1	තත්ත්ව පාලන තාක්ෂණ ශිල්පී	4	2024.07.15 දි බඳවා ගන්නා ලදි.
MA 2-1	නඩත්තු තාක්ෂණ ශිල්පී	5	2024.01.01 එක් නතුරක් සඳහා බඳවා ගන්නා ලදි. අනෙක් තනතුරු සඳහා 2024.01.28 අයදුම්පත් කැඳවූ අතර කිසිවෙකු තරග විභාගය සමත් නොවූ බැවින් නැවත 2024.12.01 අයදුම්පත් කැඳවීය.
MA 2-1	ගබඩා භාරකරු	2	අග්‍රාමාත්‍ය කමිටුව වෙතින් බඳවා ගැනීමට අනුමැතිය 2025.02.28 දින ඉල්ලා ඇත.
MA 2-1	තාක්ෂණික සහකාර	4	2025.03.16 දින අයදුම්පත් කැඳවා ඇත.
MA 2-1	පොත්ත බන්නා	1	2025.01.20 දින බඳවා ගන්නා ලදි.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

MA 2-1	තොරතුරු තාක්ෂණ ශිල්පී (බහුමාධ්‍ය)	1	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
MA 2-1	බොයිලර් ක්‍රියාකරු සහ උපයෝගීතා තාක්ෂණ ශිල්පී	2	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
MA 2-1	හෙද නිලධාරී	1	2024.07.21 දින අයදුම්පත් කැඳවා බඳවා ගැනීමේ තරග විභාග පැවැත්වීමට කටයුතු යොදා ඇත.
MA 1-1	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	11	8 දෙනෙකු බඳවා ගන්නා ලදි.
PL 3	රියදුරු	3	දෙදෙනෙක් බඳවා ගන්නා ලදි.
PL 2	ඖෂධ නිමාකිරීමේ සහායක	4	2024.12.16 දින බඳවා ගන්නා ලදි.
PL 2	රසායනාගාර සහායක	2	අවශ්‍යතාවය අනුව බඳවා ගැනීමට නියමිතය.
PL 1	වැඩ සහායක	10	එක් තනතුරක් සඳහා 2024.04.18 දින බඳවා ගන්නා ලදි. අනෙක් තනතුරු සඳහා 2024.07.21 දින අයදුම්පත් කැඳවා ඇත.

ර. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා අනුමත සෑම තනතුරක් වෙනුවෙන්ම එක් බඳවා ගැනීමේ පරිපාටියක් අනුව කටයුතු කරන බව තරයේ ප්‍රකාශ කරමි. කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 ප්‍රකාරව රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමේ පරිපාටිය 2013.03.28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇත. මෙම අනුමැතිය ලැබීමෙන් පසු 2013.11.07 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පරිපාටියේ නව ආදර්ශයක් හඳුන්වා දී ඇත. 2013 වර්ෂයෙන් පසුව අනුමත කර ගත් සියලු නව තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගැනීමේදී 2013 වර්ෂයේදී හඳුන්වා දී ඇති නව ආදර්ශය අනුව පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇත.

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

සේවා ගණය	තනතුර	බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ඇති දිනය
PL - 1	වැඩ සහාය	2022.12.28
PL - 2	ඖෂධ නිමාකිරීමේ සහායක රසායනාගාර සහායක	2022.12.28
PL - 3	රියදුරු	2022.07.20
MA 1-1	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	2022.08.22
MA 2-1	පොත් බැඳුම්කරු තත්ත්ව පාලන තාක්ෂණ ශිල්පී තාක්ෂණික සහකාර නඩත්තු තාක්ෂණ ශිල්පී ඖෂධ තාක්ෂණ ශිල්පී (නිෂ්පාදන) සැලසුම් හා ප්‍රසම්පාදන සහකාර ගබඩා භාරකරු පරිගණක දෘඩාංග තාක්ෂණ ශිල්පී තොරතුරු තාක්ෂණ ශිල්පී (බහුමාධ්‍ය) ඖෂධ නිමාකිරීමේ තාක්ෂණ ශිල්පී බොයිලර් ක්‍රියාකරු හා උපයෝගිතා තාක්ෂණ ශිල්පී හෙද නිලධාරී	2024.02.29
MA 2-1	තත්ත්ව සහතික සහකාර	2024.06.20
JM 1-1	තත්ත්ව පාලන නිලධාරී ඖෂධ තාක්ෂණඥ (නිෂ්පාදන) ඖෂධ තාක්ෂණඥ (සැලසුම් හා ප්‍රසම්පාදන) සහකාර ඉංජිනේරු අලෙවි නිලධාරී පරිපාලන නිලධාරී පුද්ගලික ලේකම් අභ්‍යන්තර විගණන නිලධාරී පද්ධති විශ්ලේෂක	2013.03.28
	ප්‍රවාහන නිලධාරී පුහුණු හා සංවර්ධන නිලධාරී මානව සම්පත් නිලධාරී	2018.02.26
	රසායනඥ	2022.02.21
	තත්ත්ව සහතික නිලධාරී නියාමන කටයුතු නිලධාරී	2022.03.23
	ක්ෂුද්‍රජීවවේදී	2024.06.20

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

MM 1-1	කළමණාකරු - තත්ත්ව පාලන කළමණාකරු - නිෂ්පාදන කළමණාකරු - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන කළමණාකරු - ඉංජිනේරු (යාන්ත්‍රික) කළමණාකරු - ඉංජිනේරු (විද්‍යුත්) කළමණාකරු - සැලසුම් හා ප්‍රසම්පාදන කළමණාකරු - අලෙවි කළමණාකරු - මූල්‍ය කළමණාකරු - මානව සම්පත් හා පරිපාලන අභ්‍යන්තර විගණක	2013.03.28
	කළමණාකරු - ඉංජිනේරු (ඉලෙක්ට්‍රොනික්)	2018.02.26
	නීති නිලධාරී	2022.06.27
	කළමණාකරු - තොරතුරු පද්ධති කළමණාකරු - තත්ත්ව සහතික කළමණාකරු - පුහුණු හා සංවර්ධන	බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති නමුත් මෙතෙක් අනුමත වී නැත.
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- නිෂ්පාදන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- තත්ත්ව පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ඉංජිනේරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් හා ප්‍රසම්පාදන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු,පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි	2013.03.28 බඳවා ගැනීම් පරිපාටිය අනුමත වී ඇති අතර බාහිර අයදුම්කරුවන්ගේ පළපුරුද්ද 2014.11.05 වන දින වසර 12ක් ලෙසත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ පළපුරුද්ද 2015.01.05 දින MM 1-1 ශ්‍රේණිය I වසර 2ක පළපුරුද්ද ලෙස සංශෝධනය වී ඇත.
HM 1-1	සාමාන්‍යාධිකාරී	2013.03.28

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

2016.07.12 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ PL -1 සේවා ගණයේ සිට HM 2-1 සේවා ගණය දක්වා අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ බඳවා ගැනීමේ සුදුසුකම් 2013 බඳවා ගැනීමේ පරිපාටියේ ආදර්ශය අනුව සංශෝධනය කර ඇත.

වසරක් පාසා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සේවකයින්ට පැවැත්වීමට පෙර එම සේවකයන් සඳහා පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන අතර එහිදී අනිවාර්ය අංගයක් ලෙස බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කරනු ලැබේ. එසේම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධිත ආදර්ශය අනුව අප සංස්ථාවේ පැවති බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය ආරම්භ කිරීමට පෙර එවකට සිටි කළමණාකාර අධ්‍යක්ෂතුමා, සාමාන්‍යාධිකාරීතුමිය ඇතුළු සියළු අංශ ප්‍රධානීන් දැනුවත් කර ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගෙන එම අදහස්ද ඇතුලත් කරමින් එවකට සිටි වෘත්තීය සමිති නිලධාරීන් හා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔවුන්ගේ අදහස් හා යෝජනාද ලබා ගෙන ඒ අනුව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. එදින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් වරින් වර කොටස් වශයෙන් අනුමැතිය ලැබී ඇත.

අනුමැතිය ලැබී ඇති ආකාරය පිළිබඳ විස්තර ඉහත සඳහන් කර ඇත. මේ වන විට JM 1-1, MM 1-1, HM 1-1 හා HM 2-1 තනතුරු සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කර ඇනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර JM 1-1 හා , MM 1-1 බඳවා ගැනීමේ පරිපාටියේ තවදුරටත් සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳ 2025.03.21 හා 2025.03.28 දිනැති ලිපි මගින් දන්වා එවා ඇත.

මේ වන විට අනුමැතිය ලැබී ඇති සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය සංස්ථාවේ පුස්තකාලයටත් සියළුම වෘත්තීය සමිති සඳහාත් පිටපත් ලබා දී ඇත. ඉදිරියේදී සංස්ථා වෙබ් අඩවියේ පළ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

2013 වසරට පෙර අනුමත කර ගත් තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන අතර 2013 න් පසු අනුමත කර ගත් තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරනු ලබන්නේ නව ආදර්ශය අනුවය. ඉහත සඳහන් කළ පරිදි ආයතනයේ සියළු තනතුරු සඳහා නව ආදර්ශය අනුව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. එහෙත් ආයතනයේ පවතින සේවක අවශ්‍යතාවය අනුව බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් සිටිය නොහැකි නිසා කළමණාකාරිත්වය දැනුවත් කර පවතින බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීම් මේ දක්වා සිදු කර ඇත. එසේ පවතින වෙනස්කම් ඉවත් කර එක් කාණ්ඩයක් යටතට ගැනෙන තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සමාන කර මෙහිදී සිදු වන අසාධාරණයන් ඉවත් කිරීමට පාලනාධිකාරිය මේ වන විටත් කටයුතු කර ඇති බවට දන්වා සිටිමි.

මින් පෙර පහත දිනැති හා ඔබගේ යොමු අංක යටතේ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් පිලිතුරු සපයා ඇත.

දිනය	යොමු අංකය	පිළිතුරු ලබා දුන් දිනය
2024.04.03	MSU/C/SPMC/2023/info/95	2024.04.29
2024.05.29	MSU/C/SPMC/BC/2023/AQ - 39	2024.07.08

2024 විගණකාධිපති වාර්ථාව සම්බන්ධයෙන් සභාපතිවරයාගේ අදහස

ළ

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන	2018.10.04 2019.02.24 2019.09.08 2021.12.12	01 05 03 07	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය.
	2020.09.20	12	2021.12.01 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට පැමිණියේ නැත.
	2024.12.01	08	සුදුසුකම් සහිත අයදුම්පත් නොවීය

ව. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරේ කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයට අනුව බාහිර ආයතනයකට භාර දීම සඳහා ප්‍රසම්පාදනය කටයුතු සිදු කරමින් පවතියි.

ශ. අභ්‍යන්තර අයදුම්කරුවෙකු ලෙස මෙම තනතුර සඳහා තේරීපත් වූ අයදුම්කරු බඳවා ගැනීමේ පරිපාටිය අනුව අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ සුදුසුකම් යටතේ තේරී පත් වන ලදි.

එම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලෙස පහත නිලධාරීන් නියෝජනය කරන ලදි.

- මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර මහතා - සභාපති - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
- තාරකා හෙට්ටිආරච්චි මහත්මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යංශය
- අසන්ති අතුරලිය මහත්මිය - සාමාන්‍යාධිකාරිණී - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
- සී ඩී එම් ආරච්චි මහත්මිය - වැ.බ.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - මානව සම්පත් හා පරිපාලන - රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
- එම් විතුෂන් මහත්මිය - කළමනාකාරිණී - තත්ත්ව පාලන රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

එහිදී බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමවේදය පහත සඳහන් කර ඇත.

අදාළ අමතර පළපුරුද්ද - ලකුණු 25
අදාළ අමතර අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 25
4වෙනත් කුසලතා - ලකුණු 25
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව - ලකුණු 25

එහිදී එම ලකුණු ලබා දෙන ආකාරය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි තීරණය කරනු ඇත. සෞඛ්‍ය හා ජනමාධය අමාත්‍යංශය නියෝජනය කරන නියෝජිතයාගේ අදහස් අනුව අනෙක් සියළුම සාමාජිකයන්ගේ එකගතාවයෙන් ලකුණු ලබා දීම තීරණය කරනු ලැබේ.

එකතු කළ අගය ප්‍රකාශය

	2024	2023
	රු.000	රු.000
අගය නිර්මාණය		
ආදායම	28,202,082	29,331,719
වෙනත් ආදායම්	644,767	636,645
	28,846,849	29,968,364
වෙනත් මූලාශ්‍රවලින් මිලදී ගත් භාණ්ඩ හා සේවා	(24,712,816)	(26,853,048)
උත්පාදනය කළ අගය	**4,134,033**	**3,115,316**

	2024	%	2023	%
එකතු කළ අගයේ බෙදාහැරීම		%		%
සේවකයින් වෙත				
- වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ	752,305	18.20	672,968	21.60
ප්‍රාග්ධනය සම්පාදකයන් වෙත				
- භාණ්ඩාගාර බද්ද	300,000	7.26	300,000	9.63
රජයට				
- බදු සහ නියාමන ගාස්තු	964,419	23.33	838,617	26.92
ණය හිමියන්ට				
- පොලී සහ ආශ්‍රිත ගාස්තු	752	0.02	615	0.02
ව්‍යාපාර ව්‍යාප්තියට සහ වර්ධනයට				
- ක්ෂය	288,078	6.97	258,320	8.29
- රඳවාගත් ආදායම	1,828,479	44.23	1,044,796	33.54
	4,134,033	**100**	**3,115,316**	**100**





ප්‍රස්ථාරාත්මක සමාලෝචනය









නිෂ්පාදනයේ ප්‍රධාන දායකත්වයන් (මිලියන) -2024





පසුගිය වර්ෂ 10 තුළ වැදගත් මූල්‍ය විස්තර

(රු.000)

	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
පිරිවැටුම	2,054,363	2,434,508	3,174,612	4,621,537	5,646,878	7,647,780	8,538,944	16,620,185	29,331,718	**28,202,081**
අලෙවි පිරිවැය	1,539,441	1,888,256	2,666,683	3,990,801	4,743,125	6,280,757	7,102,322	14,508,387	26,381,969	**25,219,748**
දළ ලාභය	514,921	546,252	507,928	630,736	903,752	1,367,023	1,436,621	2,111,797	2,949,749	**2,982,333**
මෙහෙයුම් ලාභය	364,845	353,776	244,987	308,741	564,411	1,067,020	1,078,814	2,061,371	1,608,247	**2,501,841**
පරිපාලන වියදම	125,469	165,788	204,579	242,218	237,694	247,137	244,271	327,115	396,275	**418,617**
පොළී ආදායම	53,586	87,629	77,401	51,659	28,093	94,487	156,792	330,531	622,548	**606,178**
බදු පෙර ශුද්ධ ලාභය	414,501	441,164	321,982	359,680	592,057	1,160,997	1,235,327	2,391,594	2,173,308	**3,083,004**
බදු පසු ශුද්ධ ලාභය	262,323	296,646	223,907	251,262	434,777	1,017,364	1,006,185	1,674,345	1,518,555	**2,156,030**
ස්ථාවර වත්කම්	762,560	798,657	802,775	3,133,903	3,203,159	3,117,911	2,974,013	3,656,401	4,002,112	**3,899,215**
කෙටි කාලීන ආයෝජන	1,027,388	1,175,754	926,461	369,761	474,984	3,040,316	3,452,508	4,241,086	5,974,554	**8,193,471**
මුලු වත්කම්	2,700,885	2,902,284	3,073,637	6,229,453	7,185,386	7,829,711	8,680,301	14,700,782	16,517,179	**18,872,311**
සේවක සංඛ්‍යාව	229	248	274	276	276	291	329	336	345	**342**

මුලු වත්කම් = මුළු ජංගම නොවන වත්කම්වල ශුද්ධ ගිණුම්ගත වටිනාකම + මුළු ජංගම වත්කම්

ආයතනික තොරතුරු

ආයතනයේ නාමය
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

නෛතික තත්ත්වය
1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1987 වසරේ දී පිහිටුවන ලදී.

සංස්ථාපිත කළ දිනය
1987 ජූනි මස 04

ලියාපදිංචි කාර්යාලය
අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව

අධ්‍යක්ෂ මණ්ඩලය
මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර - සභාපති (2024 සැප්තැම්බර් සිට)
ආර් ඒ එස් කේ රණසිංහ මහතා - අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් සිට)
ජේ ඩී කේ ජී කොටුවේගෙදර මහතා - අධ්‍යක්ෂ (2025 ජනවාරි සිට)
වෛද්‍ය එන් ආර් කේ විදානගේ මහතා - අධ්‍යක්ෂ (2025 ජනවාරි සිට)
ඩී ඩී වන්නිආරච්චි මහතා - අධ්‍යක්ෂ (2025 ජනවාරි සිට)
ඒ ඒ එම් අමරසිංහ මහතා - අධ්‍යක්ෂ (2025 ජනවාරි සිට)
ආර් එම් යූ චන්ද්‍රනාත් මහතා - අධ්‍යක්ෂ (2025 ජනවාරි සිට)
වෛද්‍ය පී.පී.ජී.පී.යූ. ඉන්ද්‍රවංශ - සභාපති (2024 සැප්තැම්බර් දක්වා)
වෛද්‍ය එන්.එන්.ඒ.පී. බී සී විජේසිරිවර්ධන - අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
ඒ.ආර්. වික්‍රමසිංහ මහත්මිය - අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
වී.ජී. චමින්ද වික්‍රමරත්න මහතා - අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)
යූ.එස්.කේ. දෙනාවත්ත මහත්මිය - අධ්‍යක්ෂ (2024 දෙසැම්බර් දක්වා)

විගණකවරු
විගණකාධිපති, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

බැංකු
ලංකා බැංකුව / මහජන බැංකුව/ ජාතික ඉතිරි කිරීමේ බැංකුව

කළමනාකරණ කමිටුව
මහාචාර්ය ජයන්ත විජයබණ්ඩාර -සභාපති
ඒ.ජී.ඩී.එස්. අතුරලිය - සාමාන්‍යාධිකාරිණී
එස්.පී. ජයවීර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන)
පී.ඩී. ජයසුන්දර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
ආර්. ධර්මදාස - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් සහ ප්‍රසම්පාදන)
ආර්.එම්.ආර්.එම්. රණසිංහ - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන)
ඒ.එම්.ටී.පී. කුලසේකර - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (අලෙවි ප්‍රවර්ධන)
සී.ඩී. මගිනආරච්චි - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (මානව සම්පත්)
ජේ.එම්.එස්. ජයසුන්දර- වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
ඒ.සී.පී. ආනන්දකුමාර - කළමනාකාරිණී (සැලසුම් සහ ප්‍රසම්පාදන)
වී.ජේ. බණ්ඩාරවත්ත - අභ්‍යන්තර විගණක
පී. දන්තනාරායන - කළමනාකාරිණී (නිෂ්පාදන)
බී.වී.එච්.පී.එස්. කුමාර - කළමනාකරු (ඉංජිනේරු)
එස්. වික්‍රමසිංහ - කළමනාකරු (නිෂ්පාදන)
වයි.එම්.පී. කුමාර - කළමනාකරු (සැලසුම් සහ ප්‍රසම්පාදන)
එම්. බෙනරගම - කළමනාකරු (ඉංජිනේරු)
ඒ.ටී.එම්. ජයසේකර - කළමනාකරු (නිෂ්පාදන)
එම්. විතූෂන් - කළමනාකාරිණී (තත්ත්ව පාලනය)
ආර්.ඕ.එන්. දිසානායක - කළමනාකරු (ඉංජිනේරු)

ලියාපදිංචි කාර්යාලය
11, සර් ජෝන් කොතලාවල මාවත
කඳවල වත්ත
රත්මලාන
දුරකථන : 2635353 , 2637574 , 2636966 , 2636967 (ADSL)
ෆැක්ස් : 2634771 , 2626621 , 2623553
විද්‍යුත් තැපැල : chairman@spmc.gov.lk
වෙබ් අඩවිය : www.spmc.gov.lk

සභාපති
දුරකථන : 2623238 (සෘජු)
2635353 , 2714771 (පොදු)

සාමාන්‍යාධිකාරිණී
දුරකථන : 2637523 (සෘජු)
2635353 , 2637574 (පොදු)

නිෂ්පාදන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නිෂ්පාදන
දුරකථන : 2623521 (සෘජු)

සැලසුම් සහ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සැලසුම් සහ ප්‍රසම්පාදන
දුරකථන : 2623298 (සෘජු)
කළමනාකාරිණී - සැලසුම් සහ ප්‍රසම්පාදන
දුරකථන : 2637124 (සෘජු)

අලෙවිකරණ දෙපාර්තමේන්තුව
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි
දුරකථන : 2605862 (සෘජු)

තත්ත්ව පාලන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ත්ව පාලනය
දුරකථන : 5012945 (සෘජු)

වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, කිරීම, පර්යේෂණ සහ සංවර්ධන
දුරකථන : 5012950 (සෘජු)

මූල්‍ය දෙපාර්තමේන්තුව
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය
දුරකථන : 2623276 (සෘජු)

නඩත්තු දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු
දුරකථන : 2623246 (සෘජු)
කළමනාකරු - ඉංජිනේරු
දුරකථන : 2623239 (සෘජු)

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණක
දුරකථන : 2626619 (සෘජු)

මානව සම්පත් දෙපාර්තමේන්තුව
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්
දුරකථන : 2636234 (සෘජු)

பதிவுசெய்யப்பட்ட அலுவலகம்
11, சேர் ஜோன் கொத்தலாவல மாவத்தை
;கண்டாவளை தோட்டம்,
இரத்மலானை.
தொலைபேசி : 2635353 இ 2637574 இ 2636966 இ 2636967 (ADSL)
ஃபேக்ஸ் : 2634771 இ 2626621 இ 2623553
மின்னஞ்சல் : chairman@spmc.gov.lk
வலை : www.spmc.gov.lk

தலைவர்
தொலைபேசி : 2623238 (நேரடி)
2635353 இ 2714771 (பொது)

பொது முகாமையாளர்
தொலைபேசி : 2637523 (நேரடி)
2635353 இ 2637574 (பொது)

உற்பத்தி திணைக்களம்
பிரதி பொது முகாமையாளர் (பி.பொ.மு)-உற்பத்தி
தொலைபேசி : 2623521 (நேரடி)

திட்டமிடல் மற்றும் கொள்முதல் திணைக்களம்
பி.பொ.மு-திட்டமிடல் மற்றும் கொள்முதல்
தொலைபேசி : 2623298 (நேரடி)
முகாமையாளர்-திட்டமிடல் மற்றும் கொள்முதல்
தொலைபேசி : 2637124(நேரடி)

சந்தைப்படுத்தல் திணைக்களம்
பி.பொ.மு.(பதிற்கடமை)-சந்தைப்படுத்தல்
தொலைபேசி : 2605862 (நேரடி)

தரக்கட்டுப்பாட்டு திணைக்களம்
பி.பொ.மு.-தரக்கட்டுப்பாடு
தொலைபேசி : 5012945 (நேரடி)

போர்முலா, ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி திணைக்களம்
பி.பொ.மு-போர்முலா, ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி திணைக்களம்
தொலைபேசி : 5012950 (நேரடி)

நிதித் திணைக்களம்
பி.பொ.மு.(பதிற்கடமை)-நிதி
தொலைபேசி : 2623276 (நேரடி)

பராமரித்தல் திணைக்களம்
பி.பொ.மு-பொறியியல்
தொலைபேசி : 2623246 (நேரடி)
முகாமையாளர்-பொறியியல்
தொலைபேசி : 2623239 (நேரடி)

உள்ளக கணக்காய்வு திணைக்களம்
உள்ளக கணக்காய்வாளர்
தொலைபேசி : 2626619 (நேரடி)

மனித வள திணைக்களம்
பி.பொ.மு.(பதிற்கடமை)-மனித வளம்
தொலைபேசி : 2636234 (நேரடி)

Registered Office
11, Sir John Kotelawala Mawatha
Kandawala Estate
Rathmalana
Tel : 2635353 , 2637574 , 2636966 , 2636967 (ADSL)
Fax : 2634771 , 2626621 , 2623553
email : chairman@spmc.gov.lk
Web : www.spmc.gov.lk

Chairman
Tel : 2623238 (Direct)
2635353 , 2714771 (General)

General Manager
Tel : 2637523 (Direct)
2635353 , 2637574 (General)

Production Dept.
DGM Production
Tel : 2623521 (Direct)

Planning & Procurement Dept.
DGM Planning & Procurement
Tel : 2623298 (Direct)
Manager Planning & Procurement
Tel : 2637124 (Direct)

Marketing Dept.
Acting DGM Marketing
Tel : 2605862 (Direct)

Quality Control Dept.
DGM Quality Control
Tel : 5012945 (Direct)

Formulation, Research & Development Dept.
DGM Formulation, Research & Development
Tel : 5012950 (Direct)

Finance Dept.
Acting DGM Finance
Tel : 2623276 (Direct)

Maintenance Dept.
DGM Engineering
Tel : 2623246 (Direct)
Manager Engineering
Tel : 2623239 (Direct)

Internal Audit Dept.
Internal Auditor
Tel : 2626619 (Direct)

Human Resource Dept.
Acting DGM Human Resource
Tel : 2636234 (Direct)

High quality

PHARMACEUTICALS

Leading medicines to keep you well

NBEA 2024
GOLD & SILVER

IDB AWARDS 2023
GOLD

CNCI ACHEIWERS AWARDS 2024
GOLD

SPMC

State Pharmaceuticals Manufacturing Corporation – Sri Lanka
11, Sir John Kotelawala Mw, Kandawala Estate, Ratmalana
Tel: +94 11 2637574 / 11 2635353 / 11 2636967
Fax: +94 2634771 / 2637004
Email: chairman@spmc.gov.lk
Web: www.spmc.gov.lk